
පතිවත ඉහ කබා පුරැකී මුත් අනේක නින්දා අපහාස විඳි
පතිනියකගේ සත්‍ය කතාව...
ගිනිදැලු සේ මා
Ginidalu se ma
තරංගා දිසානායක
THARANGA
DISSANAYAKE
තාරා පොතක්

# ගිනිදැල් සේ මා

**තරංගා දිසානායක**

ප්‍රකාශනය හා බෙදා හැරීම
**තාරා ප්‍රකාශන**
250/ඒ/6,
පිංකොටවත්ත, පොල්ගහහේන, රාගම.
දුරකතන : 071-4244873 / 071-1705595
tharaprakashana@gmail.com

ගිනිදළු සේ මා

ප්‍රථම මුද්‍රණය : 2017

© තරංගා දිසානායක

ISBN : 978-955-7829-23-4

පිටකවරය : තාරා ප්‍රකාශන

පරිඝනක අක්ෂර සංයෝජනය සහ
පිටු සැකසුම : HiruLinu Creations - 033-2262153

මුද්‍රණය : තාරා ප්‍රින්ටින් හවුස්
3/3, බොල්ලත, ගනේමුල්ල.

ප්‍රකාශනය සහ බෙදාහැරීම : තාරා ප්‍රකාශන
250/A/6, පොල්ගහහේන,
රාගම.

## කතුවරියගේ වෙනත් කෘති

- ★ සත්‍යා
- ★ පාරමිතා - 1
- ★ පාරමිතා - 2
- ★ ඇයි මම ඔබ ළඟ නතර වුණේ
- ★ සඳ කඳුළක්
- ★ දේවස්මිකා (වයඹ රාජ්‍ය සාහිත්‍ය සම්මාන)
- ★ දේවස්මිකා - 2
- ★ දේවස්මිකා - 3
- ★ පහන් තාරකා
- ★ තාරා
- ★ ඇතුගල තවමත් නිහඬයි
- ★ රණ තිසරාණෙනි
- ★ සදෙව් සිහිනය
- ★ සත් මහ සයුර
- ★ වසන්ත වරුසා
- ★ ඇඳුරුතුමියයි ප්‍රේමයේ ඔබ
- ★ පරසතු සුවඳක්
- ★ සසර චාරිකා
- ★ සත් පියුම් පැතුම්
- ★ ආශා විල්තෙර
- ★ ආකාශා
- ★ ඉරබටු තරුවේ
- ★ ඉරබටු තරුවේ 2
- ★ සංසාර යාත්‍රා
- ★ සුභාශිංෂන
- ★ සදාතනික ඉරණම්කාරිය මම
- ★ මුතු පබළු
- ★ නිල්කැට වැස්ස
- ★ මේඝා
- ★ මේඝා 2

**පරිවර්තන**

- ★ සෙනෙහස ඔබ නම්
- ★ මධු ගීතය
- ★ ප්‍රථම ප්‍රේමය ආයෙත්
- ★ ආදරයට නවාතැනක්
- ★ ප්‍රේමය සොඳුරු දහමක්

- ★ කඳුළු කුණාටුව
- ★ දේදුන්නක දුක රැඳුනා
- ★ දුක දරුවා නම් ඈ යසෝධරා
- ★ රිදී පහන් නිම්නය
- ★ පහන් අඳුර ළඟ
- ★ එළිය කළු නොවේ නම්
- ★ නිල් කටරොලු
- ★ නිල් කටරොලු 2
- ★ නිල් කටරොලු 3
- ★ ගංගාව ගාව පාළුයි
- ★ ගංගාව ගාව පාළුයි 2
- ★ ප්‍රේම ගංතෙර
- ★ ගිම්හාන කුසුම්
- ★ සුපෙම් සුසුම්
- ★ ප්‍රාර්ථනා සිහිනේ
- ★ දූවිලි පවුර
- ★ ප්‍රේමයේ යාදිනී
- ★ උත්තරා
- ★ හදපාරන මාරුතයේ
- ★ මාලගිරා තටු
- ★ අසනි වැසි දිය
- ★ සෙනෙහේ ගඟුල්
- ★ සුපෙම්වත ඔබ මගේ
- ★ දෙවියන් දුන් පඬුරක්
- ★ නීල නෙතු විල
- ★ දහස්පෙති දම්
- ★ අකල්පොහොට්ටු
- ★ දම්පාට සමනල්ලු
- ★ මහමේරු
- ★ ලෝචන දහරා

**යොවුන් නවකතා**

- ★ අම්මේ මං ආදරෙයි
- ★ දඟ නැලු මගෙ යාලු
- ★ හිරු නැති දවසක්

**මනෝ විද්‍යා**

- ★ බිරිඳකගේ ජීවිතය

කෙතරම් දොඩමලු වුවද ගැහැනියක විසින් කාටවත් නොකියන රහස් ගබඩාවක් ඇගේ හදවතේ නිදන්ව ඇත. ඇගේ සංසාර සහකාරයාට වුවද ඒ ගබඩාව ලෙහෙසියෙන් බිඳ හෙලිය නොහැකිය.

සෑම ගැහැනියකටම රහසේ හඬන්නට හේතු වූ කාරණාවක් තිබේ. ඇය රහසින් හඬන්නේ එම හේතුව තේරුම්ගෙන ඇගේ කඳුල පිසදමන්නට හැකි ඇයව තේරුම් ගත හැකි කිසිවෙකු මෙලොව නැති බැවිනි.

(සත්‍ය කතාවක් ඇසුරින් නිර්මාණය වුවත් මෙහි ඇති සමහර සිදුවීම් හා චරිත කතුවරියගේ මනඃකල්පිතයන් බවත් ජීවත්වන්නවුන් සමඟ සම්බන්ධතාවයක් නොමැති බවත් කරුණාවෙන් සළකන්න.)

## ඔබට දයාවෙන් ලියමි.....

මෙම කතාව ගැන ඔබ කුමක් කීවද එය මට වැදගත් වන්නේ මෙය මගේ නිර්මාණාත්මක මනස යොදාගෙන කළ වියමනක් නොවන නිසාය. කතාව බොහෝවිට වෙනස් කර ඇත්තේ ජීවමාන කිසිවෙකුට අගෞරවයක් නොවන ලෙසටය.

එනමුදු ලිවීම ආත්ම තෘප්තිය ගෙන දෙන කාර්යයක් වුවද මෙම කතාව ලිවීමෙන් මා ලද්දේ වෙහෙසක්ය. එය ලිවීමෙන් මට එපමණ වෙහෙසක් දැණුනා නම් මෙම කතාවේ ජීවමාන වූ ප්‍රධාන චරිතයට මොන තරම් පීඩාවක් ඇද්දැයි මට සිතාගත හැකිය.

'ගිනිදළු සේමා' ලියන්නට කිසිම විටෙක මා ආසාවෙන් හිඳ ගත්තේ නැත. මන්ද කතාව තුළ චරිත ජීවමාන කරද්දී එම හැඟීම් දැනීම් මගේ පපුවටම දැනෙන නිසාවෙනි. එවිට ඒ සියලු අත්දැකීම්වලට මම මනසින් මුහුණ දෙමි. පීඩාවන් විඳගනිමි. ඒ මගේ ලෝකය සැණෙකින් කැලි කැලිවලට බිඳ දමන මගේ දරුවන් තොරතෝංචියක් නැතිව කෑ ගසන කුරුළු පැටවුන් මෙනි. ඒ ලෝකයත් මේ ලෝකයත් අතර එහාට මෙහාට ඔර්ලෝසු බට්ටෙකු සේ දෝලනය වෙමින් මේ කාර්යයේ නිරත වීම පහසු දෙයක්වත් රසවත් දෙයක්වත් නොවන බව කිව යුතුය.

එහෙත් කතාව ඔබට නීරස නොවන්නට ඉදිරිපත් කිරීම මගේ යුතුකමකි. නොවේනම් ඔබ ගෙවන මුදලට මම ණයකාරියක වෙමි.

තව දෙයක් කිව යුතු වන්නේ අප හැමෝ තුළම නවකාවකට සරිලන අත්දැකීම් තිබුණද ඒ අත්දැකීම් සියල්ල එකතුවන තැන නවකතාවක් නිර්මාණය වන්නේ ද නැත. එයට ලේඛකයාගේ හැකියාව, සහජ දක්ෂතාවය තිබිය යුතුය. ඒ අතින් මා කෙතරම් දුරට සාර්ථකදැයි දයාබර ඔබ විසින්ම තීරණය කළ යුතුය.

ජීවිතය වූ කලී බොහෝ හැල හැප්පීම් මැදින් රිද්මයකට ගලා යන්නා වූ නදියකි. එහි අරමුණ, ගමනාන්තය වන්නේ සයුරය. එහෙත් ගමනාන්තයක්, ඉලක්කයක් නොමැතිව තව කෙනෙකුගේ පදයකට නටමින් ඉබා ගාතේ ගලා යන ජීවිත කෙතරම්ද? නමුත් සමාජය තවමත් ගැහැණියට වටිනාකමක් දෙන්නේ නැත ගින්දරෙන් පිච්චෙමින් බත සරි කිරීමට ගේ දොර පිරිසිදු කිරීම, රෙදි කඩු සේදීම ඇරෙන්නට ඇයට වෙන වගකීමක් නැති බව සිතන්නේද ඔවුන්මය. නමුත් ලෝකයට ජීවිය තනන්නී ඇයයි. තාත්තා, අයියා, මල්ලි, මාමණ්ඩි, නැන්දම්මා මේ එකී මෙකී සියල්ලන්ම එකතුව ඇයත් ජීවයක් බව සැලකිය යුතුය.

අද බොහෝ විට පවුල් අවුල් වී ඇති එක කාරණයක් මට පැහැදිලිය. ගැහැණිය ලිංගික භාණ්ඩයක් බවට පත්ව ඇත. ආදරය, කරුණාව දයාව බිඳක්වත් නොදී, කොටින්ම කිසිවක් නොදී තම සිතැගි ඉටුකරගැනීම ද වෙර දරන පවුල් ඒකකය තුළ ඇය අසරණව ඇත. ඉන් පසුව ඒ දෙය සොයාගෙන අද පඳුරක් පඳුරක් ගණනේ ඇති සම්භාහන මධ්‍යස්ථාන මුවාවෙන් ජයටම පවත්වාගෙන යන ගණිකා මඩම්වලට හොඳ ඉල්ලුමක් පවතී.

මා මෙය දිගින් දිගටම ලියනුයේ මට හොඳ විවේකයක් අනුවුණ නිසා නොවේ. මෙය කියවන දස දහසක් දෙනෙකුගෙන් ස්වල්ප දෙනෙකු හෝ මෙය හිතට ගන්නවා නම් යන අදහසිනි. ලේඛකයාගේ යුතුකම සමාජයට උපදෙස් දීම, පණිවිඩ දීම, ප්‍රචාරණය නොවුණත් සමාජයහපත, සුභසිද්ධිය දැකීමට අප කවුරුත් කැමතිය. ඒ නිසා මේ පණ්ඩිතකමක් ලියනවා නොව, මෙම කතාවටත් අදල බැවින් සුදුසු යයි සිතා සඳහන් කළෙමි.

ඉදින්... මා මේ ගිනිදැල්ලේ දැවුණා සේම... ඔබත් දැවෙන්න. ඒ වේදනාව අත්විඳින්න. සත්‍යයත්, මගේ නිර්මාණාත්මක මනසත් යොදවා මේ කල සුන්දර අරගලයේ වෙහෙස මඳකට නිවා ගන්නේ ඔබේ ආනන්දනීය අදහස්වලිනි.

- තරංගා දිසානායක -



# පළමු ගිනිදැල්ල

සමහර දිනවල මා බොහෝ වෙහෙසට හා පීඩාවට පත්ව සිටින නිසා නින්ද හරියාකාරව ලැබෙන්නේද නැත. රාත්‍රියේදී බිව් බෙහෙත් නිසා මට පාන්දර යාමයේ වැඩිපුර නින්ද ගොස් තිබුණි. මා අවදි වූයේ නිවසේ සීනුව නාදවන හඬිනි.

"දෙයියනේ, නවයයි වේලාව.... එච්චරට මට නින්ද ගියේ කොහොමද?"

වහාම නිදි ඇඳුමට උඩින් කබාය දමා ගත් මා ඉදිරියට යන විටත්..... පත්කි යාමට සැරසුණ අසනි ගේට්ටුව හැර... තිබුණි.

"කවුද?"

මා ඇසුවේ කලබල වූ දැසින් යලිත් ගෙට ගොඩ වූ දියණියගෙනි. ඇය කිසිත් කීවේ නැත. මේ ලෝකයේ කිසිම මවකට නොදිය යුතු ගින්නක් මගේ දියණිය අසනී විසිනුත්, කිසිම බිරිඳකට ඉසිලිය නොහැකි ආකාරයේ ගින්නක් මගේ සැමියා කංචන විසිනුත් මට දෙමින් තිබුනි. ගේට්ටුව අසල දෙදෙනෙකු සිටියහ.

"මිසිස්... උදානි ආශ්චර්යා තැන්නෙකුඹුර..." ඒ ආ එක් අයෙක් මා විමසීය.

"ඔව්... මම"

"මිස්, මේක භාරගන්න."

ඒ කුමක්ද? දෙවියනි ඒ සිතාසියකි... උසාවි නියෝගයකි.... මුළු ලෝකයම මා වටා භ්‍රමණය වෙන බවක් මට දැණුනි...

කොරිඩෝවේ කණුව අල්ලාගත් මම මොහොතකින් ගැඹුරු හුස්මක් ගතිමි......

මම එය භාර ගතිමි. ආවේ කුමක්දැයි තේරුම් ගත්තාක් මෙන් දියණිය කිසිවක් ඇසුවේ නැත. ඇය නිල්පාට ඉරිසහිත වී ෂර්ට් එකක් හා කෙටි ඩෙනිම් සායක් ඇඳගෙන ඇගේ කිට් බෑගය කරේ ලාගෙන උන්නේ නිවසින් පිටත් වීමටය.

"කොහෙද යන්නෙ...." යයි විමසීමට මට අයිතියක් නැත. සත්‍යය වන්නේ දහසක් දුක් කම්කටොලු මධ්‍යයේ දසමසක් කුස දරා ඇය මේ ලෝකයට බිහි කල ඇගේ අම්මා මා වීමය.

අසනී ගේට්ටුවෙන් පිටව ගියේ තරමක කලබලගතියකින් යයි මට සිතුණි. මා ගෙට ආවේත් ඒ තරමම වූ කලබල ගතියකිනි. සාලයේ වූ වේවැල් කවිච්චියේ වාඩි වූ මා ලිපිය දිග හැරියෙමි. ඒ උසාවියෙන් එවන ලද සිතාසියකි.

ද්වේශසහගත හැරයාම හා අනාචාරය හේතුවෙන් තවදුරටත් වෛවාහක ජීවිතය ගෙනයාමට අපහසු බව සඳහන් කරමින් මගේ සැමියා කංචන තැන්නේකුඹුර විසින් මට විරුද්ධව දිස්ත්‍රික් උසාවියේ දික්කසාද නඩුවක් පවරා තිබුණි.

අමාරුවෙන් ගොඩ නගා ගන්නට වෙර දැරූ පවුල් ජීවිතය දෙපා මුලටම ඇද වැටී සුණුවිසිණු වී ගොස් තිබුණි.

බිරිඳකට... ඒ කෑලි එකතු කරමින් යලිත් ඒ කැඩුණ ජීවිතය පෙර සේ සකසා ගත හැකිද?

මම ජීවිතයේ දුෂ්කර ක්‍රියා කළෙමි. මගේ සැමියා, මගේ දරුවා මගේ ඇස් දෙකට පෙනි පෙනි මට අහිමිව යද්දි ඒ ජීවිතය රැක ගන්නට ගිනි මත ඉස තබාගෙන මම දුෂ්කර ක්‍රියාකළෙමි.



# 1

කංචන මට හමු වූ අතීතයටත් පෙර ඉතාම ලස්සන අතීතයක් සමඟ වූ ළමා කාලයක් මට තිබුණි. ඒ අතීතයේම ජීවත්වෙන්නට වාසනාව තිබුණා නම් යයි නොයෙක් වර මට සිතුණි. නමින්ම උදානී ආශ්වර්යා වූ මම හුරුබුහුටි සීදේවි දූරියක වීමි.

රාජගිරියේ අපේ මහගෙදර පිහිටා තිබුණි. තාත්තා ගැන මගේ මතකයක් නැත්තේ ඔහු මා කුඩා කලම මිය ගිය බැවිනි. අම්මාත්, ලොකුඅම්මාත්, ලොකු අම්මාගේ දරු පවුලත් අප සැවොම ජීවත් වූයේ මේ ගෙදරය. දුක යනු කුමක්ද කියන්නවත් නොදැන සිටි මට... හැමදේම අතට පයට ලැබිණි.

"නාම තේ එකක්වත් හදාගන්න බෑ... දීගෙක ගියාම රගේ තේරෙයි."

අම්මා කීවාය. ගමේ කොල්ලන් රැලට එකතු වී ක්‍රිකට් ගසන්නට, සෙල්ලම් කරන්නට පුරුදු වී සිටි මට කෙල්ලන්ට වඩා යහළුවන් වූයේ කොල්ලන්ය.

"උදා...... හරි බඩගිනියි......"

සෙල්ලම් කර හති වැටුණ පසු උපුල් කියයි.

"තාම දවල්ට කෑව විතරයි... ආපහු ගෙදර ගියොත් ආයේ එන්න හම්බෙන්නෙ නෑ... ලොකු අම්මා කියයි..... ගන්නවා පොත.... ගමටම ඇහෙන්න කියවනවා පාඩම කියලා...."

මම උපුල්ට අනතුරු හැඟවීමි. කුමන වේලාවක බඩගිනි වුවද නිවසේ කෑම නම් හිඟ නොවීය. මහ ගෙදර කුස්සියේ විමිනියෙන් දුම් රොටු පිට නොවූ වේලාවක් නැත. ලිප මත ගොජ නඟමින් නටන වතුර මුට්ටියක් ඕනෙම වේලාවක වෙයි. දුම් මැස්සේ ලොකු කරෝල කූරියෙකු අතුරුදහන් වූයේ නම් ඒ කලාතුරකිනි.

"ඉස්පිරිතාලෙට එන කවුරු හරි ගොඩ වෙලා යන්ඩ බැරි නෑ....."

හැමදාම දහවලට බත් උයද්දී ලොකු අම්මා වැඩිපුර හාල් හුන්දුවක් දෙකක් නැඹිලියට දමා ගන්නේ එසේ කියමිනි. එසේම නෑදෑයෙක්, හිතවතෙක් අපේ ගෙදරට ගොඩ නොවුණ දවසක් වූයේ නම් ඒ කලාතුරකිනි.

උපුල් පමණක් නොව මුළු ගමම මගේ යහළුවන් විය. කොල්ලන් සමඟ පමණක් නොව කෙල්ලන් සමඟද කරට කර සෙල්ලම් කරමින් මගේ ළමා විය ගෙවුණි.

"දූන්මම තේ බොන්න ගෙදර යන්න බෑ... රත්ති නම් ඉන්නවා පිටිපස්සෙ....."

"අනේ උදා... ඔයාට පුළුවන් වුණාට මට බෑ"

උපුල් අදිමදි කරයි. රත්තීගේ කිරි බුරුල්ලට කට තබා කිරි උරාබීම මට නම් අමුතු දෙයක් නොවීය. කෙසේ හෝ මම උපුල්ගේ බිය නැති කරමින් ඔහුට කිරි බොන්නට පුරුදු කළෙමි.





"ඉක්මනට එනවා..... පන්සල අතුගාන්න යන්නෙ නැද්ද අද....."

මම උපුල් දමා දුවයමි. ඉරෝමි, උපේඛා ආදි යෙහෙළියන්ද හවසට පන්සලට දුවති. රටාවකට පන්සලේ විසල් මිදුල ඇමදීම අප කළේ පින් තකා හෝ හාමුදුරුවන්ගෙන් හොඳ නම අසන්නට නොවේ. පන්සල මිදුල අතු ගා ඉවර වුණ විට අප සියල්ලන්ටම අඬගසා ලොකු හාමුදුරුවෝ අපගේ හිස අතගා... නාරං පෙත්තක් ලොසින්ජරයක් වැනි දෙයක් දෙයි. අපගේ අරමුණද එය වෙයි. දහම් පාසලේ. ඉතාම හොඳ ළමයි වූ අප දඟ වැඩ නොකළාම නොවේ. නමුත් ඉතාම විනයවත් පරිසරයක, විනයගරුක ලෙස... අපේ ළමා කාලය ගත විය.

ළමා කාලය පමණක් නොව එළඹෙන යොවුන් වියද අපි පන්සල ආශ්‍රිතව ගත කළෙමු.

"මේ කෙල්ල පන්සලේමයි ඉන්නෙ....."

අම්මා වරෙක දොස් නැඟුවාය. අඩුම ගණනේ තේ කෝප්පයක් සාදා ගැනීමේ හැකියාවවත් මට නොතිබුණේ හැම දේම අත ළඟට ලැබෙන නිසාය.

"හාමුදුරුවෝ හොඳමයි කියන්නෙ... මේ වයසෙ අනික් කෙල්ලෝ වාගෙ නෙමෙයිලු....."

"උදානි ගැන බය වෙන්න දෙයක් නෑ අක්කෙ.... මට බය.... මලක් පිපීගෙන එනවා වාගෙ.... කොයි වෙලේ ගෙට වෙයිද දන්නෙ නෑ....."

අම්මා අනතුරු ඇඟවූවාය. අම්මා කෙනෙකුට දියණියකගේ වගකීම කෙතරම් ද? මොනවා වුනත් වැඩිහිටියන්ගෙ වචනයකට උඩින් නොයන මා ඉතාම හොඳ විනයවත් ගුණගරුක දූරියක වුණෙමි. අපගේ සිත හික්මවාගෙන අනාගතය කරා ගමන් කිරීමට පන්සලෙන් ලැබුණ හික්මීම සුළුපටු නොවේ.

එවකට මම යසෝධරා බාලිකාවේ ශිෂ්‍යාවක වීමි. පාසල් ආවේ ගියේ බස් රියෙනි. ආනන්ද නාලන්ද වැනි පාසල්වලට යන පිරිමි ළමුන්ද නොඅඩුව එම බස්වල ගමන් ගත්හ. කෙමෙන් හිස ඔසවන යෞවනයේ පිපීගෙන එන රත්සර කැකුලකට මෙම පිරිමි ළමුන්ගේ ඇල්මෙන් බැල්මෙන් බේරී සිටින්නට නම් ලෙහෙසි වූයේ නැත.

"උදා... අර කොල්ලා... උඹ දිහා බලනවා...."

ඉරෝමි මට පෙන්වයි.

"ඔහෙ ඕන එකෙක් බලපුවාවෙ... උන්ට ඇස් තියෙන්නෙ බලන්න තමයි."

මම ජනෙල් කවුළුවෙන් ඉවත බලා ගතිමි. මා වෙත නෙත් බැලුම් හෙලුයේ එකෙකු දෙන්නෙකු නොවේ. එහෙත් විසල් පවුලක දූඩි ආදරයක් රැකවරණයත් මධ්‍යයේ හැදුණු මට පිටස්තරයෙකුගේ ආදරයක් අවශ්‍ය වූයේ නැත.

"උඹ ලස්සනයිනේ... ඒකයි උඹට ඔය හැටි කොල්ලො වහ වැටෙන්නෙ...."

යෙහෙළියන් කීහ. මම ඒ කිසි දෙයක් තඹේකට මායිම් නොකළෙමි.

"අද නම් මට බේරෙන්න බැරි වුණා කවින්ද මෙන්න මේක දෙන්න කීවා."

එක දිනයක උපේඛා පැමිණ කොපි පොතක් අස්සේ දමා ගෙන උන් ලිපියක් මා වෙත පෑවාය.

"කවින්ද අතටම දෙන්න කීවා."

"මට එපා...."

"කඩලා බලපන් මොනවද ලියලා තියෙන්නෙ කියලා....."





"මොනවා ලිව්වත් මට වැඩක් නෑ... ඔක ආපහු අයිතිකාරයාටම දීපන්"

මම ලිපිය ප්‍රතික්ෂේප කලෙමි.

"මෝඩි, කවින්ද මොන තරම් හැන්ඩ්සම් කොල්ලෙක්ද.?"

"ඉතිං උඹ යාළුවෙයන්... එහෙනම්...."

මම ගණනකට නැතිව කියමි. කවින්ද ගැන මගේ අහිතක් නැත. ඔහු ලස්සනය. කඩවසම්ය. කෙල්ලන් අතරේ ජනප්‍රිය චරිතයකි. ඔහුගේ පියා ධනවත් ව්‍යාපාරිකයෙකි.

"උඹ උපුල් එක්ක යාළුයිද? නැත්තං හැමෝටම බෑ කියන්නෙ."

උපේඛා අහික් අතට ඇසුවාය. අත දිග ඇර උපේඛාගේ කම්මුලට පහරක් ගැසීමට උවමනාව වූ නමුත් මම ඇයගේ අත කොනිත්තා තරහව පිරිමසා ගතිමි.

"ඔය උෟයි..... උඹට ඔන්නම් ගිහින් උපුල්ගෙ.... කොනිත්තපං... ඔච්චර විසේනම්"

උපේඛා මගේ අත ගසා දැමුවාය.

"මට උපුල් ඕනෙ නෑ. උපුල්ගෙයි මගෙයි තියෙන්නෙ ෆ්‍රෙන්ඩ්ෂිප් එකක් විතරයි....."

උපේඛාගේ දෑස විසල්වෙයි. ඇය ඒ තරම් මවිතයට පත්කරන්නට දෙයක් මා කිවේ නැත.

"මංදා.... හැමෝම කතාවෙනවා... ඒකයි මම කීවේ....."

"මෝඩියේ බහුතර මතය සත්‍යය නොවේ."

මම පාසලේ විවාද කණ්ඩායමේ ප්‍රබල සාමාජිකාවක වීමි. ඒනිසා නිතරම කට කියවීමේ හැකියාවද මා සතුවිය.

උපේඛාගේ ඇස් සතුටින් දිලිසුණා මට මතකය. ඒ ඇසිදුයි යන්න මා වැඩිපුර නොයන්නට නොසිතුවෙමි. ඇගේ හැටි එසේමය. කවින්ද්‍රගේ ලියුම් නොකලාම ඔහුට ආපසු යැවීම ගැන කවින්ද්‍ර තේන්තියෙන් උන්නේය.

"ඇයි.... උඹා.... කවින්ද්‍රට මං කිව්වෙ....?"

දහම් පාසලේදී උපුල් මගෙන් විමසුවේ දානශාලාවේ මා කතිවම වාර්තාව ලියමින් උන් මොහොතේය. නමේ යොවුන සමිතියේ සභාපති වූයේ උපුල්ය. ලේකම් වූයේ මාය. ඒ නිසා අපට අතන මෙතන හමුවන මිනෙම් තැනකදී කතා කිරීමට ඕන තරම් දේවල් තිබුණි.

"මං කැමති නෑ... ඒකයි..."

"කවින්ද්‍රට ඒකට ශේන්ති ගිහින්... ඔයාගෙන් පලිගන්නව කියනවලු... කොල්ලෝ ඉස්සරහදිමයි උපේඛා ලියුම දීලා තියෙන්නෙ..."

"ඉතින්... ඇයි ඒකි ඒ තරමට කවින්ද්‍රව පාච්චල් කරලා තියෙන්නෙ... මම කැමති නැති හින්දා නෑ කිව්වා මිසක් මට උවමනාවක් තිබුණෙ නෑ උපුල් කවින්ද්‍රව ඔහෙම පල් කරන්න..."

"දන්නෙ නෑ ඉතින්.... ඔය වාර්තාව ඇයි මෙතන ලියන්නෙ..."

"මේ ප්‍රශ්න හින්ද ඉවර කර ගන්න බැරි වුනා උපුල්... කව විතයි."

මම අත ඉක්මන් කළෙමි. වාර්තාව ලියන්නේ පුරුදු වීමට නොවේ. ඔය මොනවා හෝ දෙයක් ලියා සභාකොමෝ සතුටින් විසිර ගියායි ලියන පුරුද්දක් මගේ නොවීය.

මා කල්පනා කළේ උපේඛා ගැනය. ඇය කර ඇත්තේ





නොදැ වැඩක් නොවේ. ඇයට අවශ්‍ය වූයේ කවින්ද්‍ර කෙරේ මා බිඳුවන්නයද? මට තිබුණේ ලියුම් භාරගෙන කවින්ද්‍ර සතුටේ මට දන්ම ආදරයක් අවශ්‍ය නැති බව පැහැදිලිව කියා දීම නොවේද?

එහෙත් මා එය නොකළේ පුංදෙක් මිසේ තිබුණ බිය නිසාය. කවින්ද්‍ර එවූ ලියුම මා භාර ගත්තා නම් කොල්ලන් කියන්නේ කසුත් මාත් අතර දිගින් දිගටම ලියුම් හුවමාරු වන වගය. ලෝකයාගේ කටකතාවලට මා බියය. ඒ මා හැදුණු වටපිටාවයි. චරිත පරිසරයයි. මා ගැන මොනවා හෝ ආරංචියක් තියෙනොත් අම්මා කෙසේ වෙතත් ලොකු අම්මා තාව උළ තියනු ඇත.

"අපි වැදගත් විදියට හැදුණ වැදගත් පවුලක්. මම ගම් උඹලා නැමෙන්ටම කියන්නෙ එක එකා එක්ක නාටල විනෝදක් අනුභවන්න එපා"

ලොකු අම්මා ලගනඳීන් ඇගේ දියණිය වූ අනූදී අක්කාටත් කුසාරි අක්කාටත් අවවාද දුන්නාය. ඒ අවවාද මටත් එක්කය. අම්මා මට ටොක්කක් ඇන 'ඇහුණාද?' යයි ඇසුවේ එම නිසාය. එබැවින් මම සම්දතාවයත් පටන් ගැනීමට බිය වූයෙමි. ආදරයක අවශ්‍යතාවයක් තිබුණේ නැත. එසේ මිස මට කවින්ද්‍රව ගෝරිල්ලෙකු ලෙස හෝ මහා බියකරු රාක්ෂයෙකු සේ පෙනුණේත් නැත. ඊටත් ලියුම් නොබලාම ආදරයක් ප්‍රතික්ෂේප කළ පළමු අවස්ථාව මෙය වූයේත් නැත.

* * * * *

උසස් පෙළට මා තෝරා ගත්තේ කලා විෂයයන්ය. කලාව මගේ ඇගේම තිබුණ දෙයක් යයි තුග දෙනෙක් පැවසූහ. පාඩම් කිරීමක් නොතිබුණත් මම පාසල් විෂයයන්ට දක්ෂ ශිෂ්‍යාවක් වීමි.

"හා... නංගී... දැන් ඔහොම ආඩම්බරකමට ගියාට... අපි

දන්නවා...."

මා පාසල් බස් රථයට නඟින විටම පාපුවරුවේ උන් කොල්ලෙක් මට ඇණුම්පද කීවේය. මම ඔහු දෙස රවා බැලීමි.

"අපෝ බං ගිනිදළු වගේ....."

ඔහු කීවේය.

"ගිනිදල්ලෙ තරම දන්නෙ කවින්දයා බං අපිට රැවටට... කවින්දයා ඕකිගෙ පෙට්ටිය කඩල තියෙන්නෙ...."

මම දූවී ගියෙමි. පිච්චී ගියෙමි. කොල්ලෙකුගේ හාදුවකින්වත් ඉඳුල් වී නැති මට මේ කියන කුණුකතා මොනවාද?

"මොකක්ද තමුසෙ කිව්වෙ.....?"

පාපුවරුවේ පඩි දෙක තුනක් නැඟ බසයේ සීට් කොණක් අල්ලා ගත් මම බෑගය එහි රඳවා නැවතත් පා පුවරුව අභියසට පැමිණියෙමි. එවිට කොල්ලන් සියල්ල එක පොදියට සිනාසෙමින් විසිල් ගසමින් මට හූ කියන්නට වූහ. බසයේ ඉදිරිපස ඉඳගෙන උන් ළමයින් හැරි හැරී මදෙස බලන්නට වූහ. ඇත්තෙන්ම ගිනි දල්ලක් සේ මම දූවී පිච්චී ගියෙමි.

"අපි දන්නෙ නෑ... කවින්දයාගෙන් අහන්ඩ නංගී... උෟ තමයි කිව්වෙ... පෙට්ටි කතාව."

ඔහු එය කියා නිම කරන්නටත් පෙර මම අත දිග හැර ඔහුට. හොඳ කම්මුල් පහරක් ගැසුවෙමි.... කෑ ගසමින් හූ කියමින් උන් පිරිස එකවරම මීයට පිම්බාක් සේ නිහඬ විය.

"ඒයි අසංකයා...."

මගේ පහර නොසිතූ විදියට සැර වූයෙන් අසංක නම් වූ ඔහුට එය දරාගත නොහැකි විය. වහාම බෙල් එක ඇද බසය නවත්වා ගත් ඔහු පොත් බෑගයද රැගෙන බසයෙන් බැස ගියේය.





කිසිවෙක් කිසිවක්ම කතා කලේ නැත. මගේ සියොළඟ දහඩියෙන් තෙත්ව සුදු ගවුම ඇඟටම ඇලී තිබුණි.

"උදා... මොක්කද ඒ කලේ...?"

උපේඛා මා අසල විය.

"මට දරා ගන්න බැරි වුණා. ඒ කතාව...."

මම අසුනේ වාඩි වී බෑගයේ මුහුණ සඟවා ගතිමි. එදා මා පාසලේ උන්නේ මොන සිහියෙන්ද කියා මට මතක නැත. විවේක කාලයෙන් පසුව මා ගිලන් කාමරයට ගියේ 'බඩ රිදෙනවා' යයි කියමිනි. මට පන්තියේ හිත එක්තැන් කරගෙන සිටින්නට නොහැකි වීම ඊට හේතු විය.

එදා මම පාසල් බස් රිය මඟ හැරීමට පාසලෙන් පරක්කු වී පිටවුණෙමි. උපේඛාද මා සමඟ විය.

"අසංක නිකමට වාගෙ ඒ කතාව කියන්න ඇති... උඹ ඒකට පණ දුන්නෙ....."

"කවින්ද මගෙන් පලිගන්නවා... මගෙ අතකින්වත් අල්ලලා නැති උෟ කොහොමද මගෙ පෙට්ටිය කඩන්නෙ...."

"ඉතිං එහෙමනං ඇයි බොරුවට කළබල වුනේ... දන් නැමෝම හිතන්නෙ ඒක ඇත්තක් කියලා..."

"ගෙදරට එහෙම ආරංචි වුණොත් ලොකු අම්මා මාව මරයි."

උපේඛාගේ මුහුණේ දුක්මුසු බවක් පෙණුනි.

"උපුල් එක්ක යාලුයි කියලත් ගෙදරට බොරු ආරංචියක් ගියානෙ...."

"ඒක ඇත්ත ආරංචියක් වුණත් ලොකු අම්මලා පිලිගන්නෙ

නෑ.. උපුල් මට සහෝදරයෙක් වගෙ..."

"උඹ කියන්නෙ ඇත්තද..?"

"ඇයි මං බොරු කියන්නෙ...?"

"එහෙනං ඇයි කවින්දට බෑ කියන්නෙ...?"

"උඹට තේරෙන්නෙ නෑ උපේඛා... මං නිදහසේ කිරිල්ලියක් වාගෙ ඉන්නෙ.. මට හොඳට ඉගෙන ගන්න ඕන. කැම්පස් යන්න ඕන... හැමෝම මං ගැන බලාපොරොත්තු තියාගන ඉන්නෙ... අනිත් එක....."

"මොකක්ද අනිත් එක...?"

"මට ලව් එකක් ඕනෙ නෑ බං...මට ඔය එක එකාට තුරුළු වෙවී බීච් ගානෙයි ෆිල්ම් හෝල් ගානෙනයි ඉන්න වෙලාවකුත් නෑ... කොටින්ම මට ආදරේ කරන්න වෙලාවක් නෑ."

"උඹට උපුල් එක්ක පන්සලේ අතන මෙතන මුකුළු කරන්න වෙලාව තියෙනවා...."

"උපේඛා... උඹ මොනවා කියනවද මන්දා...."

"ඔය කිව්වට උපුල් ගැන උඹේ හිතේ තියෙනවා...."

"මගේ හිතේ තියෙනවානම්... මම ඒක හිතේ තියාගෙන දුක් විඳින්නෙ නෑ. වක් ගාලා කියලා දානවා... ඒත් මට පේන්නෙ... උඹ මට වඩා උපුල් ගැන හිතනව කියලා...."

මම උපේඛා කොනිත්තමින් කීවෙමි. ඇය හයියෙන් සිනාසුණාය.

ගෙදර ආපසු මම කෑමත් නොකා සුදු ගවුම පිටින්ම ඇඳට වැටුණෙමි. අම්මා උන්නේ අසනීප ගතියෙනි. අධි රුධිර පීඩනයට බෙහෙත් බොන අම්මා ලොකු අම්මා තරමට ක්‍රියාශීලි





තත්ත්වයේ නොවූවාය.

"මොකද උදානි... බත් කන්නෙ නැද්ද...?"

"මහන්සියි අප්පා... මේ බස්වල ඇවිදින්"

"එහෙමනම් ලොකු තාත්තට කියලා කාර් එකේ ඉස්කෝලෙ යන්න ලෑස්තිකරගන්ට වෙයි....."

අම්මා නිතරම මගේ සැපපහසුව ගැන හිතුවාය. එනමුදු ලොකු අම්මා කීවේ අනෙක් ළමුන් සේ දුක්විඳ අපත් ජීවිතය විඳිය යුතු බවය. ඒ නිසාම සමහර අවස්ථාවලදී බටර් විස්කෝතු කා තේ බොන්නට, කිරිහොදි සමග පමණක් බත් කන්නට වැනි දේට ඇය අපව පුරුදු කළාය. ලොකු තාත්තා කාර් එකේ යද්දී අපි පයින් ගියෙමු. ළමා කාලයේ මෙන්ම ගැටවර වයසේද විඳිය යුතු සුන්දරත්වය අපි නොඅඩුවම විඳගත්තෙමු.

"මොනව වුණත් පුතේ ඒලෙවල් විභාගේ හොඳට පාස් වෙලා මගෙ පුතා කැම්පස් යන්නෙපායැ. උපාධියක් ගහලා... උඹ ඉස්කෝලෙ හාමිනේ කෙනෙක් වෙනවා දකින එක මගෙ සන්තෝසෙ..."

"හරි... හරි .... අම්මා දවල්ට බෙහෙත් බිව්වද?"

"ඔව් පුතේ බිව්වා...."

"එහෙනං අම්මා නිදාගන්න... මාත් චුට්ටක් මහන්සියට ඇස්දෙක පියාගන්නවා. ඔන්න අක්කලටයි අයියටයි කියන්න මාව කුද්දන්න එපා කියලා... ගහන එකත් ගහනවා... මම....."

එසේ කියමින් මම ඇස් දෙක පියාගත්තෙමි.

මට ඕනෑ වූයේ නිදන්නට නොව තනිවන්නටය. තනිවී හිතන්නටය. මා හිතන්නේ කා ගැනද? බස් රියේ පැතිර ගිය කතාව ගම වටේත් අවට පාසල්වලත් පැතිර යන්නට මහ දවසක්

යන්නේ නැත.

තනි වී අඬන්නටවත් මේ මහ ගෙදර ඉඩක් නැත. එහෙත් චරිතය බිඳගත් යුවතියක සේම මම දුක් වුණෙමි. මිනිසුන් අපට තරක කතා කියන්නේ ඇයි?

"පස්සෙන් ඇවිත් වැඩේ කරගන්න බැරි වුණාම ඔන එකෙක් හදන්නේ පලිගන්න..."

මට උපුල් නිතර කියන කතාවක් සිහිවිය. මගේ හිත හැදිය හැක්කේ උපුල්ට පමණි. මගේ හිත ඉතා ඉහාදින් අඳුනාගත් කෙනෙක් වේ නම්... ඒ උපුල්ය.

"උදානි... උඹ උගුරට හොරා බේත් බොනවා නෙමෙයි නේද?"

මගේ හිත මට කතාකලේය. උපේඛාට අවශ්‍ය මා උපුල්ට ආදරය කරනවාදැයි දැන ගැනීමටය.

යෞවන සමිති සම්මේලනවලදී විවාදවලදී ඩෙස් බංකු උඩ යන තරම් හයියෙන් උපුල් කෑ ගසන විට ඕනෑම කෙල්ලක වසඟයට ගන්නා හයියක් ඔහුට ඇතැයි මම සිතමි.

එහෙත් ඔහු බොහෝ සංවේදී, අහිංසක කොල්ලෙකු වග වැඩි දෙනෙකු තේරුම් ගත්තේ නැත. මොනවා වුණත් මම ඉරිදා වනතුරු බලා සිටියෙමි. ඒ ඔහුට කියා මගේ කැඩුණ හිත යලි පූට්ටු කර ගැනීමටය.

"ඇත්ත කවද හරි ජය ගන්නවා උදානි...."

"කවුරු මොනවා කිවත් තමන් ගැන දන්නෙ තමන්නෙ....."

"ඔය එක එකා කතා කීවට ඔයා වැටෙන්න එපා... කඩා ගන්න බැරි වුනාම නරියත් මිදි ඇඹුල් කිව්වලු...."





මවැනි කතාවක් කියමින් උපුල් මා සනසවනු ඇත.

ඒනිසා සිකුරාදා පාසල් නොගිය මා ඉරිදා වන තුරු බලා ගෙන සිටියෙමි.

* * * * *

"ලොකු හාමුදුරුවෝ උදානි අක්කට එන්න කිව්වා...."

උදේ හතටත් පෙර කහ අරලිය මල් පොකුරක්ම කඩාගෙන ළමාසාරියෙන් සැරසී දහම්පාසලට ගිය මට කුඩා පන්තියක සිසුවියකගෙන් පණිවිඩයක් ලැබුණි. මා පන්සලට ගොඩවදින විට ලොකු හාමුදුරුවෝ බෝ මළුවේ සිටින අයුරු මට පෙණින. "මොකක් හරි වැඩක් වෙන්න ඇති උදේම" මට සිතුණි. කුඩා කාලයේ මිදුල අතුගෑවට වළව අනගා නාරං පෙත්තක් දුන්නෙත් උන්වහන්සේමය.

මම බෝධිය ළඟට ගොස් ලොකු හාමුදුරුවන්ට වැඳ පසෙකට වීමි.

"උදානිට මම එන්න කිව්ව කාරණාව දන්නවද?"

ලොකු හාමුදුරුවන් එය විචාලේ තරමක ගැඹුරු කටහඩින් යයි මට සිතුණි. කුමක් වුවද කාරණාව බරපතල විය හැකිය.

"නෑ ලොකු හාමුදුරුවනේ."

"හොඳයි... උදානි කියන්නේ අපේ දහම්පාසල සතු වටිනාම වස්තුවක්... උපුල් කියන්නේත් එහෙමයි... කථික තරඟවලදී විවාද තරඟවලදී කීර්තියක් ගෙනත් දුන්න... ඒත් මට මෙහෙම ආරංචියක් ආවා..."

කොහොම ආරංචියක්ද ලොකු හාමුදුරුවනේ කියා අසන්නට මට හයියක් නොවීය. පපුව දිගේ පහළට ගලා ගිය දා බිඳු දෙකක් බඩ හරියෙනුත් පහළට යනු මට දැනෙයි.

"උදානි උපුල් එක්ක පෙම්හසුන් ගණුදෙනු කරනවද....?"

"අපෙ ලොකු හාමුදුරුවනේ... එක් නම් ලොකු බොරුවක්... ලොකු හාමුදුරුවන්ට ඔය බොරුව කිව්වෙ කවින්දද. අසංකද සමහරවිට හේමන්තලාද.... මොකද එයාල මට ලියුම් දුන්නා. මං ඒවා ගන්නෙ නෑ. උපුලුයි මායි අතරෙ එහෙම දෙයක් නෑ අපෙ හාමුදුරුවනේ....."

අවසන් ටික කියද්දී මගේ කටහඬ බර වී තිබුණි.

"කීවට මොකද මාත් විශ්වාස කරේ නෑ.. උදානි හොඳ ළමයෙක් කියන්න මං දන්නවා... ඒත් මේ වයසෙ වැරැද්ද හරි.... උදානි යන්ඩ... පන්තියට....."

ලොකු හාමුදුරුවෝ මා විශ්වාස කළ බව මට දැණින. එහෙත් මුළු ලෝකය ගැනම කලකිරීමක් මට දැනෙමින් තිබුනි. ලෝකයා අපට මේ විදිහට කටකතා හදා ලබන වින්දනය කුමක්ද? කවින්දගේ අතින්වත් අල්ලා නැති මට ඔවුන් පද හැදුවේ මා කවින්ද අතින් කුමරි බඹසර බිඳගත් බවටය. දන්න පැටි වියේ සිටම යටකලිසම පිටින් උපුල් සමග ක්‍රිකට් ගැසූ මට වත්ත පිටියේ නැටූ මට.. එළදෙනගේ කිරි බුරුල්ලෙන් කිරි උරා බිව් මට.... උපුල් සහෝදරයෙක්ම විය. එහෙත් ලොකු හාමුදුරුවන්ගේ කණටම ගොස් ඇත්තේ අප දෙදෙනා අතර ප්‍රේමයක් ඇති බවය.

තව දුරටත් පන්සලේ රැඳී සිටීම අපහසු බව මට දැණින. එහෙත් ගෙදර දුවන්නටද නොහැක. කෝකටත් තෛලය සේ 'බඩරිදෙනවා' කියන බොරුව හරියන්නෙ නැත. අක්කලා කියන්නේ අපේ උදානි නංගිට මාසෙකට දහවතාවක් විතර බඩේ අමාරු හැදෙනවා කියාය.

මම ධර්මශාලාවට පැමිණ පසෙකට කර තිබූ ඩෙස් බංකු ඇද පංති සකසන්නට වීමි. ටික මොහොතකින් උපුල් ද පැමිණ මට උදව් කරමින් සිටියේය. එහෙත් උපුල් වෙනදා මෙන් මා සමඟ දොඩමළු නොවීය. එයට හේතුව මේ පැතිර යන කට





කතාව යයි මම සිතුවෙමි.

. "උපුල්...."

"මන්..."

"මොකද අනේ බස්සා වාගෙ මන් මන් ගාන්නෙ?"

"නෑ නිකං... උපේඛා ආවද?"

"තාම නෑ... ඇයි..."

"මේ... හොරෙන් බලන්න..."

ඔහු සිය යටි සාක්කුවේ වූ මුදල් පසුම්බියේ දමා ගෙන උන් රෝස පැහැති ලිපියක් මා අත තැබුවේය. මම බියෙන් වට පිට බැලීමි. කතාව ගොස් තිබුණේ මා උපුල් සමග ලියුම් ගණුදෙනු කරන බවටය. වතුර පැංකිය පිටුපසට ගිය මම පොතක් අස්සේ දමාගෙන ලියුම දිග ඇරියෙමි.

"දෙයියනේ මේ උපේඛා...."

මට කියැවිණි. පෙම් රස වැහෙන ලිපියකින් උපුල්ට ආදරය ප්‍රකාශ කර සිටියේ උපේඛාය. මාත් උපුලුත් අතර ආදරයක් තියේද යන්න සත්‍යකොටම දැන ගන්නට උවමනා වූයේත් උපේඛාටය.

"මෙකිගෙ හොර හිත...."

එහෙත් මට මොකක්දෝ පරාජිත බවක් දැණින. මෙතුවක් කාලයකට මා සිතා සිටියෙ උපුල් මටම අයිති වූ වස්තුවක් ලෙසිනි. උපුල්ට මාත් මට උපුලුත් සිටීම පමණක් ප්‍රමාණවත් යයි සිතූ මා, මා වටා සිටි අනෙක් අයට නිසි වටිනාකමක් දුන්නේ නැත. කවින්ද වුණත් එකවරම ප්‍රතික්ෂේප කිරීමට පහසුවුණෙත් ඔහු හා මිතුරුදමක්වත් පවත්වා ගැනීමට මට උවමනාවක් නොවුණෙ ඇයි? හේතුව හැමදෙයකටම හයියට උපුල් සිටීම නොවේද? පෙනුමෙන් එතරම් කඩවසම් නොවූවත් උපුල් දක්ෂයෙකි. එහෙත්

[illegible]

“උදාහී....”

“මන්...”

[illegible]

“උදාහී... කියන්නකො...”

[illegible]

[illegible]

• • • • •





මට ජීවිතය දුකක් බව දැනෙන්නට ගත්තේ අම්මාගේ මළගමත් සමගය. අම්මා මිය යන විට මං උන්නේ උසස්පෙළ පළමු වසරේය. මා ගුරුවරියක වනු බලන්නට ආසාවෙන් උන් අම්මා අධිරුධිරපීඩනය හේතු කොටගෙන වූ හදිසි හෘදයාබාධයකින් ජීවිතයෙන් සමුගත්තාය.

[illegible]

“උදාහී.... [illegible]

[illegible]

“මට තනියක් නෑ ලොකු අම්මේ...”

“[illegible] ඉන්නවා... අයියා ඉන්නවා... ලොකු තාත්තා ඉන්නවා... ඉතිං මොකක තනියක්ද අපට.”

අම්මා නැතත් ලොකු අම්මා මට ඒ තනිය නොදැනෙන්නට උපරිම උත්සාහයක් ගත්තාය. එහෙත් මම මානසිකව කඩා වැටී සිටියෙමි. මේ දුක කියන්නට උපුල්වත් ළඟ සිටියානම්. එහෙත් උපුල්ට දැන් අයිතිකාරියක සිටී.

මගේ කාලය එසේ ගෙවුණා යයි මම සිතමි... ඉගෙන ගැනීමට තිබුණු උනන්දුව අඩුවුණි. දහම් පාසල් ගමනත් යොවුන සමිති සම්මේලනවලට සහභාගීත්වයත් අඩු වුණි. කොටින්ම කිවහොත් මවගේ අභාවයත් සමග මා [illegible] උදාසීන දැරියක

විමි.

"උඹ දන්නවද වැඩක්...."

පාසලේදී ඉරෝමි මා අසලට ආවාය.

"මොකක්ද?"

"ළඟම යාළුවා කරන දේ දන්නෙ නෑ නේද?"

"මොකද වෙලා තියෙන්නෙ.... පැනල ගිහින්ද..."

මම උපේඛාගේ අසුන දෙස බලමින් ඇසුවෙමි. උපේඛා තවම පාසලට අවුත් නැත. උසස් පෙළ සමත් වන්නට ඇයටද උවමනාවක් නැතුවා සේය.

"තාම පැනල ගිහින් නෑ... හැබැයි උපුල්ට බූට් එක තියල"

මම දුවුණෙමි. ඒ උපේඛා වෙනුවෙන් නොවේ. උපුල් වෙනුවෙනි. හැම දෙයම උපරිමයෙන් මහන්සි වී කරන උපුල් මදි නොකියන්නට උපේඛාට ආදරය කළේය. ඒ ආදරයේ කොතැනක හෝ අඩුපාඩුවක් වුණා දැයි මම කල්පනා කළෙමි.

උපුල් ද දුප්පත් කොල්ලෙක් වුවද ඔහු ඉගෙනීමට ඉතාම දක්ෂයෙකු වූ නිසා ඔහු නියත වශයෙන්ම සරසවි වරම් ලබාගනු ඇත. හැම දෙයකටම නරකට හිටින්නේ ඔහුට යම් තීරණයක් ගැනීමේ නොහැකියාවයි, හැමදේටම සැලෙන සිත යයි මට සිතේ.

"උපේඛා කොහොමත් උපුල්ට ගැලපෙන්නෙ නෑ. මම ඉතින් ඕවා කියන්න ගියේ නෑ... එහෙම කියන්න ගියා නම් හිතන්නෙ... මගෙ හිතේ උපුල් ගැන තියෙනවා කියලා...."

"අනේ එහෙම නෙවෙයි උදා... උපුල් ට ගැලපෙන්නෙ නම් උඹ....."





"උපුල් මට සහෝදරයෙක්.. මට මේ වෙලාවෙ දුක උපුල් ගැන.. ඇයි උපේඛා උපුල්ට බූට් තියල තියෙන්නෙ......?"

"උපේඛාට ගෙදරින් ප්‍රපෝසල් එකක් තියෙනවලු... එග්සෑම් ඉවර වෙලා බඳිනවලු......"

උපේඛා මේ කිසි දෙයක් මා සමග කිවේ නැත. උපේඛා උපුල් සමග සම්බන්ධය පටන් ගත් පසුවත් මගේ අම්මා නැතිවීමත් සමග මා නිරතුරු උත්සාහ කළේ තනිවෙන්නටය. ඊටත් උපේඛා වුවද මා උපුල් සමග ආශ්‍රය කරනවාට කැමති වූයේ නැත. එනිසාම මම උපුල් හා උපේඛා දෙදෙනාගෙන්ම ඈත්වී කාලය ගත කරන්නට පුරුදු වීමි.

මිත්‍රත්වය තුල ජීවිතයට දනෙන සහනය, හයිය, සතුට යන සියල්ලම ආදරය තුලින් විඳින්නට හැකි දැයි මම නොදනිමි.

පාසල ඇරෙන වේලාවේ මම කොරිඩෝව දිගේ ඇවිදගෙන ආමි. උපේඛා වගක් නැතිව ඇගේ යෙහෙළියන් රොත්තක් හා සිනාසෙමින්... ඔවුන් සමග ඡායාරූප කිපයක් බලමින් මා ඉදිරියට ඇවිදගෙන ආහ.

"ආ... උදා...නි.... දැන්ම සාරි එකක් වැඩ දාල තියාගනිං" අශෝකා කීවාය.

"ඒ මොකද.....?"

"එග්සෑම් ඉවරවුණ ගමන් උපේඛා බඳිනවලු... මේ ඉන්නෙ හැන්ඩ්සම් පොරක්....."

ඉරෝමී... අතේ තිබී ඡායාරූපයක් ගෙන මට පෙන්වූවාය.

"එතකොට උපුල්... උපුල්ට මොකද වෙන්නෙ....?"

මම එක එල්ලේ උපේඛා දෙස බලමින් ඇසුවෙමි. උපේඛා

ඇස් දෙක බිමට හරවා ගත්තාය.

"ආදරේ කරාට කසාද බඳිනවා කියලා පොරොන්දු වුණේ නැලු..."

මගේ ප්‍රශ්නයට වග උත්තර බැන්දේ ඉරෝමිය.

"ගොළු හදවතේ දම්මි සුගත්ට කිව්වෙත් ඔය වගේ කතාවක්...."

"ඉතින් උඹට පුළුවන්නෙ දම්මි වෙන්න. උපේඛත් එක්ක ඉන්න හැම වෙලාවකමත් උපුල් කියන්නෙ උඹ ගැනලු"

ඒ ටිකත් කිව්වේ ඉරෝමිය. මට මෙතැන ඉරෝමී සමග විසඳාගන්නට ප්‍රශ්නයක් නැත. උපුල්ව එපා වී ඇත්තේ අළුත් ප්‍රේම වන්තයා හමු වූ පසුවය.

මම කොරිඩෝව දිගේ අවුත් ගේට්ටුවෙන් පිටතට ආවෙමි. යසෝධරාව තුල ගෙවන පාසල් ජීවිතයේ මේ අවසාන දින කිහිපයයි.

එහෙත් අනාගතය ගැන මට අහස උසට පැතුමන් නොවීය. අම්මාත් තාත්තාත් නැති අඩුව මට මහ ලොකුවට නොදැණුනත්.. ඒ ආදරය.... එයට අලගු තැබිය හැක්කේ කාටද?

"ශ්... තනියම යන්නෙ.... කෝ යාළුවො....."

කවින්දලාගේ රැලේ වූ අළුත් මුහුණක් වූයේ කංචනය. ටික දිනක සිට කංචන මා ගැන උනන්දු වන බවක් මට පෙණුනි.

"මොන යාළුවාද හොයන්නෙ...?"

මම ආපිට ඇසුවෙමි. ඉන් ඔහු ලජ්ජාවට පත්වූ බව මට පෙණිනි. ඇත්තෙන්ම උපුල්ගෙන් පසුව මම පිරිමි ළමයෙකු සමග මිත්‍රත්වයක්වත් ඇති කර ගැනීමට පසුබෑවෙමි. එහෙත් අනෙක් කොල්ලන් මෙන් නොව කංචනගේ කියන්නට තරම් වරදක් මා





දුටුවේ නැත.

"අනේ නෑ... මට ඔයාගේ යාළුවො ගැන හොයන්න ඕන කමක් නෑ... නිකමට ඇහුවෙ...."

"එහෙනම්... කා ගැනද හොයන්න උවමනාව තියෙන්නෙ... මං ගැනද?"

ඔහු අහිංසක අයුරින් සිනාසුණේය.

"මං වැරදි ප්‍රශ්නයක් ඇහුව නම් සමාවෙන්න...."

ඔහු මා දෙසට හිස ඇලකරමින් කියා සිටියත් ගොනා හැරෙන්නේ පොල් පැළයට බව මම අත්දැකීමෙන් දනිමි.

කංචන පාසල් බස්රියේ මා ළඟින් ඉඳගත්තේය. ඔහු මොනවා කීවාදැයි මට මතකයක් නැත. මට දැණුනේ ඔහු මා ගැන බලාපොරොත්තු තබාගෙන සිටින බව පමණය.

❋ ❋ ❋ ❋ ❋

එදින ඉරිදාවක් නිසා මම වැඩිපුර ටිකක් නිදා ගත්තෙමි. දහම් පාසල් ගමනද නැවතී තිබුණ නිසා උදාවන හැම ඉරිදාවකම මම ඉතා කම්මැලිකමින් දවස පටන් ගත්තෙමි.

"උදානි... තාම නිදිද?"

ලොකු අම්මා එසේ අසා ගෙන කාමරයට පැමිණියේ තරමක කළබල ගතියකිනි.

"ඇයි ලොකු අම්මේ..... කෝ තේ හැදුවද....?"

දන්න දා සිටම මගේ උදෑසන තේ කෝප්පය නිදි යහනටම වැඩියේය. බත් පිඟාන කීයට හෝ මා එනතුරු මේසය මතම බලා සිටියේය.

"අක්කා.... ඔත් ගෙනෙයි... උදේම නරක ආරංචියක් ආව පුතේ..."

"මොකක්ද? මට ප්‍රපෝසල් එකක්ද?"

"මේක විහිලුවක් නෙමෙයි. අර ළමයා.... ඉස්පිරිතාලෙ ගෙනිහින්."

"කවුද....?"

"උපුල්...."

"ඇයි....?"

"අනේ මන්දා... ඔච්චර මොළේ තියෙන ළමයෙක්... ඒ ළමයා පාන්දර වහබීලා..."

"මොකක්... ලොකු අම්මේ... උපුල් වහබීලා..."

මා නැගිට්ටා නොව නැගිට්ටවිණ.

"අනේ ලොකු අම්මෙ අපි ඉස්පිරිතාලෙ යං... උපුල් මොනවද මේ කරගත්තෙ..."

මම ලොකු අම්මා බදාගෙන හඬන්නට වීමි.

"දැන් අපි ගිහින් වැඩක් නෑ රත්තරනේ... වෙන්න ඕන හරිය වෙලා ඉවරයිලු... පාන්දර කිට්ටුව මඩුව ළඟ වැටිලා ඉන්නවා දකලා තියෙන්නෙ. පාන්දර ඒ ළමයා... ජීවිතේ එපාම කියලා ලියලලු මැහිතෙල් බීල තියෙන්නෙ... ගෙනියකොටත්....."

"ලොකු අම්මේ....."

මම හයියෙන් ලොකු අම්මාව බදා ගත්තෙමි. ලොකු අම්මා කියන්නේ රෝහලට ගෙනයන විටත් උපුල්ගේ පණ ගිහින් කියන වගය.





"අනේ මගෙ උපුල්...."

මම එසේ කෑ ගසමින් ලොකු අම්මාව වැළඳ ගත්තෙමි.

* * * * *

උපුල් ජීවිතයෙන් සමු ගැන්ම මට කිසිසේත්ම දරා ගත නොහැකි ශෝකයක් විය. ඔහු මගේ ළමා කාලයයි. ඔහු මගේ ගැටවර වියයි. මගේ යොවුන් වියයි. ජීවත්ව උන්නා නම් .... මගේ ජීවිතයේ සියලුම කල්හි ඔහු මගේ හොඳම මිතුරා ලෙසින් ළඟ ඉඳිනු ඇත....

මට මේ තරම් දැඩි වේදනාවක් දනෙනුයේ මා කවදාක හෝ උපුල්ට ආදරය කළ නිසාද? මළගෙදරදී මර ලතෝනි දෙමින් හැඬුවේ මාය. උපේඛා නොවේ. උපුල් වස බීවේ උපේඛා ඔහුගේ ප්‍රේමය අතහැර යාම නිසාවෙනි. උපුල්ගේ සංවේදි හිත අඳුනා ගැනීමට නොහැකි වූවා නම් උපුල්ට පෙම් හසුන් ලියා ඇය උපුල්ව යාළු කර ගත්තේ කුමකටද?

"ඇත්තටම උපේඛා උපුල් එක්ක යාළු වෙලා තියෙන්නෙ උපේඛාගේ උවමනාවකට නොවෙයි."

මළ ගෙදරදී ඉරෝෂි මා සමඟ කීවාය.

"එහෙනම්..."

"ඒ හැමදේටම මුල උඹ...."

"මම.... මමද කීවෙ උපේඛාට උපුල් එක්ක යාළුවෙන්න කියලා කොටින්ම මම ඒකට විරුද්ධ වුණා. ඒත් උපුල් පිස්සුවෙන් වාගේ උපේඛාට ලව් කරන්න පටන් ගත්තට පස්සෙ මම හිත හදාගත්තෙ."

"උපේඛාට උපුල් එක්ක ජොලියට වාගෙ යාළු වෙන්න කිව්වෙ කවින්ද."

"කවින්දට තිබ්බ උවමනාව මොකක්ද?"

"ඒකට හේතුවත් උඹ... කවින්ද ගේම අතහැරියේ නෑ.

"ඒකට හේතුවත් උඹ... කවින්ද ගේම අතහැරියේ නෑ. කවින්දගෙ හිතේ සැකයක් තිබුණා උඹ උපුල් එක්ක යාළුවෙයි කියලා... ඇත්තටම සමහරු හිතාගෙන හිටියෙ ඔය දෙන්න යාලුයි කියලා...."

මම කාරණාව තේරුම් ගත්තෙමි. දූන් ඉතින් ඒ අහිංසකයාගේ මළගමටත් වැරදිකාරිය වී ඇත්තේ මාය. උපුල් ආදරණීය උපුල්... මා නොකළ වරද ඒකයි. ඔහුට ආදරය නොකිරීම මා කළ බලවත් වරදක් යයි මට දූන් සිතෙයි. කවින්ද මගේ චරිතය මරා දමමින් මට නරක කතාවක් කිව් වෙලාවෙත් මගේ සිත හැදුවේ ඔහුය. ජීවිතයේ අම්මා මිය ගිය වෙලාවේ ඔහු මගේ ළඟින්ම හිටියේය. ජීවිතයේ සැම මොහොතකම සෙවනැල්ල සේ උන් ඔහු වෙත කවුරුවත් නොව හැර ගියේ මාවමය. ඔහු නැති අඩුව දූනෙන්නේ උපේඛාට නොව මටය.

"උපේඛා නෙවෙයි උදානිනෙ ඇඬුවේ...."

හැමෝම කීවේ ඒ ටිකය. මර ලතෝනි දෙමින් කෑ ගසමින් මා හැඬුවේ ඔහු මෙන්ම සංවේදී හිතක උරුමක්කාරිය මා නිසාය.

* * * * *

මා උසස් පෙළ විභාගය ලියුවේ ඕනෑකමකින් නොවේ. බොහෝ ප්‍රශ්න මා වටා කරකැවෙමින් තිබුණි. අම්මාගේ මරණයත්... උපුල්ගේ මරණයත් දෙකම මගේ සිත රෝගී කළේය. කුඩා කල සිටම පණට පණ ඇසුරු කල ඔහුගේ වෙන්වීම දරාගත නොහැකිය. මගේ රැකවරණයට ජීවිතය පුරාම මගේ ළඟ උන්, එකම කාමරයේ නිදාගත් අම්මාද මා අතහැර ගියාය.

මා සමත් වුයේ විෂයයන් දෙකක් පමණි. විශ්ව විද්‍යාල අධ්‍යාපනය සිහිනයක් විණි.

"තව පාරක් විභාගය කරනවද උදානි?"





ලොකු අම්මා කීවේද අලස ගතියකිනි. ඒ මට වියදම් කිරීමට නොහැකිව නොවේ. මාව යළි පණගන්නවා ඉගෙනීමට යොමු කිරීමේ හයියක් ලොකු අම්මාට නොමැතිවූ නිසාය.

"එහෙනම් මොනවා හරි කෝස් එකක්වත් කරලා ජොබ් එකකට යන්න බලන්න උදානි...."

"කරනව නම් ටීචින් තමයි. අම්මගෙ කැමැත්ත තිබුණෙත් ඒකටනෙ."

"විද්‍යාපීඨ යන්න පුළුවන්ද?"

"ටීචින් එග්සෑම් කරාම හරි."

මා කුඩා අවදියේ සිටම ආශා කලේ ප්‍රාථමික ගුරුවරියක වීමටය. ඒ අතරේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කරගැනීමට මම කොල්ලුපිටියේ ඉංග්‍රීසි පන්ති යාමට පටන් ගත්තෙමි.

"උදානී.... පන්තිය ඇරෙන වෙලාවට මම එන්නද පොඩ්ඩක් හම්බවෙන්න."

කංචන කියා සිටියේය. උපුල්ගේ මළ ගෙදරදී මුණ ගැසුණ පසුව කංචන මට යළිත් මුණ ගැසුණේ නැත.

"මොකටද?"

"මාව ඔය තරම් අසරණ කරන්නෙ ඇයි..? මට ඔයාව හම්බවෙලා කියන්න දෙයක් තියෙනවා..."

"ඉතින් කියන්න....."

"මෙහෙම බෑ...."

ඔහු ලැජ්ජාවෙන් ඇඹරුණේය. මේ ආරාධනා කරනුයේ ආදරයකටය. මටද ආදරයක අවශ්‍යතාවය දූනෙමින් තිබුණි. මගේ දුක සැප සොයන මට ආදරය කරන ආදරණීය යෞවනයෙකුගේ ආදරය මට අවශ්‍යව තිබුණි.

"ලොකු අම්මා බලා ඉන්නවා මං එනකං පංති ඇරිලා පරක්කු වෙන්න බෑ. සෙනසුරාදා වාගෙ දවසක නම් පුළුවන්

"කවින්දට තිබ්බ උවමනාව මොකක්ද?"

"ඒකට හේතුවත් උඹ... කවින්ද ගේම අතහැරියේ නෑ. කවින්දගෙ හිතේ සැකයක් තිබුණා උඹ උපුල් එක්ක යාළුවෙයි කියලා... ඇත්තටම සමහරු හිතාගෙන හිටියෙ ඔය දෙන්න යාලුයි කියලා...."

මම කාරණාව තේරුම් ගත්තෙමි. දැන් ඉතින් ඒ අහිංසකයාගේ මළගමටත් වැරදිකාරිය වී ඇත්තේ මාය. උපුල් ආදරණීය උපුල්... මා නොකළ වරද ඒකයි. ඔහුට ආදරය නොකිරීම මා කළ බලවත් වරදක් යයි මට දැන් සිතෙයි. කවින්ද මගේ චරිතය මරා දමමින් මට නරක කතාවක් කිව් වෙලාවෙත් මගේ සිත හැදුවේ ඔහුය. අම්මා මිය ගිය වෙලාවේ ඔහු මගේ ළඟින්ම හිටියේය. ජීවිතයේ සෑම මොහොතකම සෙවනැල්ල සේ උන් ඔහු වෙන කවුරුවත් නොව හැර ගියේ මාවමය. ඔහු නැති අඩුව දැනෙන්නේ උපේඛාට නොව මටය.

"උපේඛා නෙවෙයි උදානිනෙ ඇඬුවේ...."

හැමෝම කිවේ ඒ ටිකය. මර ලතෝනි දෙමින් කෑ ගසමින් මා හැඬුවේ ඔහු මෙන්ම සංවේදී හිතක උරුමක්කාරිය මා නිසාය.

* * * * *

මා උසස් පෙළ විභාගය ලියුවේ ඕනෑකමකින් නොවේ. බොහෝ ප්‍රශ්න මා වටා කරකැවෙමින් තිබුණි. අම්මාගේ මරණයත්... උපුල්ගේ මරණයත් දෙකම මගේ සිත රෝගී කළේය. කුඩා කල සිටම පණට පණ ඇසුරු කල ඔහුගේ වෙන්වීම දරාගත නොහැකිය. මගේ රැකවරණයට ජීවිතය පුරාම මගේ ළඟ උන්, එකම කාමරයේ නිදාගත් අම්මාද මා අතහැර ගියාය.

මා සමත් වුයේ විෂයයන් දෙකක් පමණි. විශ්ව විද්‍යාල අධ්‍යාපනය සිහිනයක් විණි.

"තව පාරක් විභාගය කරනවද උදානි?"





ලොකු අම්මා කීවේද අලස ගතියකිනි. ඒ මට විලදම් කිරීමට නොහැකිව නොවේ. මාව යලි පණගන්නවා ඉගෙනීමට යොමු කිරීමේ හයියක් ලොකු අම්මාට නොමැතිවූ නිසාය.

"එහෙනම් මොනවා හරි කෝස් එකක්වත් කරලා ජොබ් එකකට යන්න බලන්න උදානි...."

"කරනව නම් ටීචින් තමයි. අම්මගෙ කැමැත්ත තිබුණෙත් ඒකටනෙ."

"විද්‍යාපීඨ යන්න පුළුවන්ද?"

"ටීචින් එග්සෑම් කරාම හරි."

මා කුඩා අවදියේ සිටම ආශා කලේ ප්‍රාථමික ගුරුවරියක වීමටය. ඒ අතරේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කරගැනීමට මම කොල්ලුපිටියේ ඉංග්‍රීසි පන්ති යාමට පටන් ගත්තෙමි.

"උදානි.... පන්තිය ඇරෙන වෙලාවට මම එන්නද පොඩ්ඩක් හම්බවෙන්න."

කංචන කියා සිටියේය. උපුල්ගේ මළ ගෙදරදී මුණ ගැසුණු පසුව කංචන මට යලිත් මුණ ගැසුණේ නැත.

"මොකටද?"

"මාව ඔය තරම් අසරණ කරන්නෙ ඇයි...? මට ඔයාව හම්බවෙලා කියන්න දෙයක් තියෙනවා..."

"ඉතින් කියන්න....."

"මෙහෙම බෑ...."

ඔහු ලැජ්ජාවෙන් ඇඹරුණේය. මේ ආරාධනා කරනුයේ ආදරයකටය. මටද ආදරයක අවශ්‍යතාවය දැනෙමින් තිබුණි. මගේ දුක සැප සොයන මට ආදරය කරන ආදරණීය යෞවනයෙකුගේ ආදරය මට අවශ්‍යව තිබුණි.

"ලොකු අම්මා බලා ඉන්නවා මං එනකං පංති ඇරිලා පරක්කු වෙන්න බෑ. සෙනසුරාදා වාගෙ දවසක නම් පුළුවන්

වෙයි."

"සෙනසුරාදා... එහෙනම් මං ඔයා එනකං බලන් ඉන්නවා.... හවස එන්න.... ලිබර්ටි එක ළඟට"

මම ඔහුගේ ඇරයුම පිළිගත්තෙමි. ඔහුගේ මුහුණේ ඇඳි ජයග්‍රාහී සිනහව සුළුපටු නොවේ. ඇත්තෙන්ම එය ජයග්‍රහණයක් වන්නේ ඇයි? පිරිමි ළමුන් කී දෙනෙකුගේ ආදරය මේ වන විට මා විසින් ප්‍රතික්ෂේප කර ඇද්ද? එනමුදු කංචනව හමුවීමට මා එවැනි අවසරයක් ලබා දුන්නේ ඇයි?

එදින මගේ දහනව වන උපන්දිනය විය. ලොකු අම්මා කල් ඇතිවම ඒ වෙනුවෙන් කේක් සැදුවාය. අපි උදේ කිරිබත් උයාගෙන පන්සල් ගියෙමු. හවස යාළුවෙක් හමුවීමට යන්නට මම ලොකු අම්මාගේ අවසරය ගතිමි. කංචන වෙනුවෙන් උපන්දින කේක්ද රැගෙන මම ඔහු හමුවීමට ගියෙමි.

"අපි බීච් එකට යමුද?"

ඔහුගේ ආරාධනාවට මම විරුද්ධ නොවීමි.

"අද මගෙ උපන් දිනේ....."

මම රැල්ල දෙස බලාගෙන කීමි.

"කෝ දෙන්න අත."

ඔහු මගේ අත අල්ලාගත්තේය. මගේ ආදරය පිළිගැනීමට ඔහු අපූරු තෑග්ගක් ගෙනැවිත් තිබුණි. ඒ කුඩා ලස්සන මුදුවකි. හරියට.... මටම ගත්තා සේ එය මගේ ඇඟිල්ලට මනාව ගැළපුණි.

"මං දැං මේ මුද්ද දාගෙන ගෙදර යන්නෙ කොහොමද"

මට ප්‍රශ්නය වුයේ එයයි. එසේ මිස හාපුරා කියා ආදරයක් පටන් ගැන්ම නොවේ.





# දෙවැනි ගිනිදළුව

ප්‍රඃ තමන් තමයි මේ නඩුවේ පැමිණිලි කරු.....

උඃ එසේය ස්වාමීනි.

ප්‍රඃ තමන්ලා විවාහ වූයේ කවදාද?

උඃ 93 මැයි 4 දින

ප්‍රඃ මෙම විවාහයෙන් තමන්ලාට දරුවන් ඉන්නවාද?

උඃ ඔව් එක දුවක් ඉන්නවා

ප්‍රඃ ඇගේ නම මොකක්ද

?ඃ අසනි ආශ්චර්යා තැන්නෙකුඹුර

ප්‍රඃ දැන් මේ විවාහයෙන් පසු තමන්ලා විවාහ ජීවිතය සතුටින් ගත කළාද?

උඃ ඔව් අවුරුදු නවයක් පමණ සතුටින් ගතකළා. මගේ බිරිඳ ගුරුවරියක ලෙස සේවය කළා.... ඒ වන විට ඇය අනියම් සම්බන්ධයක් පවත්වන බව මට හැඟී ගියා... ඇය රාත්‍රියේදී පවා යම් යම් අය සමඟ දුරකථන සංවාද පැවැත්වූවා. ඇගේ අනියම් පෙම්වතුන් සමඟ

ප්‍ර: ඔබ ඒ අයගේ දුරකථන සංවාද බව දන්නෙ කොහොමද?

උ: ඇය ඉතාම හිමින් ආදර බස් දොඩනවා මට ඇහුණා. මම ඇයට අවවාද කළා... ඒ අවස්ථාවලදී ඇය මා සමග රණ්ඩුකළා.

ප්‍ර: ඔබ ඇයට අවවාද කල බව කීවා එය සාර්ථක වුණාද?

උ: ඇය පිලිගත්තේ නැහැ

ප්‍ර: ඉන් පසුව මොකද වුණේ?

උ: ඇය මාත් සමග තිබුණ සියලු අඹුසැමි සම්බන්ධතා නතර කළා.... ඇය මාත් එක්ක එකට ජීවත් වෙන්න බෑ කියලා... ඇගේ කාමරයේ ගොස් සමග වෙනම ජීවත් වුණා.

ප්‍ර: එදා සිට මේ දක්වාම වෙනමද ජීවත් වෙන්නේ....?

උ: ඔව්.

ප්‍ර: ඉන්පසුව මොකද වුනේ?

උ: 2011 වසර වන විට ඇය තරුණයෙකු සමග සම්බන්ධයක් පවත්වන බව මට හැඟී ගියා.

ප්‍ර: කවුද ඒ තැරණයා?

උ: ඔහු... චානුක... මගේ දුවගේ පෙම්වතා.





## 2

අවුරුදු ගණනක් ප්‍රේමකල අප දෙදෙනා අවසානයේ අපගේ ප්‍රේමයේ කිරුළ පැළඳ විවාහයෙන් බැඳුණෙමු.

ඒ වන විට අපගේ මහගෙදර විකුණා සහෝදරයින් අතරේ කොටස් බෙදන්නට තිරණය කර තිබුණි. කංචනගේ මහගෙදර පදිංචි වීමටද හැකියාවක් නොමැති නිසා මට පාසලට යාමට ඒමටත්, කංචනට රැකියාවට පහසුවටත් අපි බත්තරමුල්ලෙන් කුඩා ඇනෙක්සියක් කුලියට ගෙන ජීවත් වුණෙමු.

පතිනි ලෝකයට පය තැබුවත් මම විවාහ ජීවිතය ගැන මෙලෝ හසරක් නොදන උන්නෙමි. පාසල් යන කාලයේ මා කවින්ද සමග නරක සම්බන්ධතාවයක් පැවැත්වූ බවට ඔහුම කටකතා ගොතා පල කරත්... එහි තේරුමවත් මම හරිහැටි නොදන උන්නෙමි.

"ඇත්තටම ඔයා හොඳ ළමයෙක්නෙ..."

කංචන මා සිප එසේ කීවේ අපේ මධුසමය දිනයට පසුදාය. එහෙත් මට ඒ ගැන වගක් නොවීය.

"ඔයා හිතාගෙන හිටියෙ අර කවින්ද කිව්ව කතාව ඇත්ත කියලද..."

"සැක කරා තෙමෙ... ඒත් මටත් ඒ කතාව ආරංචි වුණා."

"දැන් ඉතින් ඒ සේරම ඉවරනෙ... අපි සන්තෝසෙන්... ජීවත් වෙමු..."

මම ඔහුගේ කරමත මුහුණ හොවාගෙන පතිනියකට උරුම වන සොඳුරු ලෝකය ගැන සිහින දැක්කෙමි.

"හැබැයි ඉතිං අපි දෙන්නගෙ මේ රස්සා දෙකෙන් නම් ගොඩ එන්න බැරිවෙයි....සන්තෝසෙන් ඉන්න සල්ලිත් තියෙන්න ඕන...."

කංචන කීවේය. ඇත්තටම කංචන සල්ලිකාරයෙකු නොවීය. ඔහු කලේ පෞද්ගලික ආයතනයක සාමාන්‍ය ලිපිකරු රැකියාවකි. නමුත් මගේ හිත ටිකක් රිදුණි. කංචන මගේ දෑවැද්දක් බලාපොරොත්තු වෙනවාද යන සැකය මගේ හිතේ විය.

"අපේ මහගෙදර විකුණපුහාම නම් අම්මගෙ කොටස මට ලැබෙයි...."

මීට පෙර කංචනත් මාත් එවැනි දෙයක් ගැන කතා කර නැත.

"අනේ මම ඒවා ගැන ඇහුව නෙවේ උදානි... ඒත් ඉතිං දැං අපි වෙනම ජීවත් වෙන්න ගියාම... ප්‍රශ්න...."

මට නම් තිබුණ ලොකුම ප්‍රශ්නය වූයේ තේ කෝප්පයක්වත් හරියට හදාගන්නට නොදන්නා කමයි. බතක් උයන්නට දන්නේම





නැත. උත්සාහ කර අවසානයේ සිදුවූයේ අප දෙදෙනාටම කඩෙන් කන්නටය. වැරදීම් යනු අත්දැකීම්ය. ඔත දුවවාගෙන නොයෙකුත් අනතුරු කරගෙන අවසානයේ මම හරියට ගණනට වතුර තබා බතක් උයන්නට පුරුදු වුණෙමි. සම්බෝලයක් කොටා ගන්නට, පරිප්පුවක්, අල හොද්දක් හදාගන්නට මට කියාදුන්නේ ජීවිතයමයි.

"දැනි හිතෙනවද, ගෙදරම හිටිය නම් හොඳයි කියලා...."

කංචන එසේ අසනවා මිස මට පොල් බෑයක්වත් ගා දෙන්නේ නැත. ඔහු කන ඉඳුල් පිඟානත් මවිසින්ම සේදිය යුතුවිය. එනමුදු මේ මගේ විවාහ ජීවිතය බවත් මගේ සැමියාට මවිසින් ඉටු කල යුතු යුතුකම් රාශියක් ඇති බවත් මම හිතන්නට පුරුදු වුණෙමි. එසේ මිසක විවාහ ජීවිතය මේ යයි පහදා දෙන්නට කෙනෙකු සිටියේ නැත.

මා සිතූ තරමින්ම කංචන මට ආදරය නොකල බව මාස දෙක තුනකදී මට වැටහුණි. සමහර විට මා වැරදිද කියන්න මා දන්නේ නැත. උපුල් තරමට ඔහු මට සමීප නොවිය. උදේට තනිවම කෑම පිසුවේ මාය.

"කංචන..... අනේ හොඳටම පරක්කුයි... මේ තේක බිල ටිකක් උදව් කරන්නකො..."

පාන්දර මා ඔහු අතට තේ කෝප්පය දී කුද්දමි.

"අයියෝ මට නිදිමතයි"

"ඔයා වගේ කම්මැලියෙක්"

"කම්මැලි ඔයානේ... ගෙවල්වල ගෑනු තමයි උයන්නෙ... ඔයාලගෙ ගෙදරත් ලොකු තාත්තද උයන්නෙ?"

ඔහු ඇසූ ප්‍රශ්නය මට දැඩි පහරක් විය. ලොකු තාත්තා

කුස්සියේ ගිනි පිඹිමින් උයනවා මා කෙදිනකවත් දුක නැතත් මාළු ගෙනා විට මස් ගෙනාවිට කපා සුද්දකර දුන්නේ ඔහුය. කොස් ගෙඩි කපා මදුළු ගලවා දුන්නේ ඔහුය. පොල් ලෙලි ගසා දුන්නේත්, දර කොටත් පලා දුන්නේත් බොහෝ විට ඔහු විසිනි.

කංචනගේ මුළු පඩියම ණයට කැපුණේය. ඔහු කිවේ විවාහ උත්සවයට ණය ගත් බවය. ඒ ගැන සොයන්නට බලන්නට තරම් මා මෝරා තිබුණේ නැත. මටත් ඕනෑ වූයේ ඔහුගේ ඇගේ එල්ලීගෙන මේ ජීවිත ගමන ගෙනයන්නටය.

සෑම ගැහැනියකම ආදරණීය පිරිමියෙකුගේ හව්හරණය බලාපොරොත්තුවෙයි. තම ජීවිතයේ සියළු තීරණ ගැනීමට ඇය ඒ පිරිමියාට බාර කරන්නේ දෙවරක් නොසිතමිනි.

මා ද එසේය. මම මගේ ආදරණීය කංචනට මගේ ජීවිතය බාර කළෙමි. මා ඔහුගෙන් බලාපොරොත්තු වන දේවල් වැඩිදැයි සිතෙන තරමටම මම ඔහු ගැන සිතුවෙමි. එහෙත් මා ඔහුට දුන් ආදරය ඒ විලසින්ම මට ආපහු ලැබුණේ නැත.

"උදානි... ආ... මේ සල්ලි තියාගන්න"

ඔහු මාසික වේතනය ගත් පසුව මා අතට මුදල් දුන්නේ නිවසේ අඩු වැඩිය පිරිමසා ගැනීමටය. ණය කැපී එන විට ඇත්තෙන්ම ඒ මුදල සතියක්වත් ජීවත්වීමට පුළුවන්කමක් තිබුණේ නැත.

"උඹ දුක් විදිනවද මන්දා...."

දිනෙක මා ළිඳෙන් වතුර ඇදගෙන ගෙනෙනු දුටු ඉරෝමී පැවසුවාය. ඉරෝමිද ගුරුවරියක ලෙස සේවය කිරීම නිසා මට නිරතුරු මුණගැසුණි

"මේක මගේ ඇඟ බහින්නත් එක්ක හොඳයි"





මම මගේ නැතිබැරිකම් සඟවා ගතිමි. ඇතුළත ගිනි පිටතට නොදී ඒවාත් පපුව තුලට දමාගෙන හළු කල යුතුය යන්න මම ඉගෙන ගතිමි. ජීවිතය දැනෙන්නේ දැන්ය. එය හරියටම අහසින් පොළොවට වැටුණා සේය.

"අනේ... එහෙම කියලා... මීට වඩා පහසුකම් තියෙන ගෙයක් හොයාගන්න බැරි වුණාද? මහපාරටත් පයින් යන්න ඕන ලොකු දුරක්..."

"අපට පුළුවන් විදිහ තමයි ඉරෝමී මේ."

"කී දෙනෙක් උඹත් එක්ක යාළු වෙන්න ආවද"

"කී දෙනෙක් ආවත්.... අන්තිමට එනවා ඉරණම්කාරයා... අර ඔක්කොම පරද්දලා එයා අරගෙන යනවා... එතකොට ඉතින් දුක හරි සැප හරි විඳගන්න ඕන..."

"මට නම් හිතාගන්නවත් බෑ...."

ඉරෝමී මා ගැන පුදුම වූවාය. රාජගිරියේ මහගෙදර මිදුලින් එළියට බහිද්දී මහා පාරය. ළිඳෙන් වතුර පොම්ප කර තිබුණි. නාන කාමර තිබුණේ ගෙතුලමය. එහෙත් ලොකු අම්මා අපට බටර් විස්කෝතු කා තේ බොන්නට කිරි හොදි සමඟ බත් කන්නට පුරුදු කළේ කවදා හෝ මේ ජීවිතය විඳගන්නට ශක්තිය දෙන්නට වග මට සිතුණේ පසුවය.

"කංචනට තිබුණ මීට වඩා පහසුකම් දෙන්න...."

"මොන පහසුකම්ද ඉරෝමී.... එයාගෙ පඩියම වගේ ණයට කැපිලා යනවා... මේ රෝල ගහන්නෙ මගෙ පඩියෙන්..."

"ඇයි කංචනගේ අම්මලගෙ ගෙදර ඉන්නෙ නැත්තෙ...."

"කංචනගේ නංගියි, ඒ පවුලයි. අම්මලයි ඔය ඔක්කොම එකට කැඳහැලිය වාගෙ... ඇත්තම කියනවනම් මට කැපිලිකෙටිලි

ඉවරයක් නෑ.. ඇණුම් පද වුණත්... මම උයන්න දනගෙනවත් හිටියෙ නැනේ...."

මම ඉරෝමිට තේ කෝප්පයක් වත් කර දුන්නෙමි. වරෙක මගේ ඇසට කඳුළු එයි. විවාහය පැමිණෙන්නේ වාසනාව රැගෙනය. නොඑසේ නම් පෙර කළ පව් සියල්ලම එකතු කරගෙනය.

"ඒව නම් මල විකාර... කසාද බඳින්නෙ උයාගෙන කන්නයැ."

ඇත්තම කියනවා නම් මා කඩෙකින් බඩුවක් ගන්නවත් දන උන්නේ නැත. ජීවිතය මේ ආකාරයෙන් මාස කිහිපයක් ගෙවා දැමීය.

මා අසනීප වුයේ හිටිගමන්ය. බොහෝ රෑ වී නිවසට පැමිණෙන කංචන කෑම කා නිදාගනියි. එතෙනින් එහා ඔහුට මගේ දුකක් සැපක් බලන්නට වෙලාවක් ඇත්තේ නැත. මගේ අතට කීයක් හෝ දීම සැමියෙකු විසින් කල යුතු එකම යුතුකම ලෙස ඔහු සිතුවා විය හැකිය.

"උදානි.... උදානි...ඔයාට මොකද මේ...?"

කවරෙකු හෝ මගේ මුව දෙපැත්තට සෙමෙන් තට්ටු කරද්දී මා නානළිඳ ළඟ වැටී හිටි බව මට මතක් විණි. කංචන මාව ත්‍රීවිලරයක දමාගෙන යන හැටි මට යන්තමට මතකය.

"ලේ ගිහින් තිබුණා.... මම වැඩ ඇරිලා එනකොට...ළිඳ ළඟ වැටිලා හිටියා... සිහිය තිබුණෙ නෑ...."

කංචන වෛද්‍යවරයාට කියන හඬ ඇසෙයි. මට මහා දරාගත නොහැකි වේදනාවක් දනෙයි.

"මෙයා ප්‍රෙග්නන්ට් වෙලා තියෙනවා."





කංචනගේ ඇස් උඩ යනු මම බලා සිටියෙමි.

"දන් බබා ගිගිල්ලා... එච්චර දෙයක් ඔයාලා දනගෙන ඉඳලා නැත්තේ ඇයි? දන් වයිෆ්ව ඔපරේෂන් එකකට ගන්න වෙනවා... කැමතියි කියල අත්සන් කරන්න."

මට වූ දේ මට හිතාගන්නටත් නොහැකි විය. මාස දෙකක ගැබිණියකව සිටියත් මට එය දැණුනේ නැත. සිරුරේ යම් යම් අමාරුකම් දැණුනත් ඒවා කියන්නට කෙනෙක් හිටියේ ද නැත. රාත්‍රියේ නිදාගන්න බලාගෙන ගෙදර එන කංචනට මගේ කන්කෙඳිරි ඇසුණේත් නැත.

මට මේ වෙන්නට යන්නේ කුමක්ද? මා මැරෙන්නට යන වග මට දනෙයි... මා වටා කොළපාට ඇඳගත් පිරිසක් රොක් වී ඇත. මා දන් සැහැල්ලුය. එය පුදුම උත්දකීමකි. මා සැහැල්ලුවෙන් පියාසලන හැටි මට දනෙයි. මගේ සිරුර කපන කොටන අතරේ වෛද්‍යවරුත් හෙදියනුත් මහා කළබලයකය. මැදිවියේ වූ කාරුණික වෛද්‍යවරයා... මගේ කම්මුල දෙපැත්තට තට්ටු කරන හැටි මට පෙනෙයි. මා දන් ඉන්නේ ශ්‍රී මහා බෝධිය ළඟ අවකාශයේ කැරකි කැරකීය. වළාකුලු මත සළු විහිදාගෙන සිටින දෙවිවරු මට අඬගසති. සමහරු යන්නට යයි කියති... ගත යුතු තීරණය කුමක්දැයි නොතේරෙයි... මාගේ සැහැල්ලු බව ක්‍රමයෙන් තුරන් වි, බර, වි බර වී අවුදින් මම යළිත් සිරුරට රිංගා ගතිමි...

"දන් හරි... බය වෙන්න දෙයක් නෑ...."

වෛද්‍යවරයා කියනු මට ඇසිණි......

❋ ❋ ❋ ❋ ❋

වේදනාව මට දනෙන්නට ගත්තේ වාට්ටුවට දමූ පසුවය. ඊටත් වඩා හිතේ තිබුණේ පසුතැවිල්ලකි. අහිමිව ගියේ දරු

සම්පතක් නොවේද? අපට අප ගැන මීට වඩා සැලකිල්ලෙන් උන්නා නම්... ඒ දරුවා රැක ගැනීමට තිබුණි. කංචන මගේ ළඟ මගේ හිස පිරිමදිමින් සිටියේය.

"අනේ කංචන.... අපේ දරුවා..... එයා... ගියා නේද කංචන..."

ඒ වන විටත් කංචනගේ මුහුණේ තිබුණ බිය, කළබල බව පහව ගොස් තිබුණේ නැත.

"ඔයාට..... දැන් අමාරුව අඩුයිද?"

"තාම රිදෙනවා... ඉවසන්න බෑ. ඒත් ඊට වඩා දුකයි."

"එයා යන්න ආපු කෙනෙක් වෙන්නැති උදානි... අනුන්ගෙ ගෙවල්වල ඉඳගෙන අපි කොහොමද ළමයි හදන්නෙ....?"

"අනේ..... ඔය පාරවල්වල දූවිල්ලෙත් ළමයි හැදෙන්නෙ....."

මම ඔහුගේ අදහසට විරුද්ධ විමි. පහුවෙනිදා මට ගෙදර යාමට අවසර ලැබුණේ උපදෙස් රාශියක්ද සමඟය. මැදිවියේ වෛද්‍යවරයා මගේ ඇඳ ඉහපත පරීක්ෂා කර මා ළඟට ආවේය.

"අද පහට උදානිට ගෙදර යන්න පුළුවනි. ඔයා ගිහින් ආපු කෙනෙක්..... පස්සෙ කාලයක ඔයාට ඒක තේරෙයි පුතා... "

ඔහු කී දෙය මට වැටහුනේ නැත. මා ගියේ කොහාටද ආවේ කොහාටද යන්න ගැන මට තේරුමක් නොවිය.

* * * * *

නැවතත් අපේ සුපුරුදු ජීවිතය බත්තරමුල්ලේ කුලී නිවසෙහි ආරම්භ විය. වටේටම තිබුණේ කඩොලානය. වහින විට පොළොව





මඩ වෙයි. යාන්තම් ටකරං සෙවිලි කර ගඩොලින් බැඳ තිබුණ එම නිවසට තිබුණ එකම පහසුව විදුලිය පමණි. කංචන මෙම නිවස තෝරා ගන්නට ඇත්තේ නිදහසේ ජීවත්වීමටත්, කුලිය අඩු වීමත් හේතුවෙන් විය යුතුය.

"මං දන්නවා... ඔයා බබෙකුට ආසයි කියලා. ඒත් මේ ගෙදර බබෙක් හදන්න බෑ උදානි"

කංචන මාව තේරුම් ගෙන කතා කලේ තවත් අවුරුද්දක් පමණ ගෙවී ගිය තැනය. කෑම, බීම, ගෙවල් කුලී, විදුලි බිල ආදියටම මගේ වේතනය හිලව් වී යද්දී මට සාරියක් මිලට ගන්නවත් වත්කමක් නොවීය. ආදරය ප්‍රකාශ කරද්දී මගේ ඇඟිල්ලට මුද්දක් දමූ ඔහුට ඉන්පසු මා ලස්සනට ඇඳිය පැළඳිය යුතු වගක්ද අමතක වී තිබුණා සේය.

"ඔයාට අපේ මහගෙදර ඉන්න කැමති නම් ඇත්තටම මෙහෙම දුක් විඳින්න වෙන්නේ නෑ....."

කංචන තම පවුලට පුදුම විදියට බැඳුණ කෙනෙක් විය. ඔහු වැඩ ඇරී කෙලින්ම යන්නෙ තම මව හා පියා බලන්නටය. මුලදී එය ඉවසන්නට පුරුදු වුවත් ටික ටික කල් ගත වෙද්දී... මට එය දරා ගත නොහැකි විය.

"අම්මා මට පර්චස් දහයක් වෙන් කරල තියෙන්නෙ... අපිට ඒකෙ ගේ හදාගන්න පුළුවන් නම්....."

මට අළුත් බලාපොරොත්තු ඇතිවිණි.

"අපේ මහ ගේ තාම විකිණිලා නෑ. මම හෙට දිහාට ගිහිල්ලා බලාගෙන එන්නම්"

"එහෙම සල්ලි ටිකක් හම්බවෙනව නම් හොඳයි... අපිට ඉක්මනට ගේ හදන්න පුළුවන්...ඔයාගෙ ඔය හීනෙත් ඉක්මනට ඇත්ත වෙයි."

"හීනෙ මගෙ විතරද...?"

"නෑ.... නෑ... මගෙත් හීනෙ ඒක තමයි. ඉක්මනට තාත්තා කෙනෙක් වෙන්න."

කංචන වෙනදාට වඩා සතුටින් මගේ වත සිපගනිමින් කීයේය. වැරැද්ද මගේය. කුඩා කල සිටම මා හොඳින්ම දන්නා පිරිමියා වූයේ උපුල් නිසා මා උපුල්ගේ ගතිගුණ මගේ සැමියාගෙනුත් අපේක්ෂා කළා විය යුතුය.

❋ ❋ ❋ ❋ ❋

"මොකද කංචනට මෙච්චර උවමනාව මේක විකුණ ගන්න....?"

ලොකු අම්මා කතා කළේ තරමක අමනාපයෙනි.

"අපිට ගෙයක් හදාගන්න ලොකු අම්මෙ. එයාගේ ඉඩම් කෑල්ලක් තියෙනවා ඇතුල්කෝට්ටේ. එයාටයි නංගිටයි දෙකට බෙදිලා යන පර්චස් විස්සක කෑල්ලක්...."

"ඒකත් එහෙමද... කෝ ඉතිං මේකට හොඳ ගාණක් අහුවුණේ නැනෙ. මේ ඉඩම කොච්චර වටිනවාද.... හැමෝම කුණු කොල්ලෙට ඉල්ලන්නෙ...."

ලොකු අම්මා මා විඳින දුක් දන්නේ නැත. මගේ ප්‍රේමය මා ජයගත්තේ අසීරුවෙනි. ලොකු අම්මලා මගේ ප්‍රේමයට එතරම් කැමැත්තක් දක්වූයේ නැත. ඔවුන් මාව දෙන්නට හෙව්වේ දොස්තර කෙනෙක්, ඉංජිනේරුවෙක්, නීතිඥයෙක් වැනි වැදගත් වෘත්තියක යෙදෙන්නෙකුටය.

එනමුත්.... මා කංචනම ඕනෑ බව කියා සිටි නිසා ලොකු අම්මා අකමැත්තෙන් වුවද එයට කැමති වූවාය. විවාහ උත්සවය වෙනුවෙන් සියලු වියහියදම් කළේ ඇයය.





"උදානි බය නැතිව ඉන්ඩකො... අපි කළබල නොවී හොඳ ගැනුම්කාරයෙකුට දෙමු..."

ලොකු තාත්තා කීවේය. අක්කලාද අයියාද විවාහ වී සිටි නිසා මහ ගෙදර උන්නේ ලොකු අම්මාත් ලොකු තාත්තාත් පමණය.

"එක අතකින් දුකත් හිතෙනවා ලොකු අම්මෙ.... මේ ගේ ඇතුලෙ... අපි මොන සැපක් වින්දද කියලා දන් තමයි තේරෙන්නෙ...."

"කමක් නෑ... දන් ඉතිං ගිය දේ ගියාවෙ. දතේ ඇඟිලි හැම එකම සමාන නැතේ.... දෙන්න ආදරෙන් ඉන්නට නම් එච්චරයි...."

ලොකු තාත්තා කීවේය. අප අතර ආදරය තිබුණේ විවාහයට පෙරය. චොකලට්, මුදු, රෝසමල්, හාදු හුවමාරු කරගත්තේ පෙම්වතුන්ව හිටි කාලයේදීය.

ත්‍රී වීලරයකවත් යන්නට සල්ලි නැති නිසා මම බස් නැවතුමට බිත් හිටගෙන උන්නෙමි. බස්වල පුදුම සෙනගකි. පුදුම තරඟයකි. මේ බස්රියක් ඇතුලේ මිරිකෙනවාට වඩාපයින් ඇවිදගෙන යාමත් සුදුසුය.

"උදානි... ගෙදර යන්නද?"

මා අභියස නැවැත්වූ කාරය නිශාන්ත අයියාගේය. නිශාන්ත කංචනගේ නංගිගේ සැමියාය.

"ආ... ඔව් අයියෙ... අයියා මේ..."

"මං යන ගමන මොකටද? නගින්නකො ගේ ළඟින් බස්සවාගෙන යන්න....."

මම ඉදිරි අසුනට නැගුණෙමි. මහ ලොකු දුරක් යන්නට

නැති මුත් බත්තරමුල්ල හංදියෙන් බැස කිලෝමීටර් තුන්කාලක පමණ වූ දුරක් පයින් යා යුතුය.

"තාම හොඳ ගෙයක් හම්බුණේ නැද්ද?"

ඔහු මගෙන් විමසුවේය.

"නෑ අයියෙ... එක පාරම වගේ ගෙයක් හදන්න හිතාගෙන ඉන්නෙ. මටත් සල්ලි ටිකක් ලැබුණම"

"ඔයාගෙ දෑවැද්ද....?"

"අපේ මහගෙදර විකුණුවාම අම්මගෙ කොටස මට හම්බෙනවනෙ... ඒකෙන්"

"අපිත් මේ බලාගෙන ඉන්නේ ගේ හදන්න තමයි... මං ලෝන් එකක් දාලා තියෙනවා..."

ඔහුට ගෙයක් හදන්නට ඇති උවමනාව කංචනට නැත. කංචනට අවශ්‍ය තම දෙමාපියන් ළඟ හුරතල් වෙවී සදාකල්ම ඉන්නටය. විවාහයේදීද ඔහු පතන්නේද අම්මා වැනිම බිරිඳකැයි මට දැන් සිතේ. මේස් එකේ සිටම සියලුම ඇඳුම් සෝදා දිය යුතු වෙයි. තේ බිව් කෝප්පයේ සිටම ඉඳුල් භාජන මවිසින් සේදිය යුතු වෙයි. මේ ගෙවන ජීවිතය ඇත්තෙන්ම මට හුරු වූවාක් නොවේ.

"කොහෙද ඉතින් ඔයා වගේ දුවල පැනල වැඩ කරන්න අපේ රුවන්තිට පුළුවන්කමක් නැනේ... එයා කරන්නෙ ඔහෙ ගෙදරට වෙලා ඉන්නෙක... ඔයා වගේ ගෑනියෙක් මට හම්බුණා එහෙම නම් මං මෙලහකට මිනිහෙක්...."

මම ගැස්සී ගියෙමි. නිශාන්ත අයියාගෙන් මම එවැනි විශේෂත්වයක් බලාපොරොත්තු නොවුණෙමි.

"නිශාන්තයියා මොනවා කියනවද මන්දා...."





"ඔයා හරිම ෂෝක් කෙල්ලෙක් උදානි... කංචන ලක්කාරයා... ඒකයි මං කියන්නෙ...."

"ඔන්නොය ඔතනින් මාව බස්සන්න."

"ගෙදරට අඬගහන්නෙ නැත්තේ තේ එකක්වත් දෙන්න වෙයි කියලද?"

"නෑ... සීනි, කිරිපිටි තියෙනවද කියල ෂුවර් නැති හන්ද.... තැන්ක් යූ... මගෙ බස් ගාස්තුව ඉතුරු කරාට"

මම එසේ කියමින් ගේ ළඟින් බැස ගත්තෙමි.

"තේ එකක් බොන්න වෙන දවසක එන්න... දැන් හදිසි ගමනක්නෙ යනවා ඇත්තෙ"

මා නැවතත් කිවේ තේ බොන්නට අඬගැසීමෙන් මා තව තවත් අපහසුවට පත්වන නිසාය. නිශාන්ත කාරය හරවාගෙන ගිය පසු මම ගෙට ගොඩවුණෙමි.

"මේ වාගෙ පරෙවි කූඩුවක මං දුක් විඳින හැටි....."

මට සිතුණි. එහෙත් කංචන වෙනුවෙන් මම ඒ සියලුම දේ උසුලා ගත්තේ අනාගතය වෙනුවෙන් ලස්සනම ලස්සන හීන රැසක් හිතේ දරාගෙනය.

දරුවාවත් කුසේ පණ ගැහුණා නම් මේ වන විට මාස කිහිපයක ළදරුවෙක් ඉන්නට තිබුණි. ඒ සිදුවීමත් සමගම මම බොහෝ සෙයින් කළකිරුණෙමි. බාහිර ලෝකය ගැන මගේ දැනුම පැවතියේ ඉතා අඩු මට්ටමකය. මා ගර්භනී වූ බවවත් මට නොදැණුනේ ඇයි.....

ඉන්පසු රෝහලෙන් ඒ පිළිබඳව මා දැනුවත් කෙරිණි. එනමුදු දිගින් දිගටම කංචන විසින් යලිත් දරු උපතක් ප්‍රතික්ෂේප කෙරුණි. ඒ වෙනුවට අප්‍රමාණ හේතු දක්වන්නට ඔහුට පුළුවන්

විය.

"බබෙක් ඉන්නව නම් එයාව බලාගන්න ඔයාට රස්සාවෙන් අස් වෙන්න වෙනවා. මගේ ණය ටික කැපිලා යනකංවත් අපි ඉවසමු....."

ඔහුට කියන්නටත් සාධාරණ හේතු ඇත. මවක වීමේ සිහිනය සෑම ගැහැනියකටම පොදු වූ නමුත් මම ඒ ආසාවත් අනාගතයට භාර කලෙමි.

* * * * *

මගේ දියණිය ලැබුණේ ඊටත් අවුරුද්දකට පමණ පසුවය. අසනි ආශ්චර්යා තැන්නෙකුඹුර යන නම අපි ඇයට තැබුවෙමු.

"අපි අම්මලා ළඟට යමු...."

කංචනගේ යෝජනාව වූයේ එයයි. බත්තරමුල්ලේ නිවසේ අපට කොහෙත්ම පහසුකම් නොතිබිණ.

මහගෙදර රුවන්ති නංගිත් නිශාන්ත අයියාත් උයාගෙන කෑවේ වෙනමමය. අම්මාත් තාත්තාත් උයාගෙන කෑවේ වෙනමමය. දරු ප්‍රසූතියෙන් තුන්වන දිනයේ මට නැන්දම්මාගෙන් කෑම නොලැබිණ.

"උදානි... උයාගෙන කන්න...."

නැන්දම්මා කිවාය. ඒ වන විට රුවන්ති නංගීටද දරුවෙකු ලැබී තිබුණි. ඒ පුතෙකි. පුතෙක් වූ නිසා ඒ දරුවාට නැන්දම්මාගෙන් අපමණ සැළකිලි තිබිණි. අසනි ගැන වගේ වගක්වත් ඇගේ ආච්චි අම්මාට නොතිබිණ.

"උදේනි, කිරි පොවනවා... පොවනවා ළමයත් ලොකු වෙනවා බතල ගෙඩිය වාගෙ... ඒත් බබා ඔළුවවත් උස්සන්නෙ





නැහැ..."

නැන්දම්මා කියන දේවල්වලින් මගේ හිත රිදුණි. එකම ගෙදර එකම කුස්සියේ ලිප් තුනක ගිනිදැල් දල්වෙයි. එකම පවුලක් වුණත් බත් මුට්ටි තුනක් ඉදෙයි.

"කසාද බැන්ද නම් ළමයි වැදුව නම් හදන්ඩත් එපායැ..."

නැන්දම්මා කීවේ එපමණකි. එසේ නමුත් රුවන්ති නංගීගේ පුතාව අතින් බිම තබන්නටවත් ඇයට විවේකයක් නොවිය. තම දියණියගේ පුතු ළයට ළං කරගෙන හැදූ ඇය මගේ දියණියට කිසිදු සැළකිල්ලක් නොදක්වූවාය. මම ඒ ගැන ඇයට දොස් නොකීමි. කංචනට වුවද කිසිවක් නොකීමි. එහෙත් කංචන හැසිරුණේත් මා ගැනවත්, දරුවා ගැනවත් හැඟීමක් නැති අයෙකු ලෙසිනි. දරුවාගේ අවශ්‍යතාවලට පුරුදු පරිදි මා අත මුදලක් පමණක් මිට මෙලෙව්වේය.

"මේ ළමයා හැරෙන්නේ පෙරලෙන්නේවත් නෑ.. රුවන්තිගෙ ළමය මුනින් පෙරලිලා දූන් ඉඳගන්නත් හදනවා...."

නැන්දම්මා කියයි

"මන්දබුද්ධිකද කොහෙද...."

ඇගේ වචන... මගේ ළය පසාරු කරගෙන ගියේය. තම දරුවා මන්දබුද්ධික යයි කියනු කුමන මවකගේ කණට මිහිරක් වේද? පසුවදාම මම දරුවා වඩාගෙන සොයිසා රෝහලට දිව්වෙමි. ළමා රෝග පිළිබඳ විශේෂඥවරයා හමුවීමට බොහෝ වේලාවක සිට රැඳී සිටිය යුතු විය. ඒ වන විටද මමද අඩා හෙම්බත්ව සිටියෙමි.

"ඩොක්ටර්... මගෙ දරුවා මන්දබුද්ධිකද?"

මා ඇසුවා නොව මට ඇස්සවිණ.

"කවුද එහෙම කියන්නෙ?"

"මගේ නැන්දම්මා ඩොක්ටර්..."

"නැන්දම්මා ඉගෙන ගත්තෙ මොන වෛද්‍ය විද්‍යාලෙද?"

මම නිරුත්තර වීමි. එහෙත් වෛද්‍යවරයාගේ පැහැදිලි කිරීම මගේ සැනසිමට හේතු විය. දරුවා හොඳින් පෝෂණය වීම නිසා වර්ධනය වේගවත් වූ බැවින් ඇය ක්‍රියාශීලී නොවී සිටීම හැර වෙන වරදක් නැත.

"ළමය.... නියම කාලෙට පෙරලෙයි ඉඳගනියි.... දණගායි... ළමයගෙ ප්‍රශ්න අම්ම ඔළුවට ගන්න එපා."

මම සැනසුණෙමි. හිතේ තිබූ මහා මේරුවක් ගිලිහී ගියාක් මෙන් මට දැණුනි. ගිනි අව්වේ දරුවා කර පින්නාගෙන මම ගෙදර ආවෙමි. අළුත් මවක දරුවෙකුට හුරුවන්නට මොන තරම් දුකක් විඳිය යුතුද? සමහර දිනවල නින්ද යන්නේ පාන්දර ජාමයේය. දරුවෙකු හදන්නට විඳින දුක මේ යයි මා කිසිදා දැන සිටියේ නැත.

අම්මා හිටියා නම් යයි මට සිතුණු වාර අනන්තය. විවාහ ජීවිතය තුල දුකක් මිස සැපක් නොමැති බව මට දැණුනි. සියළු ගැහැණුන්ට හිමි ගහැනු හදවත මටද හිමි බැවින් මම සියල්ල උසුලා ගතිමි.

එක් රාත්‍රියකදී අසනි බෙරිහන් දෙමින් හඬන්නට වූවාය. කංචනට නිදාගන්නට හැර මම ඌ එළිවන තුරුම නිදිමරමින් අසනිව නැළවූවෙමි. පාන්දර ජාමයේ මට නින්ද ගොස් තිබුණි. කංචන මාව කුද්දන්නේ නොමැතිව කාර්යාලයට යන්නට ඇත්තේ මා ගැන අනුකම්පාවෙන් විය යුතුය. ඔහුට බත්පත සකසා දෙන්නට බැරි වීම ගැන මම පසුතැවෙමින්ම කුස්සියට ආවෙමි.





"පුතා බත් අරන් ගියෙ නෑ අද.. කඩෙන් කන්නවත් සල්ලි තිබුණද මන්ද?"

මම දරුවා තොටිල්ලේ තබා කුසගිනි උහුලනු නොහැකිව වතුර කේතලය ලිප තබද්දී නැන්දම්මා කිව්වාය. ඌ තිස්සේ කිරි දෙමින් දරුවා නැලෙව්වද... වේලුණ තොලකට තෙමාගන්න තේ කෝප්පයක් හදා දෙන්නට කෙනෙකු සිටියේ නැත. මේ නිවසේ මිනිසුන් ඒ තරමට ආත්මාර්ථකාමීන්ය.

"ගෑනියෙක් වුණාම මොන දේ වුණත් ලිපේ ගින්දර පත්තු කරන්න ඕන...."

නැන්දම්මාගේ ඇණුම්පදවල ඉවරයක් නැත. ඇත්තෙන්ම උපන්දා සිට සැපපහසු ජීවිතයක් ගත කළ මට දුක කියා දෙයක් දැණුනේ නැත. හැමදේමට අතට පයට ලැබිණි. ඒ සියල්ල ඉවසා සිටින්නට දයාබර සැමියෙකුගේ ආදරය කරුණාව ලැබේ නම්.... කංචන යුතුකම් පමණක් ඉටු කරන සැමියෙකු යයි දැන් මට සිතේ. ඉඳහිටක මධුවිත තොල ගෑවද.. වෙනත් දුසිරිතකට නම් ඔහු හුරු වී සිටියේ නැත. එනමුදු පෙම්වතියකව සිටි කාලයේ මෙන්ම ආදරය මම ඔහුගෙන් අපේක්ෂා කළෙමි.

"උදානි අක්කෙ, අසනි ආයෙත් අඬනවා... ඌ තිස්සෙ මට නින්ද ගියෙත් නෑ මේ ළමයගෙ ඇඬිල්ල හින්ද..."

රුවන්ති නංගී පැමිණිල්ලක සේයාවෙන් කිවාය. ලිපේ බත ඉදෙද්දී මම වහා කාමරයට දුවගෙන ගියෙමි. අසනී අත්මිට මොලවමින්, අතපය ගසමින් නොනවත්තාම අඬන්නීය.

"රුවන්ති, අනේ ඔය බත් එක ටිකක් බලන්න...."

දරුවා බඩේ අමාරුවෙන් පීඩා විඳින වග දැනගත් මම ග්‍රයිප්වෝටර් බෝතලය ගෙන දරුවා වෙත ගියෙමි.

"අනේ මට මෙතන කුස්සියෙ ඉන්න බෑ."

රුවන්තිද එසේ කියමින් යළිත් කාමරයට වැදුණාය. මම බොහෝ අසරණ වී ඇති වග මට හැඟෙයි. ග්‍රයිප්වෝටර් පොවන තුරු තව කවුරුන් හෝ දරුවා හරහට අල්ලා ගත යුතුය. එහෙත් අසනී මෙතරම් බෙරිහන් දෙමින් හඬද්දීත් නැන්දම්මාවත්, රුවන්තිවත් නිකමටවත් ඇයිද කියා අසන්නට කාමරයට කර පෙව්වේ නැත.

හිත හිත ඉන්නට වෙලාවක් නැත. මම ග්‍රයිප්වෝටර් බෝතලයක් අරගෙන දරුවා කර පින්නාගෙන අල්ලපු ගෙදරට දිව්වෙමි.

"අනේ මාග්‍රට් ඇන්ටී..."

මට කියැවිණි. මාග්‍රට් ඇන්ටී මට කරුණාවන්තය.

"ඇයි උදානි... බලා හිටියෙ කෝ දෙන්න... ඔන්න මං අල්ලාගන්නම් ඔයා පොවන්න...."

ඇය දරුවා හරහට අල්ලා ගත්තාය. ටික වෙලාවකින් හීන් කෙඳිරියක් නැඟූ අසනී මාග්‍රට් ඇන්ටිගේ අතේම නිදන්නට වූවාය.

"මට ඇහුණා... ඊයෙත් මුළු රෑම වගෙ සැරින් සැරේ දරුවා ඇඬුවා නේද....?"

"අනේ ඔව් ඇන්ටි, මාත් පාන්දර වෙනකං ඇහැරලා එළිවෙන ටිකේ තමයි පැයක් විතර නිදාගත්තෙ. මේ දැන් තේ එකක් බීලා... බත ලිපේ තිබ්බා විතරයි..."

"උදානි විඳින දුකක්.... නන්දක්කාත් අම්මා කෙනෙක් නේද....?"

මාග්‍රට් ඇන්ටී සමඟ නැන්දම්මා හිත හොඳ නැත. ඒ මායිම් ප්‍රශ්නයකට විය යුතුය.





"වත්න ඔයාගෙ බත් එකද මන්දා රොස් වෙනවා...."

දරුවා මාග්‍රට් ඇන්ටී අතේම තබා මම වහා කුස්සියට දුවගෙන ආවෙමි. බත් එක රොස්වෙයි. නැන්දම්මා උන්නේ මාළු සුද්ද කරමිනි.

"කොහෙද ගියේ....?"

"අම්මෙ මේ බත් මුට්ටිය රොස් වෙනවා."

මම වහා ලිපෙන් බත් මුට්ටිය බෑවෙමි. රොස් සුවඳින් මුළු කුස්සියම පිරී ඇත. දැන් ඉතින් සිදුවන්නේ බඩගින්නේ ඉඳින්නටය.

"බත් මුට්ටිය ලිපේ තියලා ගෙවල් ගානේ කුණු කන්දල් හොයන්න ගියාම බත් මුට්ටිය රොස් වෙයි කියලා දැණුනෙ නැද්ද?"

"මං ගියෙ අසනිට බෙහෙත් ටික පොවාගන්න."

"ඇයි මේ ගෙදර කවුරුවත් නැද්ද ඔය ළමයට බෙහෙත් ටික පොවන්න? මට කීව නම් මං පොවන්නෙ නැද්ද. රුවන්තිට කීව නම් එයා බලන්නෙ නැද්ද"

"මෙච්චර මොරදිදී අඬන ළමයා අඬන්නෙ ඇයි කියලා බලන්න.... ඔය එක්කෙනෙක්වත් කාමරේට කර පොවලා බැලුවද? රෑ තිස්සේ අසනි ඇඬුවා... නිකමට කවුරුවත් ආවද....?"

මම වේගයෙන් කියා දැමීමි. ඉවසීමෙ සීමාවක් තිබේ. තැලෙන යකඩය ආචාරියා විසින් උඩපැන පැන තලන්නාක් සේ මා ඉවසන්නට ඉවසන්නට මොවුහු මාව පීඩාවට පත් කරති.

සියළු දුක් උහුලා..... අවසානයේ උහුලන්නට බැරිම තැන බිත්තරයක් බිඳී යන්නාක් සේ හදවත බිඳී ගිය විට එතැන් පටන් ජීවිතය වෙනස් වෙයි....

"උඹත් එක්ක මෙ ගෙදර ඉන්ඩ බෑ අපට... වහාම ගෙයක් කුලියට හොයාගෙන පලයං...."

නැන්දම්මා අවසාන තීන්දුව දුන්නාය. ඇගේ තීරණය අවසන් තීරණය වන අතර එය වෙනස් කිරීමට හැකි සමතෙක් මෙලොව නැත.

මම නැවතත් මාග්‍රට් ඇන්ටිගේ නිවසට ගොස් නිදා උන් අසනිව රැගෙන ආවෙමි. ඇඳුම මාරු කර ගත් මා දරුවාද වඩාගෙන නිවසින් පිට වුණේ ලොකු අම්මා බලන්නට යන්නටය.





# තෙවැනි ගිනිදළුව

ප්‍ර: ලක්ශානි රසාංගිකා කියන්නෙ කවුද?

උ: ඇය මගේ වැඩපොළේ සේවය කරන සේවිකාවක්....

ප්‍ර: මොන වගේ වැඩද කරන්නේ?

උ: ඇය පරිගණක ක්‍රියාකරවන්නියක්.

ප්‍ර: ඇය බෝඩිම් කාමරයක් සොයා දෙන්න කියලා ඔබට කිව්වද?

උ: ඔව්...

ප්‍ර: ඒ අනුව ඔබගේ ගෙදර ඇය නවත්තාගත්තා.

උ: මගේ කැමැත්තට නෙවෙයි ඇයව මගේ ගෙදෙර නවත්තා ගත්තේ. මගේ බිරිඳගේ කැමැත්තට

ප්‍ර: ඔබගේ ගෙදර කාමර කීයක් තියෙනවද....?

උ: දෙකක්

ප්‍ර: එක කාමරයක බිරිඳ සහ දියණිය?

උ: බිරිඳ, දියණිය සහ මම

ප්‍ර: නැහැ ඔබ කලින් කිව්වා වෙනම ජීවත්වන්නේ කියලා

උ: ඒ වසර දෙකකට පමණ කලින්

ප්‍ර: මම තමුන්ට කියනවා තමුන් සහ එම කාන්තාව එක කාමරයක. බිරිඳ සහ දියණිය තව කාමරයක....

උ: මම එය කිසිසේත්ම පිළිගන්නේ නෑ

ප්‍ර: ඒ නිසාම තමුන්ට යෝජනා කරනවා ඔබේ බිරිඳ ඇයව ඔබේ නිවසින් එළවා දැම්මා.





## 3

"ලොකු අම්මෙ....."

"අප්පේ උදානි... මේ ගිනි අව්වෙ පුතේ.. පොඩි එකිගෙ මූණත් රෝස පාට වෙලා"

පුරුදු ලෙසින්ම ඉර මද්දහන වෙද්දී මහ ගෙදර විමීනියෙන් දුම් දාන දර්ශනය කියපාන්නේ ලිපේ බත ඉදෙන බවය. මේ මහ ගෙදර අපි කොතරම් සතුටින් ජීවත් වුණාද? මට උපුල් සිහිගැන්වුණේ නිරායාසයෙන්මය. මගේ හදවත අඳුරාගත් එකම කෙනා ඔහු යයි මට සිතේ... අනේ උපුල් ජීවත්ව උන්නා නම් මගේ මේ හැම ප්‍රශ්නයකටම සරල උත්තරයක් ඔහු ළඟ ඇති හැටි මම දනිමි.

"අසනිට බඩේ අමාරුවක්..."

"ඉතින් බේත් ටිකක් ගත්තෙ නැද්ද..."

"යන්න කියලා තමයි හිටියෙ ලොකු අම්මේ... ඊට කලින්

සේරම නැති වුණා...."

මම සිද්ධ වූ සියල්ල ලොකු අම්මා සමඟ කීවෙමි.

"කංචනත් එක්ක මෙහෙ ඇවිත් ඉන්න"

ලොකු අම්මා දුන්න උත්තරයට මම කැමති නොවීමි. අද හෙට හෝ ගැණුම්කාරයෙකු ඉදිරිපත් වුවහොත් ගේ විකුණන්නට සිද්ධවීම එකකි. අනෙක් දෙය කංචනද එයට අකමැති වීමය.

"උදානි මොනවා හරි කාලා ඉන්න. ඉඳිආප්ප තියෙනවා කිරි මාළුත් එක්ක... ගමේ නෝනක්කාගේ දුව බබෙක් හම්බෙන්න ඉස්පිරිතාලේ.... උදේ ඒ කෙල්ලට යවන්න ඉඳි ආප්ප හැදුවා..."

මහගෙදර හැමදාම එහෙමය. ලිපගිනි දැල්වුනේ තමන්ටත් වඩා අනුන්ටය. එහෙත් කෑමක් මදිපාඩු වූ දවසක් තියා ගෙදර සිනි තේකොළ ඉවර වුණ දවසක්වත් මට මතක නැත.

"කාලා අපි යමු දරුව පෙන්නගෙන එන්න නර්සින්හෝම් එකට... කොයි වෙලාවෙත් දොස්තරලා ඉන්නවා...."

ලොකු අම්මාගේ කරුණාවට මගේ නෙතඟ කඳුලක් ඉපදිණි. බඩගින්නේ උන් මා කවදාවත් නැති පෙරේතකමකින් ඉඳිආප්ප විස්සක් පමණ ගිලගෙන ගිලගෙන ගියෙමි. ඊයේ රාත්‍රියේවත් මා කෑම කා උන්නේ නැත. දරුවා කිරි බොන විට බඩගිනි දැනෙයි. කංචන මා කෑවාද කියාවත් අසන්නේ නැත. මට කංචනගේ මේ වෙනස්වීම අදහා ගැනීමට නොහැකිය. එහෙත් පිරිමින් වඩාත් සංවේදී වන්නේ පෙම්කරනා අවදියේය. පවුලක වගකීම කරට ගත් විට ඔවුනට ගැහැණුන් හුරතල් කර කර ඉන්නට වේලාවක් නොමැති බව හුඟ දෙනෙක් කියති.

ලොකු අම්මා මට කිරිකෝපි කෝප්පයක් සාදා ගෙන අවුත් මේසය මත තැබුවාය.

"සමනල්ලු වාගේ සැහැල්ලුවෙන් ඉන්න පුළුවන් අම්මල





තාත්තල ළඟ ඉද්දි විතරයි ගෑණු දරුවෙකුට... ඊට පස්සෙ ඉතින් යුද්දෙ තමයි... එකෙක් ඇවිදිනවා.. එකෙක් අතේ.. අනිකා බඩේ.. ගෑණු ජීවිතේ... හැටි....."

ලොකු අම්මා මේසයේ පුටුවක් ඇද වාඩි වී මට තව මාළුකැල්ලක් බෙදුවාය.

"ඔය සම්බෝලෙත් දාගෙන තව කන්න උදානි... ඇටකටු පෑදිලා ඔයාගෙ... හරියට කන්න නෑ වගේ..."

'කන්න නෑ තමයි' කියන්නට මට සිතුණි. ප්‍රසූත නිවාඩු ගෙන හිඳින නිසා මට ලැබෙනුයේ වේතනයෙන් අඩකි. කංචනගේ වේතනය ණයට හිලව් වෙයි. අප කන්නේ බොහොමත්ම අමාරුවෙනි. එසේ සිටියදී තව ගෙයකටත් කුලී ගෙවන්නට වුවහොත් අප එයට ඔරොත්තු දෙන්නේ කෙසේද?

"මං ත්‍රීවිලර් එකකට එන්න කිව්වා ඔහොම්ම යමු.. කෙල්ලගෙ අමාරුව මොකක්ද දන්නෑනෙ...."

පසුව මම ලොකු අම්මා සමඟ ළඟම වූ පෞද්ගලික රෝහලට ගොස් දරුවාව පෙන්වීමි. බෙහෙත් රැගෙන ආපසු එන ගමනේ යාත්තමින් මට සැනසීමක් දැණුනි.

"මට කුලියට ඉන්න ගෙයක් බලන්න ඕන ලොකු අම්මේ.... මට බෑ කැඳ හැලිය වාගේ එකට ඉන්න...."

"ඔයාට මං මොනවා කියන්නද? ඔයාට කොහොම කියල දෙන්නද කියලත් මට තේරෙන්නෙ නෑ උදානි... කංචන ඔයා ගැන හරියට බලන්නෙ නැද්ද...?"

"එයා අම්මලත් එක්ක හුරතල් වෙලාම හැදිලද මන්ද එහෙමට වගකීමක් නෑ."

"එකම පවුලෙ අය එකට හිටියත් නැන්දම්මලා ලේලිලා ආරවුල් ඇතිකරගන්න කොට කොහොමද එකට ඉන්නෙ?"

"මොන හේතුවක්ද මන්ද කංචනගෙ අම්මට මාව පෙන්නන්න බෑ... එයා හිතනවා ඇති මං එයාගෙ පුතාව රවට්ටා ගත්තා කියලා...."

"මේ බුදල් නඩුව ඉවර වුණාම අම්මගෙ කොටස ඔයාට හම්බෙනවා.... එතකං මං සල්ලි ටිකක් දෙන්නං.... කොහෙන්ද ගේ පොඩ්ඩක් බලන්නෙ....."

මගේ හිතේ දහසක් මල් පිපුණා කිවහොත් නිවැරදිය. කංචන දරුවා හා නිදහසේ ජීවත්වන්නට මගේ හිතේ තැවුම් ආසාවක් ගුලි ගැහීගෙන ආයේය.

"උදානි එහෙනම ත්‍රිවීලර් එකක් අරගෙන ගෙදර යන්න. ඒක තමයි හොඳ. මේ වෙලාවෙ කංචන එක්ක ප්‍රශ්න ඇති කරගන්න එපා."

ලොකු අම්මා මා අතට රුපියල් පනස්දහසක මුදලක් දුන්නාය. ඇත්තෙන්ම මට ලෝබ සිතුණි. එනමුදු නිදහසේ ජීවත්වීම හැම දෙයකටම වඩා වටින්නේය.

මා එන විට කංචන බත් කමින් සිටියේය. නැන්දම්මා මේසය ලඟ වාඩි වී කංචනට අඩුපාඩු බෙදමින් හිටියාය.

"ඔය ආවෙ... මොන මඟුලක ගිහින් ආවද කවුද දන්නෙ....?"

මා කතා නොමැතිව කාමරයට යද්දි නැන්දම්මා හිමින් සැරේ කිව්වත්... එය මට මනාව ඇසුණි. මා අයාලයේ යන ගැහැනියක වගට පළමු විෂබීජය ඔහුගේ ඔළුවට දැම්මේ මගේ නැන්දම්මාය.

කංචන ගැනද මම කලකිරී උන්නෙමි. දරුවා අසනීපයෙන් සිටි බව ඔහුට මතක නැත. මා කෑවාද බීවාද යන්න විමසන්නට ඔහුට මතක නැත. නැන්දම්මා ඔහුගේ කුස පුරවයි. පවුලක් වූ පසු





තම බිරිඳ කෑවාද බීවාද බලන්නට ස්වාමිපුරුෂයෙකුට යුතුකමක් වෙයි. මා බඩගින්නේ උන්නත් ඔහුට කම් නැත. කැවද පුකේ අසා අම්මා ඔහුගේ බඩ පුරවයි.

"මං මඟුලක නෙමේ ගියේ ඉන්න කුලී ගෙයක් හොයන්න....."

මම කාමරයෙන් එළියට එමින් කීවෙමි. කංචන ඉන්නේ එය නෑහුණක් මෙනි. මේ වන විටත් නැන්දම්මා සියල්ල ඔහුගේ කණේ තබා හමාර වී ඇතුවා විය යුතුය.

"අපේ කාලෙ නම් අපි මිනිහා නැතුව ගෙයින් එළියට බැස්සෙ නෑ."

මට කියන්නට දහසක් දේ ගිනි පුළිඟු මෙන් හදවත තුළ පත්තු විය. එහෙත් නිශ්ශබ්දතාවයට වඩා වචන හොඳ නම් පමණක් කට ඇරිය යුතුය. මේ වෙලාවේ කට ඇරියොත් මගේ කටින් වුව කුමන විදිහේ වචන පිටවේදැයි දන්නේ නැත.

අවසානයේ නිතරඟයෙන්ම මම වැරදිකාරිය වෙමි.

❋ ❋ ❋ ❋ ❋

අපි අළුතින් ගත් කුලී නිවහනත් පිහිටා තිබුණේ ඇතුල් කෝට්ටෙය. එහි සිට කංචනගේ මහගෙදරට වැඩි දුරක් නොවිය. කංචන මව සමඟ වූ සබඳතා එලෙසින්ම පවත්වාගෙන ගියේය. එහෙත් එයින් පසු මම ඇය සමඟ හිතවත්කම් පවත්වන්නට නොගියෙමි.

මගේ මුළු ජීවිතයම දියණිය වෙනුවෙන් කැප කරන්නට සිදුවිය. මම රැකියාවෙන් අස් වී පූර්ණකාලීන ගෘහිනියක වී ගෙදර දූලි වළං සෝදමින් කුණු අතුගාමින්, රෙදි හෝදමින් හොදි ඒදමින් කාලය ගත කළෙමි. කංචන මට දෙන සොච්චමෙන් කොහොම කොහොම හරි ජීවිතය ගැටගසා ගැනීමට මම විවිධ උපක්‍රම

යෙදුවෙමි.

දරුවෙකුට උත්පත්තිය දෙන විට අම්මා සිය ජීවිතය අත් හරින්නීය. ඉන්පසු ඇය ජීවත්වන්නේ දරුවාට උවමනා අන්දමිනි.

උතුම් මව් පදවිය ළඟ මමද සියලු දේ අත්හරිමින් මගේ දියණියට ලස්සන ලොවක් හදන්නට පෙරුම් පිරුවෙමි.

"උදානි... කෑම එක හරිද?"

කංචන කුස්සියට එබී බලයි. මම ලහි ලහියේ ඔහුට බත් පත බෙදා දෙමි.

"ඔෆිස් එකේ දිග ඇර ගන්න පුලුවන්ද?"

"බිත්තරේකුත් තම්බලා තිබ්බා. පරිප්පුයි, බෝංචියි තියෙනවා."

"මේ ගෙදර කාමර දෙකක් තියෙන එකේ කාව හරි බෝඩ කරගත්ත නම් අමතර ආදායමක්... ගන්න පුලුවන්...."

ඔහු කිව්වේය. මේ රැකියා නගරයේ බෝඩින් කාමර යනු සමහර මිනිසුන්ගේ ජීවනෝපායයි.

"ඔව්... ඒකත් හොඳ අයිඩියා එකක් තමයි. නිකං හිස් වෙලා තියෙන කාමරේනෙ."

මම කංචනගේ අදහසට එකඟ වීමි.

එහෙත් මේ ගේ ඇතුලේ අප සමඟ එකට වසන්නට නම් ඇය අනිවාර්යයෙන්ම කාන්තාවක් විය යුතුය. අනෙක් කාරණාව අවංක, හොරකම් නොකරන හොඳ කෙනෙකු විය යුතුය. එවැනි කෙනෙකු සොයා ගැනීම ලෙහෙසි නැත. කංචන පිට වී ගිය පසු මම ඔහුගේ ඇඳුම් රොත්තත් රැගෙන ඒවා හෝදන්නට ළිඳ ළඟට ගියෙමි.





මෙම නිවසේ ඇති දුෂ්කරතාවය නම් ගැඹුරු ළිඳකින් වතුර අදින්නට සිදු වීමයි. එහෙත් මෙම නිවස වුවද සොයා ගත්තේ කුලී නිවාස බොහෝ ගණනක් සොයා බලාය.

"අපිට අවුරුද්දක ඇඩ්වාන්ස් ඕන...."

හැම තැනින්ම ඇසුණේ එවැනි හඬය. අවසානයේ රුපියල් හයදහසකට මාස හයකට අත්තිකාරම් ගෙවා මෙම නිවස කුලියට ගන්නටද තීරණය කලේ මාය.

මාස්පතා කුලිය, විදුලිබිල ආදිය එන විට ඒවා ගෙවන්නට කංචනගේ වේතනය සෑහෙන්නේ නැත. රණ්ඩුවෙවී හෝ නැන්දම්මාත් සමඟ එකටම ඉන්නට ලැබුණ නම් හොඳ යයි මට සිතෙයි......

"කංචන, දුවගේ උපන් දිනෙත් ලබන සුමානෙ."

හවස වැඩ ඇරී ආ කංචනට මම තේ කෝප්පයක් සාදා දී මතක් කලෙමි.

"කවදද...?"

"ඇයි අනේ ඔයාට දුවගෙ බර්ත්ඩේ එකවත් මතක නැද්ද?"

"මේ... වැඩ වැඩි හින්දා උදානි... ඒකත් අමතක වුණා...."

"මගෙ බර්ත්ඩේ එකත් අමතක වෙලා ගියා නේද?"

කංචන එයට පිළිතුරක් නුදුන්නේය. මගේ උපන්දිනය යනු අපේ ආදරය ආරම්භ වූ දිනයයි.

"අපි පොඩිවට පාටි එකක් දාමු. මගේ ඔෆිස් එකේ අයටත් බබාව බලන්න එන්න බැරි වුණානේ."

"සල්ලි.....?"

"මම කොහෙන් හරි පොඩිවට ලෝන් එකක් දාන්නම්...."

මම සතුටින් සිටියෙමි. කාලයකට පසු මගේ හදවත සතුටින් පිරුණේ ඇයිදැයි මම නොදන්නෙමි. සමහර විට කංචනගේ අවධානය මාත් දයණියත් වෙත යොමු වූ නිසා දැයි මම නොදනිමි.

* * * * *

අසල්වාසී කාන්තාවකගේද උදව් ඇතිව මම රට දහදෙනෙකුට පමණ ඇති වෙන්නට කෑම පිළියෙල කළෙමි. අසනීත් සමග මෙම යුද්ධය කිරීම පහසු නැති වුවද කංචනගෙන් ලැබුණ සහයෝගය වූයේ එළවළු මස් හා මාළු ටික උදේම මට ගෙනැවිත් දීමයි. කාලයකින් ඔහුද විනෝදයක් ලැබුවේ නැතත්.... දහයකට පමණ ඇති වෙන්නට කෑම හදන්නට ඔහු මට කීවේය. මා හිතුවේ ඒ ඔහුගේ කාර්යාලීය මිතුරන්ට කියාය. නමුදු හැන්දෑවේ නිවසට පැමිණියේ නැන්දම්මාත්, රුවන්ති නංගිත්, නිශාන්ත අයියාත් ඔවුන්ගේ අවුරුද්දක් වයසැති අශේන් පුතුත්ය.

"උදානි කේන්ති ගන්න එපා... අම්මට දුව බලන්න ඕන කීවා...."

කංචන කුස්සියට පැමිණ කීයේය.

"ඒ මොකද... මෙච්චර කල් නොතිබ්බ ආදරයක්... ළමය වදලා ඇවිත් දවස් තුනෙන් මට උයාගෙන කන්න කීවා. ග්‍රයිෆ්වෝටර් ටික පොවා ගන්න අල්ලපු ගෙදරට ගියා කියලා ගෙදරින් යන්න කීවා... දැන් මොකද අමුතු ආදරයක්.....?"

මම ගිනිගෙන උන්නෙමි. කංචන සියල්ලම සැලසුම් කර කෙසේ හෝ ඔවුන් ගෙදරට ගෙන්වා ගත්තේය. ලොකු අම්මා නොවුණා නම් අප මහ පාරේය.

"දැන් ඉතින් කෑ ගහන්න එපා. ඒ මගේ අම්මයි, නංගියි





මස්සිනයි."

"මං දන්නවා... මට වෙනස්කං කරද්දි මතක් වුනේ නැද්ද ඒත් තමන්ගේ අම්මා නංගි කියලා....."

මම නිශාන්ත අයියාව මතක් නොකළෙමි. ඔහුගෙන් මට කිසිදු වෙනස්කමක් නොතිබිණ. එහෙත් ඔහුගේ මනමාල ඇස් මට මොනවදෝ කියනවා යයි මට සිතුනේ වරක් දෙවරක් නම් නොවේ. සමහර විටෙක ඒ මට හිතෙන හැටිද කියන්නට නොතේරේ.

"හරි.... හරි.... මේ වෙලාවේ ටිකක් ඉවසලා ඉන්නකො.... තව මගේ ඔෆිස් එකේ යාලුවොත් මග එනවා කියලා කෝල් කරා..."

කංචන මා ඉදිරියේ බැගෑපත් වෙයි. එහෙත් ඉදිරියට යන්නට මගේ හිත නැමෙන්නේ නැත. අවසානයේ මට උදව්වට පැමිණි රේණු අක්කාට තේ ටිකක් හදා ඉස්සරහට ගෙනියන්නට කීවෙමි.

"මොනවද නංගි, පරණ දේවල් අමතක කරලා යමු ඉස්සරහට......"

හදිසියේම කුස්සියට පැමිණි නිශාන්ත අයියා කීවේය. ඔහු වතුර ටිකක් ගෙන අත සෝදා ගත්තේ... දරුවා වඩා ගන්නට විය යුතුය.

"තරහ ගියාම රෝස පාට ජම්බු ගෙඩියක් වගේ"

එසේ කියමින් ඔහු අතේ වූ වතුර ටික මගේ මුහුණෙහි ගෑවේය.

"එන්න එපා ඕවාට...."

"දැන් නම් රෝස පාට රතුපාට වෙලා."

එසේ කිව් ඔහු තව වතුර ටිකක් මගේ මුහුණට ඉස පිටවී ගියේය. මම ඉතා ඉක්මනින් කට්ලට් ටික තෙලට දා බැද ගත්තෙමි.

"උදානි, ඔෆිස් එකේ අයත් ඇවිත් යමු...."

කංචන නැවතත් කුස්සියට ආයේය. කාර්යාලයේ යහළුවන්ට මා මුහුණ දිය යුතුය. කාර්යාලයේ මිතුරන් පස් දෙනෙකුද පැමිණ සිටියහ. ඒ අතර පිරිමි තුන් දෙනෙකු හා ගැහැනු දෙදෙනෙකු වූහ.

"මෙ... හසන්ත, ලක්මාල්, සම්පත්, මංජුලා හා ලක්ෂානි ලෙසින් ඔහු විසින් මට යහළුවන් හඳුන්වා දෙන ලදී.

ඔව්හු අසනිව වඩාගෙන හුරතල් කළහ. ඒ අතරේ කංචන විසින් ඇතුල් කාමරයේ මත්පැන් සංග්‍රහයක්ද සූදානම් කරගෙන සිටියේය.

"උදානි... මාත් උදව් වෙන්නද? මොනවද කරන්න තියෙන්නේ......"

ලක්ශානි නම් වූ තරුණිය කුස්සියට පැමිණියාය. මා උන්නේ පිඟන් සෝදමිනි. අසනිගෙන් ටිකක් නිදහස් වූ බැවින් මම කඩිනමින් කුස්සියේ වැඩ ටික කරමින් සිටියෙමි.

"අනේ කමක් නෑ...."

"දෙන්න උදානි... මම පිඟන් ටික හෝදන්නම්."

ලක්ශානි එය බාර ගත්තාය.

"කංචන ඇවිත් කියනවා ඔයා ගැන....."

"අපෝ මං ගැන මොනවද කියන්නෙ....?"

"තමන්ගේ වයිෆ් ගැන.. පිරිමියෙකුට කතා කරන්න





කොච්චරවත් දේවල් නැද්ද...?"

"අනේ මන්ද... එයා මොනවා කියලද කියලා.... මං නම් හිතන්නෙ කංචනට මං ගැන කියවන්න තියා හිතන්නවත් වෙලාවක් තියෙනවද කියලා."

"අපේ ඔෆිස් එකේ වැඩ වැඩියි. අළුතෙන් ආපු බොස් හරි අමාරුකාරයා. ලන්ච් ගන්න තියෙන වෙලාවෙ තමයි ටිකක්වත් නිදහස තියෙන්නේ."

ඇය කියූ කතාවෙන් මම තරමක් සන්සුන් වූවෙමි. කංචන මා ගැන සැලකිල්ලක් දක්වන්නේ නැතැයි සිතීම මගේ මනෝ විකාරයක් විය හැකිය.

* * * * *

දූවගේ උපන්දිනයෙන් පසු යළිත් සාමකාමී ලෙසින් මාස කිහිපයක් ගෙවී ගියේය. ඒ... අතරේ මට නරක ආරංචියක් ගෙනාවේ අසල්වැසි නිවසේ රේණු අක්කාය.

"නංගි, මෙක කිව්වය කියල කළබල වෙන්න එපා...."

මා රෙදි සෝදමින් සිටියදී ඇය ළිඳ ළඟට පැමිණියාය

"මොකක්ද රේණු අක්කේ.....?"

"කංචන මල්ලි...... කවුරු හරි ගෑණු ළමයෙක් එක්ක යනවා එනවා... අපේ එක්කෙනා දැකලා තියෙනවා... දෙන්නත් එක්ක මොකක්ද මැච් එකක් බලන්නත් ගිහින්....."

"ඔෆිස් එකේ යාලුවොත් එක්ක හවස මැච් එකක් බලන්න යනවා නම් කියලා මටත් කිව්ව අක්කෙ....."

"ඔයා මේ ගෙදරටම වෙලා වළං හෝද හෝදා රෙදි හෝද හෝදා ඉන්න එපා. ටිකක් හොයලා බලන්න."

"අනේ අක්කෙ.... අපි අවුරුදු හයක් යාළුවෙලා ඉඳලා බැන්දෙ... මට එයා ගැන නම් කිසිම සැකයක් නෑ...."

"ඔයා හිතන්නෙ අපේ එක්කෙනා බොරුවක් කිව්වා කියලද?"

"එහෙම හිතන්නත් බෑ නේද අක්කේ... ඒත් එයාට වෙන සම්බන්ධයක් නම් නෑ."

රේණු අක්කාට මගේ පවුල් ජීවිතය බිඳදැමීමට කිසිසේත්ම උවමනාවක් නොමැති බව මම දනිමි. නමුත් කංචන මට එරෙහිව නම් කිසිමදාක වෙනත් ගැහැනියක සමඟ පැටලෙන්නේ නැති බවත් මට විශ්වාසය. මේ ආර්ථික ප්‍රශ්න නොවේ නම් අපි දෙදෙනාම මීට වඩා සතුටින් ඉන්නට තිබුණි.

පාසල් යන කාලයේ පවා කවින්ද සම්බන්ධව මට තිබුණ කට කතා පයේ පෑගෙන දූහුවිල්ලකටවත් ගණන් නොගත් කංචන මා ඇසුරු කර විවාහ කර ගත්තේය.

"මං යනවා නංගි.... ඔයා කෙලින්ම අහන්න යන්න එපා."

"මං ෂේප් එකේ බලන්නංකො....."

මම එසේ කියා රෙදි ටික සෝදා වැලට දැමුවෙමි. එතෙක් මෙතෙක් කංචන ගැන මට එවැනි ආරංචියක් ලැබී නැත.

"ඒත් මේ ගෙදරට වෙලා බත් තම්බ තම්බ ඉන්න උඹ එළියට බැහැල සමාජයට යන මිනිහා ගැන දන්නෙ මොනවාද? මෝඩියේ බඩට බබෙක් ඇවිල්ලා මාස දෙකක් යනකං ප්‍රෙග්නන්ට් කියලා දැණුනේ නැති උඹ මොන ගොං මෝඩියෙක්ද?"

මගේ හිත කතා කළේය. ඇත්තෙන්ම ගුරුවරියක වුවද බාහිර සමාජය ගැන මට තිබුනේ අල්ප දැනුමකි. අප හැදුනු පරිසරය අනුව මහ ගෙදර ඉද්දි අපට රූපවාහිනියේ වැඩිහිටි ටෙලි





නාට්‍යයක්වත් බලන්නට වැඩිහිටියන් ඉඩ දුන්නේ නැත. කාන්තා පත්තරයක් වුව බැලුවේ නැත. දැන් පත්තරයක් ගන්නටවත් මුදල් නැත.

අවශ්‍ය වේලාවට පාවිච්චි කිරීමට මට ඉරෝමි විසින් පරණ දුරකථනයක් දී තිබුණි. ඉඳහිට කංචනට ඇමතුමක් ගත්තේ ඒ ජංගම දුරකථනයට කාඩ්පතක් දමාගෙනය.

එනමුදු... එයටද මට මුදල් නැත. මාසයකට සැරයක් වෙනත් ලෙඩක් නොමැති නම් හෙම්බිරිස්සාවක් හෝ හදා ගන්නට අසනී පසුබට නොවන්නිය.

"කංචන.... ඔයා කිව්ව නේද කාමරේට බෝඩර් කෙනෙක් ගම්මු කියලා... මාසෙකට කීයක් හරි හම්බෙනවනෙ. අපි දෙමුකො...."

කංචන වැඩ ඇරී ආ පසු මම ඔහුට තේ එකක්දී ඇසුවෙමි.

"විශ්වාසවන්ත කෙනෙක් වෙන්න ඕන ඔනැතේ."

"ඔයා දන්නැද්ද කවුරුවත්."

"අපේ ලක්ශානි නම් බෝඩිමක් හෙව්වා."

"ඉතිං හොඳයිනේ අපි එයාට දෙමුකො. කැමති වෙයිද දන්නෑ. මෙහෙ ඉන්න වතුර අදින්නත් එපැයි...."

"අනේ මන්ද... ඔයාම කතා කරගන්න. මම කාඩ් එකක් ගෙනත් දෙන්නම්... ෆෝන් එක චාර්ජ් කරලා තියාගන්නකො...."

මෙසේ කතා කරන කංචන කෙල්ලක සමග සම්බන්ධයි කීම කෙතරම් වැරදි සහගතද? මට එය ඔහුගෙන් අහන්නට හිත් වුණේ නැත. මොනවා වුණත් මේ අවුරුදු හයක් පෙම් කර අවුරුදු හතරක් තිස්සේ පවුල් කන මගේ ආදරණීය සැමියාය. අපට හොඳ

කාලයක් උදාවනුයේ නව ඉදිරියට වග මම සිතුවෙමි.

ලස්සනම ලස්සන අනාගතයක් මගේ ඇස් ඉස්සරහට එනතුරු මම හීන ඇහින්දෙමි. පතිනියකට හිමි සියලු පැතුම මගේ හදවතේද අඩුවක් වූයේ නැත.

කංචනා විසින් දුරකථන කාඩ්පතක් ගෙනත් දුන් පසුව මම ලක්ශානිව ඇමතුවෙමි. එදා කුස්සියටම වීත් පිගන් සෝදා මේසය සූදානම් කිරීමට ඇය උදව් වූ නිසා නිහතමානි හිත හොඳ ගැහැනියක වග මම සිතුවෙමි.

"ආ.... උදානි. කංචනා මට කීවා ඔයා කතා කරයි කියලා.... ඉතිං මං කවද්ද එන්නෙ....?"

ඇය මට පහසු කළාය.

"ඔයා එන්න කැමතිද දන්නෑ කියලා මං හිතුවේ.... අපට එච්චර පහසුකම් නෑනේ...."

"අනේ නෑ උදානි. මං කොහොමත් කන්නෙ පිටින්. මට උදේට තේ ටික හදාගන්න පුළුවන්. කාටවත් කරදරයක් නෑ.... රෑට ඇවිත් නිදාගන්න තිබ්බනම් ඇති.... කාමරේට කීයක් ඕනෑද?"

"බොරු කියන්නෙ මොකටද ලක්ශානි. ආර්ථික ප්‍රශ්න හින්ද තමයි කාමරේ දෙන්න හිතුවෙ."

"මං සාධාරණ ගාණක් දෙන්නම්කෝ...."

ඒ ප්‍රශ්නය එතැනින් නිමා විය. පසුවදා ලක්ශානි අපේ ගෙදරට පැමිණියාය. ඇය රැගෙන ආවේ ඇඳුම් දමූ ගමන් බෑගයක් පමණි.

"මටත් පාළු නෑ...."

මම සිතුවෙමි.





වැඩ ඇරී එන ලක්ශානි කඩෙන් ගෙනෙන ලද මොනවා හෝ දෙයක් කා තේ සාදාගෙන බී පාඩුවේ දොර වහගෙන නිදාගත්තාය.

"මොලේ වෙහෙසෙන වැඩ කරන කොට හරි ඉක්මනට නිදා ගන්න ඕන... කෑවා හෝ නොකෑවා නිදා ගන්න තමයි ඕන."

රෑ බෝවී නිවසට එන ලක්ශානි එසේ කියමින් කාමරයේ දොර වසාගෙන නිදාගත්තීය. ඉඳහිටක රෑ වෙන තුරු රූපවාහිනිය නරඹන අවස්ථාද නැතුව නොවේ.

"ලක්ශානි මොනවද ඔය තරම් රෑ වෙනකං කරන්නේ"

වරෙක මම කංචනාගෙන් ඇසුවෙමි.

"බාර ගත්ත වැඩ ටික රෑ කීයට හරි ඉවර කරන්න ඕනෑනෙ... රස්සාවක් කරන කොට එහෙම තමයි. ටීච කෙනෙකුට වාගෙ එකහමාරට ඇරිලා ගෙදර එන්න බෑ."

කංචනා දුන්නේ සාධාරණ උත්තරයක් වූ නමුත් එතැනදී ඔහු මාව පහත් මට්ටමකට ඇද දැම්මා යයි මට සිතුණි.

"මගෙ රස්සාවෙනුත් අයින් වෙන්න වුණ හින්දනෙ මෙච්චර කරදර....."

"උදානි... ඔයාගෙ කැමැත්තෙන් ලක්ශානිව නවත්තගත්තෙ... ඒකට මාව ගාවා ගන්න එපා.... අනික එයා කීයට ආවම අපිට මොකද...?"

"ඒකත් ඇත්ත."

මම කංචනා සමඟ එකඟ වීමි. එකක් දූන් දූන් කංචනගේ මා ගැන අවධානයත් ඇත්තේම නැති තරම්ය. ඔහු වෙන ගැහැනියක හා සම්බන්ධයක් ඇති වගට එතෙක් මෙතෙක් තොරතුරු ලැබුණත්

මම ඒවා ලක්ශානිගෙන් විමසන්නට බිය වීමි. ඊට හේතුව ලක්ශානි මට වඩා තම කාර්යාලයීය මිතුරාට හිතවත් වීමය.

සමහර දිනවල දෙදෙනා ආවේ ගියේ එකටමය. රෑ බෝවන තුරුම රූපවාහිනී චිත්‍රපට නැරඹීම ඒ දෙදෙනාගේම විනෝදාංශය විය.

"උදානි... එන්නකො අනේ... ෂෝක් ෆිල්ම් එක...."

ලක්ශානී මට අඬගහයි.

"අනේ බෑ... මට පාන්දර නැගිටින්න තියෙනවනෙ."

"උදානි හරි කම්මැලියි.... මෙහෙමවත් එන්ජෝයි කරන්න කැමති නෑ....."

එසේ කියන්නේ කංචනය.

"මට ඉතින් එන්ජෝයි කර කර ඉන්න තියෙනවද... මේ මුළු ගෙදරම වැඩ මං කරන්න එපායැ... ඔක්කොටොම එහා ළිදෙන් වතුර අදින එක."

මම චෝදනාවක් එල්ල කළෙමි. මා එසේ කරන්නට හේතුවක් තිබිණි. උදේට කංචන විසින් ළිදෙන් වතුර ඇද එතැන තිබෙන කුඩා ටැංකිය පුරවයි. ඉන්පසු ලක්ශානි ගොස් ඇගපත සේදීම රෙදි සේදීම වැනි දෑ කර ගන්නීය. හැන්දෑවට ද ඔහු ආපසු ටැංකියට වතුර දමන්නේ ලක්ශානිට ඇඟහෝදා ගනු පිණිසය.

"එයාට පුරුදු නෑ වතුර අදින්න.... එයා යන්න ගියොත් එහෙම ඒකෙනුත් පාඩුව අපිටනේ...."

ඒවාට හේතු හැටියට ඔහු කල් ඇතිවම කියන්නේය.

ඒ අතරේ තවත් සුබ දවසක් උදාවිය. ලොකු අම්මා අපේ ගෙදරට පැමිණියාය.





ඒ වන විට අපනිට අවුරුදු තුන සම්පූර්ණ වී තිබුණි.

"යාන්තං ගෙට හොඳ ගැනුම්කරුවෙක් හම්බුනා.... ගේ විකුණ ගත්තා. ඔයාගේ අම්මගෙ කොටස මං අරගෙන ආවා."

ලොකු අම්මා හෑන්ඩ් බෑගය හැර ඉතා ප්‍රවේශමෙන් බ්‍රවුන් පේපර් කවරයක් අතට ගත්තාය.

"පරෙස්සමට වියදම් කරලා ගෙයක් හදාගන්න. මෙතන ලක්ෂ දාහතරක් තියෙනවා."

මගේ දෑසින් කඳුළු කැට කඩා හැලිණි. වතුර ඇදීම නිසා මගේ ගර්භාෂයද පහත් වී තිබුණි. මා දුක් විඳි කාලය අහවර වග මට සිතුණි. ජීවිතයේ එක් එක් කාලවලදී ජීවිතයට පැමිණෙන සියලු දුක් ගිනි දරා ගත් ගැහැනියක වූ මට විවාහයෙන් පසු විඳි දුක නිමක් නැත.

"දූන් රුවන්තිලා ගේ හදලා ඉවරද?"

"එයාල නම් ගේ හදලා පදිංචිත් වෙලා. අපි බදින දවස්වලමනේ නිශාන්ත අයියා ගේ හදන්න පටන් ගත්තෙ...."

"එක ළඟ... කමක් නෑ... හදිසියකට රණ්ඩු වෙන්න මරා ගන්න හරි එකුස උපන් සහෝදරියක් ඉන්නවනේ."

ලොකු අම්මා සැනසුම් සුසුමක් හෙළුවාය.

"දූන් එතකොට ලොකු අම්මයි ලොකු තාත්තයි කොහෙද ඉන්නෙ....."

"අපිට ඉතිං දරුවො තුන්දෙනෙක් ඉන්නෙකේ කොහෙ ඉන්න බැරිද.... පොඩි අක්කට ආයෙත් බබෙක් හම්බෙන්න. ඒ හින්දා... අපි මේ ටිකේ එහෙ නතර වෙන්න කියලා."

පොඩි අක්කා විවාහ වී සිටියේ කිරිබත්ගොඩ ප්‍රදේශයෙනි.

"මං තනිවුනා. මට හදිසියකට ලොකු අම්මා හිටියා... දැන් ලොකු අම්මත් ඈතකට යනවා."

"අපි හැමෝම තනිවෙනවා උදානි...."

"මට දුකයි ලොකු අම්මෙ. අපි ඉස්සර මහ ගෙදර මොන තරම් සන්තෝසෙන්ද හිටියෙ. අපි දුක කියන දේ දන්නෙ නෑ. බවඩගින්න කියන එක දන්නෙ නෑ..... ඉල්ලන දේ ළඟට ලැබෙනවා... ඒත් දැන්....."

"ගේ හදා ගත්තම හැමදේම හරියයි. ඒත් දූං ඔය තියාගෙන ඉන්න උරවක්කරමාලෙ නම් ඉක්මනට යවන එක හොඳයි."

ලොකු අම්මාගේ ගැහැණු ඉවට අසු වූ දෙය මට දැණුනේ නැත. ලොකු අම්මා කතා කරනුයේ එළියේ වනා ඇති රෙදි වැල දෙස බලාගෙනය. එහි ඇති ලක්ශානිගේ ඇඳුම් මඳ සුළඟට කොඩි ලෙළ දෙන්නාක්මෙන් ලෙළ දෙයි.

"ඇයි ලොකු අම්මෙ... ලක්ශානිගෙ නම් වරදක් නෑ."

"උඹට නොපෙනන මහ විනාශයක් මට පේනවා. අද හොඳයි හොඳයි කියලා ගෙට දාගත්තට පස්සෙන් පහු තේරෙයි... ඇත්තටම උඹට මොළේ කළඳක් නැද්ද?"

එය ඕනෑම ගැහැනියකට ඇතිවන සාධාරණ සැකයකි. එහෙත් මට ලක්ශානි ගැන වරදක් පෙණුනේ නැත. කංචනගේ අවධානය මට වඩා ලක්ශානි වෙත යොමුවුණ වග සැබෑය. එහෙත් කංචන මගේ නිදන ඇඳෙන් අතුරුදහන් වූ දිනයක් ගැන මගේ මතකයේ නැත. මොනවා වුණත් මගේ සැමියා ගැන නරකක් සිතීම පාපයක් බව මට දැණුනි. මට ඒ ආභාෂය එන්නට ඇත්තේ අම්මාගෙනි. අම්මා තාත්තාට දැඩි ලෙස ආදරය කළාය. තාත්තාගේ මරණය මට යාන්තමින් මතකය.

"අගේට කසාදයක් බැඳ ගන්න තිබුණා. කොහෙද නංගි





පස්ස ගැහුවනේ."

ලොකු අම්මා නිතරම අම්මාට කියනු මට ඇසී තිබිණ.

"ඒ මනුස්සයා මට පණවාගෙ.... මට කිසි වරදක් කළේ නෑ... මගෙයි කෙල්ලගෙයි කරුමෙට අකාලෙ මැරුණ බව හැබෑව. ඒත් මට තවම දැනෙන්නෙ මාත් එක්ක ඉන්නවා ඉන්නවා වාගෙ."

අම්මා එසේ කීවේ අඬ අඬාය.

"මට ආයෙ මිනිස්සු ඕන නෑ."

අම්මා සංසාරයේදී ප්‍රාර්ථනා කලේ එකම ස්වාමිපුරුෂයෙකු සේද... මමද දැඩි අධිෂ්ඨානයක උන්නෙමි. කංචන මගේ හිමිකාරයාය. අවුරුදු හයක් ප්‍රේම කල මගේ පෙම්වතාය. මගේ දියණියගේ පියාය. ඔහු ගැන නරකක් හිතන්නට තරම්වත් මගේ හිත කැමති වූයේ නැත.

ලොකු අම්මා පිටව ගිය පසු මම මුදල් බහාලු කවරය ප්‍රවේශමට අල්මාරියේ සඟවා තැබුවෙමි.

අතේ තිබුන පොඩි මුදල වියදම් කොට එදා මම ළඟ කඩයට ගොස් බඩු ගෙනත් ටිකක් සරුවට රෑ කෑම පිළියෙල කළෙමි. කංචන කන්නට කැමති ලෙසින් කුකුල් මස් කරියක්ද පරිප්පු ද බටු සලාදයක්ද හැදුවෙමි.

"මොකද මේ අද පෙර මග බලාගෙන...? මහන්සියි උදානි... තේ එකක් හදන්නකො."

ඔහු ගෙට ගොඩ වන විටම බෑගය මගේ අතට දී කමිසයද ගලවා මගේ කරේ දැම්මේය.

"මම හන්දියෙ කඩෙන් බිත්තර ආප්ප ගෙනාවා. ලුණු මිරිසුත් එක්ක රසයි... තේ එක හදනකං ඇඟ හෝදගෙන එන්න...."

"කෝ දුව....?"

"රේණු අක්කා අරගෙන ගියා...."

දියණිය ඉඳහිට අල්ලපු ගෙදරට යන්නීය. රේණු අක්කා අසනිව බලා ගත්තේ ආදරයෙනි.

කංචන ටැංකිය පුරවන හැටි මම බලාගෙන සිටියෙමි. මගේ ඇස කඳුලින් තෙත් නොවුණා නොවේ. මට වඩා ගෙදර බෝඩිංකාරිය කෙරේ ඔහුගේ අනුකම්පාව වැඩිය. ඒ අනුකම්පාව පසුකලෙක භූමිකම්පාවක් වන වග මට දැණුනේ නැත.

"හොඳ කෑම සුවඳක් එනවා."

තුවාය කරේ දාගෙන වතුර නාගෙන ආ කංචන කෙරෙන් සරාගී බවක් ද දිස් නොවුනා නොවේ.

"චිකන් දෙසියපනහක් ගෙනත් ඉව්වා."

"එහෙනම් ලක්ශානිටත් කෑම ටිකක් දෙන්න. තාම ආවෙ නෑ නේද?"

"මේකෙ හැමෝටම කන්න නෑ."

"එයාට කඩ කෑම එපා වෙලාලු... මනුස්සයෙකුට කෑම වේලක් දුන්නා කියලා තමුන්ට ආත්ම ගාණක් බඩගින්නෙ ඉන්න වෙන්නෙ නෑ."

එය ඇත්ත විය යුතුය. මේ ආත්මයේ නොලැබෙන්නේ ගිය ආත්මයේ නුදුන් නිසාය. කෙනෙකුට දුන්නා කියා අඩුවන්නේ නැත.

"ආපුහම එහෙනං ඔයා කතා කරන්නකො."

"දැන් කියන්නකො... සතියක් වියදම් කරන්න තියෙන සල්ලි එක දවසකින් වියදම් කරේ ඇයි?"





කංචන තේ බොන අතරේ මම කාමරයට ගොස් මුදල් බෑගය රැගෙන ආවෙමි.

"ඇස් පියාගන්න...."

"කෝලං නොකර මොනවද කියන්න."

"මේ මගෙ දෑවැද්ද. මෙතන ලක්ෂ දාහතරක් තියෙනවා....."

කංචන සිනාසෙමින් තේ බීම පසෙක තබා මුදල් බෑගයත් රැගෙන කාමරයට වැදුණේය. මම ඔහු පසුපසින් ගමන් කළෙමි. ඔහු මුදල් ගනිමින් සිටියේය.

"දැන් අපි ගේ හදමු..."

"ඔව් උදාති.... දැන් ගේ හදන්න පටන් ගමමු."

ඔහු මගේ බඳවටා අත යවා මා තුරුලට ගත්තේය.

# හතරවැනි හිනිදළුව

ප්‍ර: ඔබේ ස්වාමි පුරුෂයා සබඳතාවයක් තිබුණාද යම් කිසි කාන්තාවක් සමඟ?

උ: මගේ ස්වාමියා රැකියාව කල ස්ථානයේ ගැහැනු ළමයෙක් ලක්ශානි කියලා අපේ ගෙදර නවත්තා ගත්තා. ඒක හරි උපක්‍රමශීලීව තමයි කරේ. මෙයා මට බොරු කිය කියා ඒ ගැණු ළමයත් එක්ක මැච් බලන්න එහෙම ගිහින් තිබුණා. මගේ ගෙදරටත් ගෙනැල්ලා තියා ගත්තා......

ප්‍ර: පැමිණිලිකරු කියා සිටියා ඔබේ කැමැත්තෙන් ඇය නිවසට රැගෙන ආවා කියලා.

උ: බෝඩිංකාරියක විදිහට නවත්වා ගැනීමට පමණයි කැමති වුනේ. ඒ අපේ ආර්ථික ප්‍රශ්න මඟ ඇර ගන්න.

ප්‍ර: පැමිණිලිකරු ඇය සමඟ මොන වගේ සම්බන්ධයක් ද තිබුණේ......

උ: දෙන්න උදේම ඔෆිස් යන්නෙ එකට. වැඩට යනවා කියලා කොහේ යනවාද දන්නෙ නෑ. රෑට ඇවිල්ලා ඒ දෙන්නා ටීවී බලනවා. මට මහ රෑයක් වෙනකං ඇහැරගෙන ඉන්න බෑ. පාන්දර බත් උයන්න නැගිට්ටින්න ඕන... ඒ දෙන්නා කාමරේ දොර වහගෙන ඉන්නවා... මොන මොන දේවල් සිද්ධ වුණාද දන්නෙ නෑ ස්වාමිනී....

ප්‍ර: මොන වගේ ටී. වී. දර්ශනද ඒ අය බලන්නෙ?

උ: අසභ්‍ය වීඩියෝ දර්ශන බලනවා.

ප්‍ර: ඒ හේතුකොට ගෙන ඔබ ඒ ගැහැණු ළමයාට යන්න කිව්වා.

උ: බැරිම තැන ඒ ළමයගෙ ඇඳුම් ටික ගේට්ටුවෙන් එළියට විසිකළා. උඹ පලයන් කියලා.....





## 4

කංචන අතට මුදල් බෑගය දීමෙන් මා ජීවිතයේ ලොකුම මෝඩකම කළා යයි මට සිතුණේ ගේ හදන්නට වගේ වගක් නොමැතිව ඔහු හිතු මතේට මුදල් වියදම් කරද්දීය. වෙනදාට නැති යහළුවන් රොත්තක් ඔහු වටේ විය. ඒ අතර ත්‍රීවිලර් රියදුරන්, පොලිස් නිළධාරීන් වැනි නානාප්‍රකාර අය විය.

මම පරණ ඇඳුම් පට්ට ගසද්දි ලක්ශානිද අළුත් අළුත් විලාසිතාවලින් සැරසී යනු මම දුටුවෙමි.

"මේ වැඩේ මෙහෙම බලා හිටියොත් නම් හරියන්නෙ නෑ. මොකක්ද කංචන මේකේ තේරුම? රෑට බේබද්දෝ ලෑස්ති කරගෙන් නම් ගෙදර එන්ඩ එපා......"

උදෑසන ලක්ශානිත් සමඟ රැකියාවට යන්නට පිටත් වෙද්දී මම කීවෙමි.

"මට නැති කාලෙ උදව් කරපු යාළුවො... යාළු මිත්‍රකම් නැති කරගන්ඩ බෑනෙ...."

"මොනවද නැති කාලෙ උන් කරපු උදව්... අපි කෑ හැටි ලිපා දනී කියන්නා වගේ මේ ලිපේ ගින්දර ඇවිලිච්ච වාර ගණන මම කියන්නං. තිබ්බ දංකුඩේ හූරලා හරි ඔයාටයි දුවටයි දීලා මං බඩගින්නෙ හිටිය වාර ගණන ඔයා දන්නවද?"

මගේ ඇසෙන් කඳුළු පනිමින් තිබුණි. මා ටිකක් තරහෙන් කතා කළා වන්නට ඇත.

"උදේ එළියට බහිනකොට ඔහොම කෑ ගහන්න එපා උදානි... මිනිහෙකුට ජීවිතේ එපා වෙනවා."

ලක්ශානි මට උපදෙස් දීමට පැමිණීම ගැන ඇත්තෙන්ම මට කේන්තියක් විය. අඹුසැමියන් අතර කුමන ප්‍රශ්න ඇවිලුණද ඒවාට පිටස්තරයින් ඇඟිලි ගැසීමෙන් සිදුවන්නේ ප්‍රශ්නය උඩුදිවීම පමණි.

"මිනිහෙකුට ජීවිතේ එපා වෙනවද නැද්ද කියලා දැනගන්න ඔයා කසාද බැඳල නෑනේ...."

"නෑ.... මං කියන්නෙ....."

ඇය කියන්නට හැදූ දෙය කියන්නට කංචන ඉඩ දුන්නේ නැත.

"මෙන්න මෙහෙ එනවා... බස් එක ගිහින් තිබුණොත් අදත් බැණුම් බොස්ගෙන්."

ඒ අනුව ලක්ශානි තවත් පමා නොවී කංචන පසු පස්සෙන් දිව්වාය.

"ඒ දෙන්නා හරියට ගෑනියි මිනිහයි වගේනෙ...."

ඒ හඬට මම පසුපස හැරී බැලුයෙමි. මොනවදෝ කෑම පාර්සලයක් අතේ ඇතැතිව හවුස්කෝට් එක පිටින්ම රේණු අක්කා ඇවිදින් උන්නාය.





"ලැවරියා ටිකක් හැඹුවා. මේ ටික අහනිට..."

ඇය මා අත පාර්සලය තැබුවාය.

"රේණු අක්කට පිං සිද්ධ වෙනවා...."

මගේ ඇසේ කඳුළු හංගන්නට මට පුළුවන්කමක් නොවීය.

"උඹ නම් හරි මෝඩියෙක් උදානි.... අඬන එකමයි වැඩේ... දැන් මොකද ප්‍රශ්නෙ...?"

"කංචන අතට සල්ලි ටික දීලත් දැන් මාස හතරක් වෙනවා... එයා ඒක තිරපරාදේ නාස්ති කරනවා... රේණු අක්කට පේනවනේ හැමදාම රෑට පාටි...."

"මාත් මේ අපේ එක්කෙනත් එක්ක කිය කියාහිටියෙ ඒක තමයි. මං උදානිට මුලින්ම කිවා ඔය නැටිච්චි ගෙට ගන්නකොට"

"බෝඩිංකාරියක්නේ....."

"තරුණ මිනිහෙක් ඉන්න ගෙදරකට තවත් තරුණ ගෑනියෙක් එහෙමත් ගන්නවද... ගින්දරයි පුළුනුයි ළං කරන්න පුළුවන්ද....?"

"ඒක නං එක ඔෆිස් එකේනෙ රේණු අක්කෙ... කොහොමටත් ගිනි ගන්නවා...."

"උඹට කියන කට මොකටද...? ඔන්නොය ගෑනි යවන්න... පවුල කඩා වැටෙනකං බලා ඉන්නෙ නැතිව...."

"ඒ දෙන්නා ඔය රෑ වෙනකං ටී වී බලනවා කිචි කිචි ගගා හිනාවෙවී... ඒ ඇර ඉතින් වෙන දෙයක් නෑ....."

එය ඇත්ත නොවේදැයි මට සිතුණි. තදේටම මට තින්ද

යන්නේ දිවා කාලයේ මහන්සි වී වැඩ කරන නිසාය. දඟකාර වයසේ දරුවෙකුත් බලා කියාගෙන නිවසක වැඩ කිරීම ලෙහෙසි පහසු දෙයක් නොවේ.

"කංචන හම්බ කරන සල්ලිවලට මොනවද වෙන්නෙ කියලා හොයල බලන්න... ගෙට රිංගන යාළුවො මොක්කුද කියලා ටිකක් හොයලා බලන්න.... ඇතිදාට ඉන්න උං නැතිදාට නෑ"

පොල්බෑය, හාල්ටික, මිරිස් තුනපහ ටික අඩුපාඩු වෙද්දී මා දිව්වේ රේණු අක්කාගේ පිළිකණ්නටය. මට එසේ කිසි කෙනෙකුගෙන් අඩුපාඩු ඉල්ලාගෙන පුරුද්දක් තිබුණේ නැත. එකල මට තිබුනේ මට අවශ්‍ය දෙයක් යාන්තමින් ඇහෙන්නට කියන්නට පමණි. අම්මා හෝ ලොකු අම්මා හෝ ලොකු තාත්තා හෝ ඒ අවශ්‍ය දෙය ළඟටම ලබා දෙන්නේය.

එහෙත් විවාහ ජීවිතය තුළ ඒ ඔටුන්න බිම තබන්නට මට සිදුවිය. හිඟන ජීවිතයකට මා කෙසේ යොමු වුණාදැයි මා දන්නේ නැත.

"ඕනාවට වඩා තමුන්ගේ මිනිහ වුණත් විශ්වාසෙට ගන්න එපා උදානි... ඒකයි මං කියන්නෙ...."

"මට උහුලන්න බැරි... ගේ විකුණලා හම්බෙච්ච සල්ලි ටික විනාශ කරනෙකට."

"බොරැල්ලෙ තියෙනවා. කලණ බිල්ඩර්ස් කියල තැනක් එයාලම ප්ලෑන් එක ඇඳලා ගේ හදලා දෙනවා. අතේ තියෙන සල්ලි ටික බලලා.... ඒ ගාණට. දරුවා තියල අදම එතෙන්ට ගිහින් කතා කරන්න. නැත්තං කංචන ඔය සල්ලි ටික වියදම් කරලා තමයි පස්ස බලන්නෙ."

රේණු අක්කා කී සැටියේම මා කළේ ක්‍රියාත්මක වීමයි. අසනිව රේණු අක්කාට භාර කළ මා ඇය කී උපදෙස් අනුව බොරැල්ලට ගොස් 'කලණ බිල්ඩර්ස්' කාර්යාලය වෙත ගියෙමි.





මගේ සෑම ප්‍රශ්නයකට ඔවුනගෙන් සතුටුදායක උත්තර ලැබුණි.

ආපසු ගෙදර එන්නට බස් නැවතුමට එන අතරේ දුටු දෙයින් මම සලිත වීමි. ලක්ශානිගේ අතින් අල්ලාගෙන ත්‍රීවිලරයට නැංග්ගේ කංචනය. එකවරම මගේ හදවතට අකුණු සැරයක් පාත් වූවා සේ මා වෙව්ලුවේය.

කංචන මොනතරම් දුරට මා රවටා ඇද්ද? ඔවුන් ගියේ ජෝඩුවක් විලසිනි. මෙතෙක් පතිනි ජීවිතය වෙනුවෙන් මා පිරූ සියළු ප්‍රාර්ථනා එකවර මගේ පාමුල කඩා වැටුණා වැනි හැඟීමක් මට ඇති විය.

වහාම ත්‍රීවිලරයක් ගත් මම ඔහුගේ කාර්යාලයට ගියේ කිසිවක් නොදන්නා අයුරිනි.

"ආ....හ්.... උදානි... හදිසියේම....?"

මා දකිද්දීම ඔහුගේ මිතුරෙකු වූ සම්පත් කළබල වූ බවක් මට පෙණුනි.

"මං කංචන හම්බෙන්න කියලා ආවේ....?"

"ඉතින් කෝල් කරේ නැත්තෙ...?"

"කාඩ් එක ඉවර වෙලා අයියෙ... කෝ කංචන ඉන්නවද...?"

"කංචන.... කංචන.... කෝ මචං කංචන..?"

හදිසියේම එතැනට පැමිණි තවත් සගයෙකුගෙන් සම්පත් විමසුවේ උත්තරය ගැටගසා ගැනීමටය.

"ෂෝට්ලිව් දාලා ගියා... දෙන්නම..."

ඒ මිතුරා මා කවුදැයි දන්නේ නැත.

"දෙන්නම කිව්වෙ... ලක්ශානි වෙන්න ඇති....."

සම්පත් උත්තරය දෙන්නට පැකිලුනේය. හෙතෙම තම මිතුරාව ආරක්ෂා කරන්නේය.

"උදානි හදිසියකටද ආවෙ....?"

"හදිසියකට තමයි... මං යන්නං....."

මං ආපසු හැරුණෙමි. මොකක්දෝ පරාජයකින් මගේ මුළු ශරීරයම දුවෙන වග මට දැණුනි. මා කෙසේ ගෙදර ආවාදැයි මට මතක නැත.

* * * * *

"උඹ පෙරේතයා පොළොවෙ ගැහුවා වාගෙ නිදාගත්තම මෙලෝ සිහියක් නෑ...."

පාන්දර දෙකට පමණ මා ඇහැරුනේ රේණු අක්කාගේ වදන්ද සමඟය. මා සිහිනයක් දුටු බව මට මතක් විය. මගේ තද නින්ද බිඳෙන්නේ පාන්දර හතරට එලාම් ඔරලෝසුව නද දෙද්දිය. එහෙත් හිතේ වූ ප්‍රශ්නය නිසාම මට නින්ද ගියේ නැත.

රාත්‍රිය නිශ්ශබ්දය. මම මේස ලාම්පුව දැල්වීමි. අසනි හොඳ නින්දකය. එහෙත්... කංචන ඇඳේ නැත. ඔහු වැසිකිලියට ගියාවත්ද... මම සෙමෙන් ඇඳෙන් බැස්සෙමි. සැකය යථාර්ථයක් වී මගේ දෑස දුටු වෙලේ සිට මා ජීවත් වූයේ මැරි මැරිය. ගෙටම වී ගේ කිරිල්ලියක සේ සැහැල්ලුවෙන් හැදුණ මට බාහිර ලෝකය ගැන තිබුණ අඩු දැනුම නිසා මේ සමාජය තේරුම් ගැනීමෙ හැකියාව අල්පය. ඒ ගැන මම දැන් දුක්වෙමි.

ඉදිරිපස කාමරයේ ලා එළිය දැල්වෙයි. ලක්ශානීගේ කාමරයේ දොර අඩවල් වී ඇති අයුරු මම දුටුවෙමි. එසේ නම් ඇය අවදියෙනි කාමරයෙන් මුණු මුණු ගා කොඳුරන හඬ





ලක්ශානිගේත් කංචනගේත්ය. පාන්දර කංචන ලක්ශානිගේ කාමරයේ කුමක් කරනවාද?

"උඹ නම් ඇත්තටම ගොනෙක් නෙමෙයි ගොං බදින කණුවක්......"

මගේ සිත මුර දුන්නේය. මම මිනැවට වඩා කංචනව විශ්වාස කලෙමි. දලි කුණු අතගා දර දිය අදිමින් ඔහුටම ජේවි සිටියෙමි. ඇත්තෙන්ම ඔහුට පෙම් කරන්නට පටන් ගත් දිනයේ සිටම මා වෙන පිරිමියෙකුට සිහිනෙන්වත් පෙම් කලේ නැත. මට හයියෙන් ඉකිගැසිණ. ඒ ඉකි ශබ්දයටදෝ කළබල වූ කංචන සරම පටලවා ගනිමින් වහා මා වෙත දිව ආවේය.

"උදානි... උදානි..... ඇයි මේ....?"

මම හිස එසවූයෙමි. මා තුල අහිංසක පුරංගනාවක් ජීවත් වූ බව ඇත්තය. දැන් ඇය මිය පරලොව ගොස් මරණයේදී පාපයක් බලවත් වී යක්ෂණියකව ඉපද ඇත....

"ඇයි... ඇයි.... ඇයි... මගෙන් අහන්නෙ ඇයි කියලා.... මමනෙ අහන්න ඕන ඇයි කියලා. දවල් තිස්සෙ ඔෆිස් එකෙත් ෂෝට්ලීව් දාලා ගිහින් මඟුල් නටනවා මදිවට......"

"උදානි... කට වහගන්න...."

"කට වහගන්න... ඇයි මං කට වහන්නෙ...."

මම වියරුවෙන් මෙන් ලක්ශානි උන් කාමරයට දිව්වෙමි. අවුල් වූ කෙස් ගස් වලින් යුතුවම දුහුල් නයිටිය පිටින් උන් ලක්ශානි බිය වී මෙන් ඇඳේ පසෙකට වී උන්නාය. කංචන ඇඳගෙන උන් නිල්පාට බැනියම ඇගේ ඇඳ විට්ටමේ විය.

"උඹ කෙලෙහිගුණ නොදන්න හැතිරියක්... තවත් ඉන්ඩ නම් එපා මේ ගෙදර... පලයං.... පලයං... පලයං....."

මම ඇගේ සියළුම ඇඳුම් බෑග් අල්ලා එළියට විසි කලෙමි. ඉවසීම අවසානයේ ගිනි කන්දක් සේ මම පුපුරා ගියෙමි. මෙතෙක් කාලයක් මගේ පපුවේ අභ්‍යන්තරයේ මා දරා ගත් සියලු දුක් ගිනි ලාවා මෙන් පැගී උණුවී ගලන්නට විය. ඉදිරිපස දොර හැර ගත් මා ඇගේ සියලුම ඇඳුම් බෑග් ගේට්ටුවෙන් එහාට විසි කලෙමි. මා පුපුරා ගියේ එලෙසය.

එහෙත් ඇත්ත නම්... මා පුපුරා ගියා නොව ඔව්හු මා පිපිරෙව්වෝය.

❋ ❋ ❋ ❋ ❋

මාස කිහිපයක් ඇතුලත 'කලණ බිල්ඩර්ස්' විසින් අපට කුඩා නමුත් මහල් දෙකකින් යුතු නිවසක් සාදා දෙන ලදි. අතේ වූ මුදල් හිඟ වූ නිසා මගේ රත්තරන් බඩුත් උකස් කොට තව ලොකු අම්මාගෙනුත් ණයට මුදල් ගෙන යාන්තමින් පදිංචිවන තත්ත්වයට නිවස සාදා ගැනීමට මට හැකි විය.

නිවස සෑදීමේදී ද කංචනගෙන් කිසිම උදව්වක් තියා අදහසක්වත් නොවීය.

"ඔයාට ඕන විදිහට හදාගන්න ඔයාගෙ සල්ලිනෙ....."

ඔහු කීවේ එපමණකි. එහෙත් ඔහු වටේ සිටි මිතුරන්ගෙන් නම් අඩුවක් නොවීය. ඔහුට ඒ ගැන අවවාද දීමෙන්ද එලක් නොවීය.

"එක අතකින් දූන් ඉතින් ලක්ශානි පස්සෙන් යන්න බැනෙ. ඔන්නොහෙ පොඩි ඩ්‍රින්ක් එකක් ගත්තාවෙ."

මම සිතුවෙමි.

"අනේ ලස්සන ගේ පොඩ්ඩ උදානි... ඇත්තටම ඔයා පර්චස් දහයෙ ඉඩත් ලස්සනට ඉතුරු කරගෙන තියෙනවා."





මගේ සැලසුම් අගය කල නිශාන්ත අයියා කීවේය.

"අප්ස්ටෙයා එකක් හැදුවෙ ලොකු වුණාම අසනිට නිදහසේ පාඩම් කරන්න....."

"ආගනු කුලියට දෙන්න එහෙම නෙවේනෙ...."

නිශාන්තගේ මුහුණේ මනමාල සිනහවක් විය.

"දූන් නම් එහෙම සම්බන්ධයක් නෑ. කංචන දූන් හොඳට ඉන්නවා....."

"ඔයා හිතන්නෙ එහෙමයි නේ....?"

නිශාන්ත එසේ කීවත් යලිත් සැකයක් මගේ හදවතේ විය. ලක්ශානී කොහේ ඉන්නවාද යන්න මා දන්නේ නැත. ඇය නිවසින් පිටමං කල මොහොතේ සිට මම සැනසුණෙමි. එහෙත් අප හරිය කියා සිතන හැම තැනකදීම කොතැනක හෝ වැරදීමක් සිදුවන්නට ඉඩ තිබේ.

මගේ ජීවිතයේ හැමදාම වැරදුනේ සමාජය පිළිබඳව අඩු දැනුම නිසාත් ඕනෑවට වඩා අනෙක් අය විශ්වාස කිරීමට යාමත් නිසයි.

"ඔයා ඕනෑවට වඩා කංචන විශ්වාස කරා. කංචන නරක් කරේ ඔයා"

නිශාන්ත කෙලින්ම චෝදනාව මට එල්ල කළේය. දරුවෙකු වැරදි කලත් බැණුම් අහන්නේ අම්මාය. සැමියෙකු වැරදි කරත් බැනුම් අහන්නේ බිරිඳය. නමුත් බිරිඳක වැරදි කරොත් සැමියා බැණුම් අහන්නේ නැත. ලෝකයට ජීවය ගෙන එන ගැහැනියට සමාජය මේ තරම් ගරහන්නේ නින්දා අපහාස කරන්නේ ඇගේ උත්පත්තියේ වූ වරද නිසාදැයි මම නොදනිමි.

"දූන් ඉතින් මොනව කරන්නද.... අපි මේ ගේ පොඩ්ඩ

හදාගෙන ලස්සනට ජීවත් වෙනවා....."

"වරදක් කරලත් ඔයා තවම කංචනට ආදරෙයිද?"

"මං ඉස්සරවෙලාම ආදරේ කරේ එයාට. මගේ ෆස්ට් ලව් එකයි ලාස්ට් ලව් එකයි දෙකම එයා...."

"ඔයා නම් මාර ගෑනියෙක්."

නිශාන්ත අයියා කිව්වේය. සූරියකාන්ත මලක් සේ හැරෙන්නට මට නොහැකිය. මගේ ආදරය මගේ සැමියා වෙනුවෙන්ම වෙන් කරන්නට මට දිරි දුන්නේ අම්මාගෙන් ලද ආභාෂයයි.

"ඉක්මනට ගෙයි පදිංචි වෙන්නකෝ... ඔයා සිංදු කිය කියා ඉන්නකොට අපිටත් පාලුවක් නැතේ....."

නිශාන්ත එසේ කියමින් පිටව ගියේ දුරකථන ඇමතුමක් ආ හෙයිනි. වැඩ බිමට අවුත් සැරින් සැරේ ගෙයි වැඩ ගැන විමසා බැලුවේ මාය. පරම්පරාවෙන් ලද මුදලින් හෝ මේ ඉදිවන්නේ මගේ ශක්තියයි. මගේ ප්‍රාර්ථනාවයි. මගේ බලාපොරොත්තුවයි.

ඉදිවෙමින් පවතින නිවස දෙස නෙතුපිය නොසලා... මම බලා සිටියෙමි. පිරිසිදු හදවතත්, පිරිසිදු චේතනාවත් ඇති පතිනියකට වරදින්නේ නැතැයි මම සිතුයෙමි.

* * * * *

නිවසේ පදිංචි වීම මගේ ජීවිතයේ සතුටුතම දවසක් විය. විවාහ වූවායින් පසුව ඇත්තටම සතුට කියා දෙයක් මගේ ජීවිතයේ තිබුණේ නැත. කංචනගේ ජීවිතයේ නම් මහ වෙනසක් සිදු වුණේ නැත. ඔහු පුරුදු ලෙසින් වැඩට ගියේය. ආයේය. ගෙදරට බඩුගන්නට, බිල් ගෙවන්නට පුරුදු ලෙසින්ම ඔහු මා අතට මුදල් දුන්නේය.





අසනීප මොන්ටිසෝරියට දමා මම ආපසු නිවසට ඇවිත් අස්පස් කර අතුගා රෙදි සෝදා සියලුම වැඩ කරන්නෙමි. එදාත් මා සිටියේ නාන කාමරයේ රෙදි සෝදමිනි.

"උදානී....."

මට ඇසුණේ නිශාන්තයියාගේ කටහඬය. ඔහු අපේ නිවසට ආවේ දුරකථන ඇමතුම් ගැනීමටය. ඔවුනගේ නිවසට එතැන් දුරකථනයක් තිබුණේ නැත.

"තත්පරයක් ඉන්න නිශාන්ත අයියේ..."

මම එසේ කියමින් මගේ ඇගේ වූ වතුර බිඳු පිස දමාගෙන ඇඳුමද හදාගෙන ඉදිරියට ගියෙමි. මා ඇඳ සිටි බ්ලවුසයද වතුරෙන් පෙඟී තිබුණි.

"රෙදි හෝදුවා... ඇහුණෙ නෑ කතා කරනවා..."

"දියකිඳුරි වාගෙ....."

"කෝල් එකක් ගන්නද....?"

"හ්ම්... ආවෙ නම් ඒකට තමයි... ඒත් ඔයා දැක්කම ඒ කල්පනාවත් නැතිව ගියා."

එසේ කියමින් මා වෙත ආ ඔහු සැණෙකින් මාව වැලඳ ගත්තේය. ඔහුගේ දෑතට කිටි කිටියේ සිරවුණ මම කෑ ගැසුවෙමි.

"මෝඩි....."

ඔහු ග්‍රහණය බුරුල් කළේය. එසැනින් ක්‍රියාත්මක වූ මම අත ඔසවා වැරෙන් ඔහුගේ කම්මුලට පහරක් ගැසුවෙමි. ඔහු කැරකීගොස් බිත්තිය අල්ලා ගත්තේය.

"මගේ මිනිහ සල්ලාලයා වුණත් ඒකට මට කමක් නෑ. මං

ලැස්ති නෑ එක එකත් එක්ක නටන්න...."

මම කෑ ගසා කිව්වෙමි. ඒ හඬ රුවන්තිටත් ඇසුණාදැයි මම නොදනිමි. නිශාන්තගේ දෑස් ගිනි පුලිඟු මෙන් විය. ඒ දෑසේ වූයේ මම උඹෙන් පලිගන්නවා වැනි හැඟීමකි.

"හැබැයි මේක කංචනට කියල තිබ්බොත්... මම දනී කරන දේ...."

ඔහු කීවේය.... ඔහු පිටව ගිය පසු මම දඩාස් ගා දොර වසා දමා දොර පාමුල ඉඳ ගත්තෙමි. මොහොතකට පෙර ඒ සිදුවූයේ කුමක්ද? මට මේ කිසිවක් අදහාගත නොහැක.

කංචන වැඩ ඇරී ඇවිත් මේ ගෙදරට ගොඩවන්නට පෙර ගොඩවන්නේ ඔවුනගේ ගෙදරටය. එහෙත් තේ එක බී අවුත්.... මොහොතකට ඇඟ හෝදා ගන්නට ගෙට ගොඩවන ඔහු 'මං ටිකකට නංගිලගෙ ගෙට ගොඩ වෙලා එන්නම්' කියා පිටවන්නේ රෑ බතට ගෙයි ලිපේ ගින්දර ඇවිලෙද්දීය. ඒ ගොස් රෑ දහයට එකොළහට ඔහු ගෙදර එන්නේ මධුවිතෙන් හොඳට සප්පායම් වීගෙනය. එවිට ගෙයි ලිප ගින්දර නිවී තිබුණත් මගේ හදවතේ ගින්දර බුර බුරා නැගෙයි. එක්කාසු වී ඉන්නා යහළුවන්ද එතරම් හොඳ මිනිසුන් නොවේ.

නිශාන්ත මුල සිටම මාව ග්‍රහණයට කොටුකර ගන්නට මාන බැලුවේය. දැන් එය වැරදී ගිය කල ඔහු මගෙන් පලි නොගෙන ඉඳීවි යයි මා සිතන්නේ කෙසේද?





# පස්වැනි ගිනිදළුව

ප්‍ර: තමාගේ ස්වාමිපුරුෂයාගෙන් වෙන් වී යාමෙ අභිලාෂයක් තියෙනවාද?

උ: කිසිවිටකත් නෑ ස්වාමීනි......

ප්‍ර: හිතකවත් එහෙම අදහසක් නැද්ද?

උ: නැහැ ස්වාමීනි.....

ප්‍ර: ඔබ මෙම ගරු අධිකරණයෙන් ඉල්ලා සිටින්නේ මොනවාද?

උ: මම මේ නඩුව නිශ්ප්‍රභා කරන ලෙස ඉල්ලා සිටිනවා.

ප්‍ර: නඩුව නිශ්ප්‍රභා කරලා ඔහුගේ වාසියට ඉල්ලා සිටින දික්කසාද තීන්දුව අවලංගු කරන ලෙස ඉල්ලා සිටිනවා

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: **දික්කසාද නොවී ඔබගේ වෛවාහක ජීවිතය පවත්වාගෙන යාමට ඉල්ලා සිටිනවා.**

උ: **එහෙමයි ස්වාමීනි.**

## 5

මම කංචන නිවසට එනතුරු බලාගෙන උන්නෙමි. රෑ අට පසුවෙන තුරුත් ඔහු ආවේ නැත. සමහර දිනවලදී ඔහු මෙසේ රෑ වෙයි. රාත්‍රී දහය දොළහා වී ගෙදර එන අවස්ථාද තිබේ.

"දුව.... එන්න බත් කවන්න...."

රෑ ගත වෙද්දී මම දුවට බත් කවමි. ඇය ලබන අවුරුද්දේ පාසල් යයි. ඇය පාසලකට දමා ගන්නටත් දහදුක් විඳ පාසල් හොය හොයා ඇවිද්දේ මාය.

"මේ මං ඔයාට කිරිහොදි හැදුවා... බිත්තරේකුත් තැම්බුවා...."

අසනි දඟ ළමයෙකු වුවද මට කීකරුය. නාමික තාත්තා කෙරෙහි ඇගේ වැඩි අවධානයක් නැත. තාත්තා කෙනෙකු එන තුරු පෙරමඟ බලා සිටින දරුවන්ගේ ගණයට අසනි අයත් වන්නේ නැත. තමාට දරුවෙකු සිටින බව කංචනට අතර මඟදී මතක් වේ නම් ඇය වෙනුවෙන් කුඩා චොක්ලට්ටුවක් සීනි





බෝලයක්වත් මිලදීගෙන ආ යුතුවේ.

එහෙත්.. කංචනගෙන් එවැනි පිය සෙනෙහසක් මගේ දරුවාට ලැබුණේ නැත.

කංචන ගෙට ගොඩවන විට රාත්‍රී දහයේ කණිසම වැදුණි. ලක්ශානිව පන්නා ගත්තාට ඔහු තවම මා සමග සිටින්නේ කේන්තියෙනි. ද්වේශයෙනි.

"ඇයි කංචන මෙච්චර පරක්කු?"

ඔහු ගෙට ගොඩවන විටම මම ඇසුවෙමි. ඔහු උන්නේ තරමක වෙරි මතිනි.

"පරක්කුද..? පරක්කු.... මං අරක්කු බොන්න ගියා......"

එයට දෙන්නට මා ළඟ පිළිතුරක් නොවිය. මම ඔහු පසුපසින් කාමරයට ගියෙමි. උදේ ඇඳගෙන ගිය සුදු අත්දිග කමිසය ඔහු ගලවා ඇඳුම් රාක්කයේ එල්ලා කලිසම හා සපත්තු පිටින්ම ඇඳේ පසෙකින් ඇල වුණේ.ය කමිස කරේ වූ ලා ගුරු පැහැති ලිප්ස්ටික් පැල්ලමක් මා දුටුවේ එවිටය. සැමියා ගෙට ගොඩවනතුරු ලිපේ ගින්දර තබා රස්නෙ පිටින් බත් ටිකක් කවන්නට බලා සිටින කිසිම බිරිඳකට තවත් ගැහැනියක තම කරමත නිදි කරවා ගත් බවට කියන මේ සාක්ෂිය උහුලා ගත නොහැකි බව මම දනිමි. ඉවසා ඉවසා අවසානයේ පුපුරා යන බව දන්නේ මාය.

"මේ... ඒයි.. ඔයා කොහෙද ගියේ... අරක්කු බොන්ඩ කියල ගියේ මොන ගෑනියෙක් කරේ තියාගෙනද?"

මම ඇඳුම පොඩි කර දමා ඔහුට ගසමින් ඇසුවෙමි. විවාහක බිරිඳට මෙසේ විමසන්නට අයිතියක් නැත්තම් අයිතිය ඇත්තේ කාටද?.

"ඔය දේවල් හොයන්ඩ එපා... උදානි... තමුසෙ තමුසෙගෙ

පාඩුවෙ ඉන්නවා...."

"දෙයියනේ මං කසාද ගෑනි..... කොහෙවත් යන පර බැල්ලියෙක් එක්ක.... නටලා නටලා බුදියා ගන්ඩ විතරක් ගෙදර එනවා."

"කට වහගනිං.... උඹට කන්න දෙන්නෙ මං... දරුවට කන්න දෙන්නෙ මම මට ඕන විදිහට ඉන්ඩ බැරි නම් ළමයත් අරන් මූදට පැනලා මැරියං.... උඹේ හැටිත් මං දන්නවා.... මං නිකං අරක්කු බිව්වෙ නෑ. මගේ හිතේ අමාරුව මට කියා ගන්න කෙනෙක් නෑ."

අසනි ඇහැරෙනු ඇතැයි බියෙනුත් මේ ශබ්දය නිශාන්තගේ ගෙදරට ඇසෙනු ඇතැයි යන බියෙනුත් මම නිශ්ශබ්ද වීමි. එහෙත්.... මට එල්ල කල චෝදනාව බරපතලය.

"උඹේ හැටිත් මං දන්නවා....."

ඔහු එසේ කීවේ ඇයි......?

"කංචන.... බොරු චෝදනා කරන්න එපා.... ඔයාගෙ වැරදි වහගන්න බොරුවට මගේ පිට වැරදි පටවන්න එපා."

"උඹ කවින්දයා එක්ක නටපු නඩලං මං දන්නවා....."

"මේ මොනවද කියන්නෙ....?"

"මේ පාරෙ හැම එකාම උඹට කෙලගහනවා. මම උදේ ගියාම රෑ වෙලා ගෙදර එනවා. දවල් තිස්සේ මේ ගේ ඇතුලෙ මොනවා වෙනවද කියන්න මං දන්නෙ නෑ. රටේ ලෝකෙ මිනිස්සු කතන්දර කියනවා...."

එසේ කියමින්..... ඔහු නැඟිට ඇඳුම් රාක්කයේ දමා තිබුණ ටී ෂර්ට් එකක් ඇඳ ගත්තේය.

"ඔය කොහෙ යන්නද දූන්....?"





"මම කිව්වනෙ.. මං ගැන හොයන්න එපා කියලා...."

ඔහු යන්නේ අල්ලපු ගෙදරටය.

මස්සිනා සමඟ එකතු වී නවත් මධුවිත සප්පායමටය. මේ පවුල් ජීවිතය විනාශ වී ගෙන යන හැටි මට දැනෙයි. මගේ ඇසේ කඳුළු නැති වෙලාවක් නැති තරම්ය. දුක්ගිනි උහුලන තරම දන්නේ මායි. කෑම ටික පිරිමසා ගෙන දුවටත් කවා බඩගින්නේ ඉන්නා තරම දන්නේ මාය. එනමුත් මා කැවාද බිවාද කියාවත් සොයා නොබලන කංචන තවත් ගැහැණියකගේ උණුසුමෙහි සැනපෙන විශ මා කෙසේ විශ්වාස කරන්නද....? කමිසයෙහි ලිප්ස්ටික් ආලේපන පැල්ලම් දුටු පළමු දිනය අද නොවුණත් මා සිතුවේ බස්රථවල හිරවී ගෙදර පැමිණෙන විට එය සාමාන්‍ය දෙයක් බවය.

එනමුදු මට ඒ සැකය නැතිව ගියේ අදය. ලක්ශානි නොවේ නම් කවුරුන් හෝ ගැහැනියක සුදානම් කරගෙන ඇති බව මට දූන් පැහැදිලිය.

හඬනවානම් වැළපෙන මහ සාගරය සේ මට හැඬිය හැකිය. පතිනියකට මීට වඩා දුකක් නොතිබිය යුතුය. මා ඇවිත් ඉන්නේ අනපය අනැතිව විතරක් නොවේ. ලක්ෂ දාහතරක මුදලක් ඔහු ගැන විශ්වාසයෙන් ඔහු අත තැබුවේ මාය.

"හැමදාම වගේ උඹ අදටත් මෝඩයි."

මගේ සිත මට කීවේය. හිතේ දරා ගත නොහැකි දුකක් උතුරා යන විට මට නිතැතින්ම උපුල් සිහිපත් වේ.

ඔහු ආදරයක් වෙනුවෙන් සියදිවි හානි කරගත් පිරිමියෙකි. මා ආදරයක් වෙනුවෙන් මැරි මැරි ජීවත්වන ගැහැනියකි.

* * * * *

අසනිව කොළඹ ජනප්‍රිය පාසලකට දමා ගත් මම පුරුදු දුක අනුභව කරමින්ම දරුවා වෙනුවෙන් කැපවීමි. උදයට ඇයව පාසල් රැගෙන ගියේ මාය. රැගෙන ආවේද මා විසිනි. කංචනගේ පුරුදු ජීවිතය වෙනස් වූණේ නැත. ඔහු වෙනස් කලේ වෙන කවුරුවත් නොව නිශාන්ත විසිනි. ඔහුගේ අදහසට මා එකඟ නොවූ නිසා කංචනගෙන් මා වෙන් කරවන්නට ඔහු උත්සාහ ගත්තේය.

"ආ... ළමයා ඉස්කෝලෙ දාන්න යනවද නෝනා... ළමයා දාලා ෆස්ට් ඇපොයින්මන්ට් එක මට දෙනවද.....?"

මම අසනිව පාසලට රැගෙන යමින් සිටියෙමි. පාසල් වෑන් රියකට දෙන මුදල් ඉතුරු ඉතුරු කර ගැනීමට මම මහ පාරට වූ කෙටි දුර පයින් අවුත් පාරේ බස් රථයක පාසලට යන්නට පුරුදු වුණෙමි.

එක් වරම අප පසුකොට ගිය ත්‍රීවිලර් රථයක රියදුරා කී දෙය මට හරියට තේරුම් ගියේ නැත. මා සිතුවේ ඔහු 'හයර්' එකක් යන්නට කතා කල බවය. එසේත් නොමැති නම් දරුවා පාසලට දමා කොහේ හෝ යනවා නම්.... ඔහුගේ ත්‍රීවිලරයේ යන්නට ආරාධනා කල බවය.

"මොකක්ද මල්ලි කිව්වෙ....?"

"නෝනගෙ ජොබ් එකේ ෆස්ට් ඇපොයින්මන්ට් එක මට දෙනවද කියලා ඇහුවෙ... මං ගාවත් සල්ලි තියෙනවා...."

ඔහුට අත දිග හැර කණට ගැසීමේ අවශ්‍යතාවයක් මට විය. එහෙත් මම සන්සුන් වීමි.

"කවුද ඔය මල්ලිට කීවේ මං එක එකාගෙ සල්ලි ගන්න ඒ වාගේ රස්සාවක් කරනවා කියලා... මාව දැක්කහම එහෙම හිතන්න පුළුවන් ද?"





ඔහු නිශ්ශබ්ද විය.

"සොරි නෝනා... නෝනගෙ මහත්තයා බොන්න සෙට් වුණ වෙලාවක අර නිශාන්ත මහත්තයට මය ගැන කියල තියෙනවා... මගෙ ආටා එකේ හයර් යන මහත්තයෙකුත් මට ඒ ගැන කිවා."

"එහෙමද.....? හරි... එහෙනම් මං මගෙ ෆස්ට් එපොයින්මන්ට් එක දෙන්නං ඔයා කීයක් දෙනවද මට....?"

ඔහු හැකි වේගයෙන් ත්‍රීවිලරය හසුරුවාගෙන යන්නට ගියේය.

"කවුද අම්මි ඒ....?"

අසනී මගේ අතේ එල්ලීගෙනම විමසුවාය. මගේ දෑසේ වූ කඳුළු ඇගෙන් හංගා ගන්නට මම දැඩි ප්‍රයත්නයක යෙදුණෙමි. මා දියණියගේ ගරුත්වය රකින්නේ කෙසේද? කංචනත් නිශාන්තත් එකතු වී මේ පතුරුවා ඇති කතාව කුමක්ද?

"ඇයි අම්මි අඬන්නේ....?"

"මොකුත් නෑ දුව... මේ ඇහැට රොඩ්ඩක් ගියා....."

"ඒ අංකල් අම්මිට බැන්නද?"

"නෑ... නෑ... දුව... අපි යංකො පරක්කු වුණා....."

"කකුල් රිදෙනවා...."

"ඉන්න මං වඩාගන්නං...."

මං අසනිව වඩාගෙනම බස් රථය ගැනීමට පාරට ඇවිද ගෙන ගියෙමි. එහෙත් මට ඕනෑ වූයේ වහාම ගෙදර අවුදින් කොට්ටය බදාගෙන හඬන්නටය. මා මවකි. තම අම්මාට පණ සේ ආදරය කරන කංචන. මාත් ඔහුගේ දරුවාගේ මව බව සිතිය

යුතුය. කංචන පමණක් නොව සෑම පිරිමියෙකුම තම ආදරණීය මවට සේම තම දරුවාගේ මවටද ආදරය කරන්නේ නම් පතිනි ලෝකය මීට වඩා මොන තරම් සුන්දර වේද?

❋ ❋ ❋ ❋ ❋

"මොකක්ද කංචන මේකෙ තේරුම ඔයාට දරුවවත් ටිකක් හුරතල් කරන්න වෙලාවක් නෑ.... ගෙට එන්නත් ඉස්සර ගොඩවෙන්නෙ අරුන්ගෙ ගෙදරට"

කංචන ආ විගස මම ඇඟට කඩා පැන්නෙමි. දූත් දියණියට වයස අවුරුදු හතකි. මේ අවුරුදු හත පුරාවටම කංචන තම අතින් බත් ටිකක් දරුවාට කවා නැත. පාසලේ වැඩකට උදව්වක් දී නැත. දෙමාපිය රැස්වීම්, විවිධ ප්‍රසංග, ක්‍රීඩා උත්සව, පෙරහැර ශීල ව්‍යාපාර ඔය හැම එකකටම ගියේ මාය.

"ඔයාට තියෙන තරහා මොකක්ද නිශාන්ත අයියත් එක්ක.... ඔයාට ඒ මිනිහව දූලේ දාගන්න බැරි වුණ හින්දද....?"

"කංචන... ඔයා ඔයාගෙ වැරදි වහගන්න ඇයි මට මේ තරම් පද හදන්නෙ... ඔය මිනිහට ඕන බොරු කියල අපේ පවුල විනාශ කරලා දාන්න. මාත් එක්ක මොන තරහක්ද මන්ද...."

"මං ගිහිං ඉක්මනට එන්නං...."

"හම්බ කරන සතපහත් බොන්ඩ වියදම් කරාම කොහොමද?"

"ඔයාට අඩුපාඩු කරලා නෑ."

ඔහු පිටව ගියේය. මට අර දේ මේ දේ අඩු යයි මා ඔහුට කියන්නට යන්නේ නැති නිසා ඔහු මගේ අඩුපාඩු දන්නේ නැත. සෙරප්පු දෙක කුට්ටම ගෙවී ගොස් ඇත. යටසාය ඉරී ඇත. යට ඇඳුම් පුස් අල්ලා ඇත... අළුත් ඇඳුමක් ඇන්ද කාලයක් මතකයේ





නැත. මෙ විවාහ ජීවිතය වෙනුවෙන් මා නොකළ කැපවීමක් නැති තරම්ය.

එවැනි බිරිඳකට "මට ඕන විදිහට ඉන්න බැරි නම් ළමයත් අරන් මූදට පැනල මැරියං" යයි කීවේය.

ඒ කතා කළේ ඔහුද ඔහුගේ සිරුරට කැවී තිබුණ විසදයි මම අදටත් නොදනිමි. ඒ කෙසේ වෙතත් ඔහු ලක්ශානී සමග හෝ වෙනත් ගැහැනියක සමග සම්බන්ධයක් පවත්වාගෙන යන බවට මට සාක්ෂි හමුවිය. වරෙක ඔහුගේ කලිසම් සාක්කුවක තිබී නිවාඩු නිකේතනයක බිල්පතක් මට හමුවිය. තවත් වරෙක වැල්ලවත්ත සිනමාහලේ චිත්‍රපටියක් නැරඹූ බවට සාක්ෂි කියමින් ටිකට්පත් දෙකක් හමුවිය.

මා මෙ දේවල් විමසන්නට ගියහොත් සිද්ධ වන්නේ රණ්ඩු වීමටය. අසනි දූත් ලොකුය. ඇයට යම් යම් කාරණා වැටහෙයි... ඇගේ පාසල තුල ඇය ගෞරවනීය සිසුවියක විය යුතුය.

ඒනිසා මම සියල්ල ඉවසා ගතිමි. දිනයක සැනසීම මා කරා එනු ඇතැයි විශ්වාසයෙන් මගේ ප්‍රේමය වෙනුවෙන් මම ඒ සියල්ලම ඉවසා ගත්තෙමි

# හයවැනි ගිනිදළුව

ප්‍ර: ඔබ කොහොමද මෙය සමාජ රෝගයක් කියලා හඳුනාගත්තේ?

උ: මගු කස කසා දඟලන්නට වුණා. ඊට පස්සෙ මං කිව්වා දොස්තර කෙනෙක් ළඟට යමු කියලා. නුගේගොඩ හිටිය දොස්තර කස්තුරිරත්න ගාවට මම ඔහුව එක්කරගෙන ගියා.

ප්‍ර: මෙය බෝවන රෝගයක්......

උ: එහෙමයි ස්වාමීනි......

ප්‍ර: ඔබ දෙදෙනා වෙන් කලේ මෙම රෝගය බවයි කියන්නෙ.

උ: එයා කිව්වා... අපි එකම කාමරයේ හිටියොත්.... ඔයාටයි දුවටයි බෝවෙන්න පුළුවන්. ඒ හින්ද මම උඩ තට්ටුවට යන්නම් කියල.





## 6

මට දූන් අපූරු රාජකාරියක් තිබේ. ඒ සැම මවක්ම සෙනෙහසින් පවරා ගන්නා රාජකාරියකි. සොබාදහම මා ආරක්ෂා කිරීමට හෝ මට තවත් දුක් දෙන්නට බැරිකමටදෝ මට තවත් දරුවන් දුන්නේ නැත. චූටි කාලයේ අසනි 'මල්ලියෙක් ගෙනත් දෙන්න' කීවත් දූන් ඇය එසේ කියන්නේ නැත.

හේතුව දූන් ඇය දහතුන් හැවිරිදි ළමිස්සියක වීමයි

"අම්මා අදත් එනවද මාව ක්ලාස් දාන්න."

මා කුස්සියේ ඇගේ බත්පත බෙදමින් සිටියදී අසනි කුස්සියට පැමිණියාය. තාත්තා දෙන සොච්චමෙන් මම කෙසේ හෝ ඇයව ලොකු මහත් කළෙමි.

"නැතුව... ඔයාව තනියම යවන්න පුළුවන්ද?"

දූන් ඇය නව යොවුන් විය කරා එළඹෙමින් සිටින්නීය. අවුරුදු දහතුනක් වූ ඇය තවම මල්වර වී නැති හෙයින් මගේ

රාජකාරිය වූයේ ඇය යන යන පස්සෙන් යෑමය. පුරුදු ලෙසින් ම ඇයව පාසල් ගෙන ගියේ රැගෙන ආවේ මායි. ඇයට අමතර පන්ති නිමවන තුරු මා ඒ අභියස ගහක් මුල හෝ වාඩි වීගෙන කල් මැරුවෙමි. අව්වැසි ගැන සලකන්නට මට කාලයක් තිබුනේ නැත. මට වටිනාම දේ වූයේ දුක සේ හදාගත් මගේ දරුවාගේ ජීවිතයයි.

දියණිය පාසල් යාමට සූදානම්වන විට අමුත්තෙක් අවුත් අපේ ගෙදර ගේට්ටුව අභියස විය.

"මිසිස් තැන්නෙකුඹුර...."

"ඔව්... මම"

"මෙ ගේ විකුණනවා කියන ආරංචියට මම ආවෙ.

මම ඔහුගේ හිසේ සිට පාදාන්තය තෙක් විමසිල්ලෙන් බැලුවෙමි. මේ පුද්ගලයා වැදගත් පාටය. එහෙත්....

"මේ මහත්තයා කවුද?"

"මම විජේසූරිය.... නාවල ඉන්නෙ."

"කවුද කිව්වෙ ගේ විකුණනවා කියලා."

"මම ආවෙ ආරංචියකට.... මම ගෙයක් හොයනවා.... එතකොට මේ ආරංචිය ආවේ."

"සොරි මිස්ටර් විජේසූරිය. ඒක වැරදි ආරංචියක්. මේ ගේ විකුණන්නෙ නෑ...."

ඒ පුද්ගලයා හා පෞද්ගලික කේන්තියක් නොමැති වුවද මම ඒ ටික කියා දැම්මේ මූණට දමා ගසන්නාක් වැනි ස්වරයෙනි.

දුක සේ හදා ගත් මේ ගේ පොඩ්ඩ මට මගේ හදවත බඳුය. මේ ගෙතුල මා ගිනි ගොඩක පිච්චුණත්.... කංචනගේ ඉඩමක





වූව ගෙය ගොඩ නැගුණේ මගේම රුචිකත්වය හා අවශ්‍යතාවය පරිදිය. කංචනගේ දැනුමෙන්වත් සහභාගිත්වයක් නොවීය. එසේ දහදුක් විඳ හදා ගත් ගෙය.... විකුණන්නට යන්නේ කාගේ තීරණයකටද?

"මොකද අම්මා හැමතිස්සේම කේන්තියෙන්...."

අසනි කුස්සියට පැමිණියාය. මම ඇගේ පිටේ එල්ලා තිබුණ බෑගය ඇර එයට කෑම පෙට්ටිය හා වතුර බෝතලය දැම්මි.

"ඔයාටත් පේන්නෙ එහෙමද....? කේන්ති යන්නෙ නැද්ද ඔයාගෙ තාත්තන්ඩි කරන වැඩ වලට...."

"අම්ම හැම තිස්සෙම තාත්තට බනිනවා."

"නැතුව වඩාගෙන කකුල් දෙකේ තියලා නලවන්නද... අන්න... වෑන් එක ආවා දුවන්න...."

අසනි වහා දුව ගොස් පාසල් වෑන් රියට නැගුණාය.

මගේ දවසේ ඊළඟ රාජකාරිය වන්නේ රෙදි සේදීමය. අසනිගේ සියලුම රෙදිත් කංචනගේ සියලුම රෙදිත් සේදුවේ මා විසිනි. කොටින්ම දියණිය ඇගේ යට ඇඳුමක් පවා සෝදා ගත්තේ නැත.

"ඉගෙනගන්න ළමයනෙ...." මා සිතුවේ එහෙමය. නමුත් මට වැරදුණ බව වැරදෙන තුරුම මට දැණුනේ නැත.

රෙදි සෝදා අහවර වී මම ගේ අතුගාන්නට පටන් ගත්තෙමි.

අසනිත් මාත් සැමියාත් නිදාගත්තේ පහළ තට්ටුවේ වූ කාමරයේමය.

තවත් ගෙයක් සෑදීමට හෝ මිලදී ගැනීමට අපට වත්කමක්

නැත. කංචනව උසිගන්වන්නේ නිශාන්ත බව මම දනිමි. අසනීද ඒ නිවසත් සමග ආශ්‍රය වැඩිය. ආච්චිලා නැන්දලා ඉන්නේ දුන්ය. කුඩා කල දරුවා වදා දවස් දෙකෙන් තුනෙන් උයාගෙන කන්නට නියම කළ වග... වේදනාවෙන් කෑ ගසන දරුවාට බෙහෙත් ටිකක් පොවා ගන්නට කෙනෙකු නොසිටි වග ඔවුනට දූන් අමතකව ඇත.

"අම්මා ඇයි ආච්චිලත් එක්ක ඔච්චර තරහා....? ආච්චිලා කොච්චර හොඳද?"

අසනි වරෙක මගෙන් එසේ ඇසුවාය.

"ඔයා මලක් වගේ පිපීගෙන එනකොට තමයි අම්මටයි තාත්තාටයි දෙන්නටම ආදරේ පහළ වෙලා තියෙන්නේ....."

"අනේ මන්දා... අම්ම නම් හරි නපුරුයි."

"ඔව් දැන් ඉතින් හැමෝටම පේන්නේ මගේ නපුරුකම තමයි. එහෙම නොවුණ නම් බලාගන්න තිබ්බා කට්ටියම මෙතන වඩිග පටුන නටන හැටි......"

"ඒ මොකක්ද අම්මා.....?"

"යන්න යන්න මෙතනින්.... මාව අවුල් නොකර......"

මම එසේ අසනිව පන්නා ගත්තෙමි. එහෙත් දූන් දූන් මට දුනෙන්නේ. දියණියද මගෙන් ඈත්ව යන හැටිය. නැන්දා. ආච්චි, නැන්දාගේ පුතු අශේන්, නිශාන්ත මාමා... ඒ සියල්ලන්ම ඇයට ලොකුය. ඊනැවට වඩා නැන්දලාගේ දිහා යන්නට එපා යයි මා අවවාද කළත් අසනී ද හිතුවක්කාරය.

"ඒ මගේ නැන්දා... අපට වෙන නෑයො ඉන්නවද?"

"මෙච්චර කල් උඹව හැදුවෙ... මේ අත් දෙකෙන්... උඹ බඩගින්නෙ අඬන කොට ණයට ගෙනත් හරි කන්න දුන්නෙ මං...





එනකොට ඔය නෑයො එකෙක්වත් හිටියෙ නෑ."

මම ආඩම්බරයෙන් කියමි. නිශාන්තට අවශ්‍ය අසගේ පවුල විනාශ කර මගෙන් පලි ගැනීමටය. මා ඔහු වෙත හිගමන් යදින තත්ත්වයට පත් කිරීමටය.

මා ගැන වැරදි කතා පතුරුවමින් කංචනගේ අනියම් සම්බන්ධතා සඳහා උදව් කළේ නිශාන්තය. ඔහුට මාව එපා කරවන්නේ ඔහුය. දූන් ඔහු හදන්නේ මගේ දරුවාත් මගෙන් ඈත් කරන්නටය.

මේ නම් ඔහු සංසාරයේ මා සමග පතාගෙන එන වෛරයක් යයි මට සිතේ.

* * * * *

"අම්මා හැමදාම ක්ලාස් එක ළඟට වෙලා නැම්බි නැම්බි ඉන්න ඕන නෑ... මට පුළුවන් තනියම එන්න...."

දියණියගේ අමතර පන්තියෙන් ඇයව එකතු කරගෙන එන්නට ගිය විට ඇය කීවාය. ඇය මේ කතාව දූන් ටික කාලයක සිට කියන්නීය.

"ඔයා වගේ ළමිස්සියෙක් කොහොමද තනියෙන් එන්නෙ මෙ අපටත් පාරක තොටක යන්න බැරිව ඉන්න කොට....."

"අපෝ... අම්මට වාගේ ත්‍රීවිල් කාරයොයි වල් මිනිස්සුයි මගෙ පස්සෙන් එන්නෙ නෑ...."

මම පිච්චුණෙමි. දියණිය මේ කියන්නේ මොනවාද? ඇගේ ඔළුවට මේ විෂබීජ දමන්නේ කවුද?

"මොනවද ඔයා මේ කියන්නෙ අසනී?"

"නිශාන්ත මාමා කියනවා මට ඇහුණා... ආච්චිත් කිව්වා...

අම්ම එච්චර හොඳ නෑ කියලා...."

මුළු ලෝකයම ඇඟිල්ල දිගු කරත් තම දියණියගේ මුවින් මෙවැනි දෙයක් අසාගෙන මවකට දරාගෙන සිටිය හැකිද?

"ඒ ගොල්ල මාත් එක්ක තරහට එහෙම කියන්නෙ. ඔය හැමෝටම ඕන අපේ පවුල විනාශ කරලා දාන්න... ඔයා පුංචි කාලෙ ඔය කවුරුවත් හිටියෙ නෑ."

මම මගේ කඳුල සඟවාගෙන කීවෙමි. ඇත්තෙන්ම දූන් මගේ නෙතින් ගලනුයේ කඳුළු නොව ලේ දියයි. පිටවන්නේ සුසුම් නොව ගිනි පුලිඟුය. මේ සියල්ලෙන්ම දැවෙන්නේ මගේ හදවතය.

"ඔයා මීට පස්සෙ... අල්ලපු ගෙදරට යන්නෙ නෑ තේරුණාද? එක එකා ඔළුවට විෂබීජ දානවා....."

ගෙදර ආපසු මම අසනිට තරවටු කළෙමි.

"අම්මගෙ තියෙන නපුරුකම ආච්චිලා කියන්නෙ ඇත්ත තමයි......"

"මොනවද උන් උඹට කියන්නෙ...."

"කියන්නෙද... අම්මා වල් ගෑනියෙක් කියල. නටලා... නටල තාත්තාගෙ කරේ එල්ලුණාලු...."

කොහොම ගැහුවාද කියා මට නොතේරේ. මම 'චටාස්' ගා අසනිගේ කම්මුලට පහරක් ගැසුවෙමි. ඇය ඉන් වේදනාවට පත්වූවාය. ඇය අඬාගෙන අල්ලපු ගෙදරට දුව ගියේ 'අම්මා මට ගහනවෝ' කියාගෙනය. මම කේන්තියෙන් දැවී ගියෙමි. පිච්චී ගියෙමි. අළු බවට පත් නොවුණා පමණය.

කංචන ගෙට ගොඩ වූයේ ඒ ඇසිල්ලේය.





"තමුසෙට මොන යකෙක් වැහිලද කියලා මට තේරෙන්නෙ නෑ.... මොකද දුවට ගැහුවෙ?"

කංචන කාමරයට ආවේ එසේ කියාගෙනය. ඇත්තෙන්ම මගේ කේන්තියේ වූ තරමට ඔහුව බිම පෙරලාගෙන මොකකින් හෝ දමා ගසන්නට මට සිත් විය.

"මම දුවගෙ අම්මා... මට ගහන්න අයිතියක් නැද්ද? තවත් ඒකිගෙ ජංගියේ ඉඳන් හෝදන්නෙ, කවන්නෙ, පොවන්නෙ මම.... මට අයිතියක් නැද්ද වැරැද්දකට දරුවෙකුට ගහන්න?"

මම කෑ ගසමින් ඇසුවෙමි. මගේ හඬ අල්ලපු ගෙදරට වුවද ඇහෙන තරම් උස් විය.

"මොකක්ද දරුවා කරපු වැරැද්ද?"

"වැරැද්ද දරුවගේ නොවෙයි.... ඒකිගෙ ඔළුවට විෂබීජ දමන එවුන්ගේ....."

"ඇත්ත කතා කරනකොට කේන්ති යනවා ඒකට අර අහිංසක කෙල්ල මරාගෙන කන්න හදනවා..."

කංචන එසේ කියා කාමරයෙන් පිට විය. ඔහුත් ගියේ අල්ලපු ගෙදරටය. තාත්තයි දුවයි රෑ කෑමටවත් ගෙදර ආවේ නැත. මම හවහින්ම ඉදි ආප්ප තම්බා රෑට කන්ට සාලයින් හොද්දක් හදා පොල් සම්බෝලයක් හැදුවෙමි......

කන්නට කිසි කෙනෙකු නැත. මේ ගෙදර සතුට සමගිය පලා ගියේ කවදාද? මගේ දියණියත් මට අහිමි වූයේ එදාය. උපතින්ම මුරණ්ඩු, හිතුවක්කාර ගතිගුණ රැගෙන ආ අසනි මෙල්ල කිරීම පහසු දෙයක්ද නොවීය. මේ ඇගේ සෙල්ලක්කාර වයසය.

දියණියට අත එසවීම වරදක්ද? ඇය තම හැදුවැඩූ මවගේ චරිතය එසේ ඝාතනය කිරීම සාහසික ක්‍රියාවක් නොවේද? දුව

හදා වඩා ගන්න මා විඳි දුක් කන්දරාව ඇය දන්නේ නැත.

තාත්තාත් දුවත් ගෙදර ආවෙ නිශාන්තලාගේ ගෙදරින් රෑට ආහාර ගෙනය. ඒ වන විට රෑ දහය පසු වී තිබුණි.

"කංචන......"

ඒ වන වට මම තරමක් නිවී උන්නෙමි. කංචන වෙනුවෙන් මා මේ ඉවසන ඉවසිල්ල වෙනත් ගැහැනියක ඉවසනනේ නැත. ලක්ෂානි සමග සම්බන්ධය කංචන දිගටම පවත්වාගෙන යන්නක් බවද ඊට උදව් කරන්නේ නිශාන්ත බවද මම දූත් දනිමි.

"ඔයා කිව්වද මේ ගේ විකුණනවා කියලා කාට හරි...."

කංචන උත්තර දෙන්නට පමා විය. ඔහුගේ හැසිරීම අනුව එයට උත්තරයද මට සිතා ගත හැකිය.

"අද මිනිහෙක් ආවා ගේ විකුණනවද කියලා අහගෙන...."

"වැරදීමක් වෙන්න ඇති."

"ඒක මං දන්නෙ නෑ... මේ ගේ හදාගත්තෙ විකුණන්න නෙමෙයි. මේක විකුණලා මට පාරට බහින්න තමයි වෙන්නෙ....."

කංචන නිහඬව වැසිකිලියට ගියේ සිගරට්ටුවක්ද පත්තු කරගෙනය.

* * * * *

"අසනිට පුරුදු වෙන්නත් එක්ක තනියම පන්ති යන්න දෙන්න.... ඔයා පස්සෙන් යන්න ඕන නෑ...."

කංචන මට කීවේ කාලය කෙමෙන් ගෙවී යද්දීය.





"අතික ඊළඟ අවුරුද්දෙ ඔලෙවල් කරනවා. පුංචි ළමයෙක් නෙමෙයි. පස්සෙන් ගිහින් අල්ලන්න තරම් හොරයක් ඒ දරුවගෙ නෑ."

කංචන දිගින් දිගටම කිවේය.

"මං මෙච්චර කල් පරෙස්සම් කළා...."

"එයා දන්නවා පරෙස්සම් වෙන්න"

"ඒ වුණාට ඉතින් ගමේ කවූ උල් කරන්න ඕනෙ නැනෙ."

එවෙලෙහි හිතේ වූ තරහව නිසාම මම කංචනව රිදවූයෙමි. ඔහු එය තේරුම් ගත් නිසාදෝ නිහඬව මා කෙරෙන් ඉවතට ගියේය. අසනීට ද දූත් මාව පෙනෙන්නේ කරදරයක් ලෙසිනි. මා මේ තරමට ඇය වෙනුවෙන් කැප වූ වග දූත් ඇයට මතක නැත.

"එයා ඉල්ලන්නෙ නිදහස. ඒ නිදහස මොකටද කියන්න මං දන්නවා."

"දුව ගැන සැක හිතන්න එපා උදානි. ඔයත් බස්සෙකේනේ ඉස්කෝලෙ ගියේ ආවේ."

"මං වගේ නෙමෙයි.... එයාට තේරෙන්නෙ නෑ...."

"ඔයා එයාව කොටු කරගෙන ඉන්න හදන්නෙ. ළමයට සමාජෙට යන්න ඉඩ දෙන්න."

ඒ වාදයෙන් කංචන ජය ගත්තේය. මා අසනිව ආරක්ෂා කලේ මැණිකක් ලෙසිනි. ගෙදර කිසිදු වගකීමක් නොගත් තාත්තාට හදිසියේ දරු කැක්කුම පහළ වුණ හේතුව කුමක්දැයි මම නොදත්තෙමි. සමහර විට මා එළියට යන එක වළක්වන්නට කංචනට උවමනා වුණා වන්නට ඇත.

අසනි තනිවම පන්ති යන්නට පටන් ගත්තාය. ඇය ඇඳුම ගැනීමට, සාප්පු සවාරි ගියේ තාත්තා සමඟය. යහළුවන්ගේ උපන්දින උත්සව ආදියට රැගෙන එන්නට ගියේ තාත්තාය. මෙකල ඇය කංචනට බෙහෙවින්ම ළංව සිටියාය.

"තාත්තගෙ ආදරේ හොයන කාලෙනෙ උදානි. කොහොමටත් දූවලා ආදරේ කරන්නෙ තාත්තලට. අපේ දූවත් එහෙමයි. හැමදේම කරන්නෙ අම්මා... ඒත් ආදරේ තාත්තට...."

මට ඉරෝමි හමු වූයේ නුගේගොඩ පොළේදීය. නිවසට අවශ්‍ය එළවළු මාළු ආදිය මිලට ගැනීමට මා ගියේ නුගේගොඩ පොළටයි. හදිසියේම හමු වූ ඉරෝමි තේ එකක් බොමින් කතා කරන්නට අසළ වූ 'ටී ෂොප්' එකකට රැගෙන ගියාය.

"ඒ වුණාට ඉරෝ.... මට දැනෙනවා අසනි මගෙන් ටික ටික ඈත් වෙනවා කියලා...."

"ඒ එයාලගෙ වයසත් එක්ක එයාලා වෙනස් වෙන හැටි. අපිට හිතුණට හැම තිස්සෙම අතින් අල්ලන් යන්න පොඩි ළමයි කියලා එයාලා හිතන්නෙම අත අත් ඇරලා තනියම යන්න."

ඉරෝමි එසේ පැහැදිලි කරද්දී මගේ විඩාපත් සිතට යම් සැනසිල්ලක් ලැබුණි.

"කොහොමද උපේඛාට...."

"උපේඛා ඔස්ට්‍රේලියා ගිහින්, අපි දන්නෙත් නෑ. මේ ළඟදි මහත්තයයි පුතාල දෙන්නයි එක්ක ඇවිත් ගියාලු ඔයා පුදුම වෙයි. උපේඛා බැන්දෙ කවුද කියලා දැන ගත්තොත්."

කාලය වේගයෙන් ගලා ගොස් ඇත. නිවසටම වී නිවසේ වැඩත්, කංචනගේ හා අසනීගේ වැඩවලට හිර වුණා මිස මට සමාජ ජීවිතයක් තිබුණේ නැත. පොතක් පත්තරයක් බලන්ට රූපවාහිනිය නරඹන්නට වේලාවක් තිබුණේ නැත.





"උපේඛා... කවුරු බැන්දත් උපුල් සුපයිඩ් කර ගත්තෙ උපේඛා හින්ද?"

"උපේඛා බැන්දෙ කවින්දව... උපේඛා උපුල් එක්ක යාළුවුණෙත් කවින්දගෙ උවමනාවට."

"කවින්දට තිබුණ අමාරුව මොකක්ද උපුල්ගෙ ඇගේ උපේඛාව ගහන්න."

"කවින්දට බයක් තිබුණා උපුල් ඔයා එක්ක එෆෙයාර් එකක් ඇති කර ගනියි කියලා."

"දෙයියනේ ඒක එහෙම වුණා නම්... මම උපුල්ට ආදරේ කරා නම්... අපි අද මොන තරම් සන්තෝෂෙන් ජීවත් වෙනවද?"

මම මගේ ජීවිතය ගැන අප්‍රමාණව දුක් වූ ගැහැනියක වෙමි. කංචන කවුදැයි මා හරිහැටි අඳුනාගත්තේ විවාහයෙන් පසුවය.

"ඔයා උපුල්ට දැන් ආදරේ කරනවද....?"

"මට ඒක තේරෙන්නෙ නෑ... මං පන්සලකට ගොඩවෙන, මලක් පානක් පූජා කරන හැම වෙලාවකම උපුල්ට ඉන්න තැනකට සැනසීමක් ලැබෙන්න කියලා පිං දෙනවා...."

"ඔයා උපුල්ට ආදරේ කරා...."

"මට උපුල් ගැන මහ ලෝබකමක් තිබුණ. මං කවදාවත් හිතුව දෙයක් නෙමේ වුණේ... සමහරවිට උපේඛා ඉස්සර නොවුණ නම් ජීවිතේ පස්සෙ කාලෙක අපි අපට අයිති වෙන්න තිබුණ...."

මම මගේ හදවතේ තියන ඇත්තම ඇයට කිවෙමි. ඇත්තෙන්ම මා උපුල්ට ආදරේ නොකලේ ඇයි? ආදරය තාවකාලිකය. මිතුදම සදාකාලිකය යන සංකල්පයේ මා උන්නාද?

නොඑසේ නම් ඔනෑවට වඩා හැදිච්චකම රැකගන්නට ගොස් මා උපුල්ව නැති කර ගන්නාද?

"දැන් ඉතින් අතීතේ කරණම ගහලා වැඩක් නෑ. කංචනත් එක්ක සන්තෝසෙන් ඉන්න... ඒ දවස්වල පැනල ලව් කරානේ...."

"ඇත්තටම කියනවානම් ඉරෝමි. ඒ උපුල් මැරුණු දවස්.... මං බෑ කියලා කිව්වොත් කංචනත් සුසයිඩ් කර ගනියි කියලා මට හිතුණ. මොකද ඒ දවස් කංචන මට මැරිගන ලව්නේ...."

ඉරෝමි සිනාසුණාය. ඒ සිනහවද අතීතයට ද අයිතිය. කඳුලද අතීතයට අයිතිය. වර්තමානය වනාහි එකම ගිනි ජාලයක් බඳුය.

"මට මගෙ ජීවිතේ ගැන ලොකු දුකක් දැනෙනවා. කංචනගේ වෙනස්වීම මට දරාගන්න පුළුවන්. ඒත් දුව වෙනස් වුණේ කොහොමද? "

"එයාව වෙනස් කරලා....."

"එහෙම වෙනස් කරන්නෙ කොහොමද? මං එයාගෙ අම්මා... කවුරු මොනවා කිවත් එයා වුණත් තමන්ගෙ අම්මව විශ්වාස කරන්න ඕන...."

ඉරෝමි මගේ අදහසට එකඟ වූවාය. දෙනෙතේ ගලා ආ කඳුලු බිඳු දෙකක් මම ලේන්සුවට ගත්තෙමි. දහඩියත් කඳුළුත් අතර මේ ගෙවන ජීවිතය කුමක්දැයි මට වැටහෙන්නේ නැත.

* * * * *

දුවගේ දහසය වෙනි උපන්දිනට කංචන ඇයට 'ලැප්ටොප් යන්ත්‍රයක් ගෙනැවිත් දුන්නේය. අසනි තාත්තාට බෙහෙවින්ම ළංවී තිබුනේ මගේ තහනම් කළාපයෙන් ඉවතට අවුත් තාත්තත්





සමග ඇය සුන්දර යයි සිතන යොවුන් වියේ සබ මොබ සන්නා අවසර ඔහුගෙන් ඇති නිසාය.

"මේ වයසෙ ළමයින්ට මොකටද ලැප්ටොප්...? තාක්ෂණය හොඳ වුණාට මේ නාහෙට අහන්නෙ නැති වයසට ඒක නරක අතට එනවා."

උදෑසන කිරි සාදන අතරතුරේ මම කංචනට කීවෙමි. ඔහු උදයේම නාගෙන කොහෙදෝ යාමට ඇඳගෙන සිටියේය. අද සෙනසුරාදාවකි. ඔහු කාර්යාලයට හෝ වෙනත් කොහේ හෝ යන බවක් මට කීවේ නැත.

"මෙයා හදන්නෙ හැමදේකටම ඔකට එක පෙරලන්න තාත්තෙ...."

ඩෙනිම් කලිසමකින් හා අත්කොට ටී ෂර්ට් එකකින් සැරසී ආ අසනි කීවාය.

"අසනි... උඹට අම්මලා කියක් ඉන්නවද?"

තේ සැදිල්ල පසෙක තබා මම ඇය වෙත ගියෙමි.

"ඔයාට මොන පිස්සුවක් හැදිලද උදාති... දුවගෙ ඇඟට කඩා පනින්නෙ උදේ පාන්දරම..."

"දස මාසයක් කුසේ තියාගෙන. දසවද විඳලා... ලෝකෙට බිහි කරල... හදපු අම්මා... අද මේ වෙනතුරු තාත්තට ආදරේ පහළ වෙනකම් උඹ ගැන බැලුවෙ මම... එහෙව් අම්මට එයා මෙයා කියලා කතා කරනවද හැදිච්ච ගෑනු ළමයෙක්."

මම කෑ ගැසුවෙමි. මට ලාහෙන් මනින්නට දරුවන් නැත. පළමුව කුසට ආ කළලය සෝදාගෙන යන්නට ගියේ මට මරණයේ රඟ පවා පෙන්වමිනි. දෙවෙනියට කුසට ආ කළලය මා රැක්කේ මගේ දිවි දෙවැනි කොටය.

"එහෙම නැතිව ඉතින් ගරු නම්බු දීලා කතා කරන්න... මෙයාගෙ වැඩත් ඒ විදිහට තියෙන්න එපැයි... නේද තාත්තෙ...."

"මොකක්ද උඹ කිව්වෙ... ඇයි මට මොකද වෙලා තියෙන්නේ..."

"අපි යං අපි යං......"

කංචන දියණියද රැගෙන විනාඩියට ගෙයින් එළියට බැස්සේය.

අද දුවගේ උපන්දිනයයි. අද ඇය උපන් දිනය සමරනුයේ ඇයට ජීවිතය දුන් අම්මා අමතක කරමින් නොවේද ඇයව මෙ තරමට ආරක්ෂා කලේ මා කුමකටද? මම වේදනාව දරාගන්නට බැරිව කෑ ගසා හැඬුවෙමි. එහෙත් මගේ වේදනාව අසන්න මුට්ටියේ තැම්බෙන කිරිබතටවත් තාත්තාත් දුවත් නොබී ගිය ඇල් තේ බඳුනටවත් නොහැකි විය. සැමියා නිසා වද වේදනා විඳමි. දරුවා නිසාද වද වේදනා විඳිමි.

දිනෙක මා මේ ළය පැලී අන්තිම ගමන යන්නටම ගිය දාටත් ඔවුන් වෙනුවෙන් ඔවුනගේ ජීවිත වෙනුවෙන් මා ඉහිලූ ගින්දර ගැන ඔවුනට වගක් නොවනු ඇත.

* * * * *

"ඔයා දැන් ඇයි ක්ලාස් එන්නෙ නැත්තෙ? දුව තනියම එනවද?"

ඉඳහිට නුගේගොඩ වෙළඳ පොළට ගියවිට දුවගේ පන්තිවල යහළුවන්ගේ මව්වරු මට මුණ ගැසෙයි. ඔවුන් අහන පැනයට මට දෙන්නට තරම් පිළිතුරු නැත. මා දුව ආරක්ෂා කලේ කෙසේද යන්න ඒ හැම මවක්ම දනියි.





"ඔයා... අසනිගෙ අම්මා නේද"

දුවගේ ටියුෂන් පංති එන හුරු පුරුදු මුහුණක් මා වෙත එබුණේ මා හති හතිකේ එලවළු කූඩයත් රැගෙන 163 බසයක් වෙත දුවද්දී ය.

"ඔව්..."

"ඔයාව දැක්ක එක හොඳයි... මට ඔයාට දෙයක් කියන්න තියෙනවා... මොකද මාත් දුවෙක් ඉන්න අම්මා කෙනෙක්"

බස් නැවතුම ලඟ ඇති බාටා වෙළඳ සල ඉදිරිපිට කොට්ටම්බා ගස් සෙවණේ මම නැවතුණෙමි.

"මම ඔයා හම්බවෙයි කියලමයි හිටියෙ. ඊත් ඔයා ක්ලාස් එක පැත්තටවත් ආවෙ නෑ."

"දුව දැන් ලොකු හින්ද හස්බන්ඩ් කිව්වා එයාට පුරුදු වෙන්නත් එක්ක තනියම යවන්න කියලා"

ඇගේ දෑස් තලලේ ඉන්දෙන හැටි මම දුටුවෙමි.

"අනේ මන්දා... මං දැක්ක දේ කියන්නෙ අසනියි.... අසනිගෙ තාත්තයි තවත් ලේඩි කෙනෙකුයි ග්‍රවුන්ඩ් එකේ මැච් එක බලන්න ගිහින් හිටියා...."

මට මාව අදහා ගත නොහැකි විය.

"ඒ හස්බන්ඩ්ගෙ නංගි වෙන්න ඕන. එයා මා එක්ක එච්චර හොඳ නෑ."

"නංගි නම් නොවේ. ඒ දෙන්නා හැසිරුනේ කපල් එකක් වගේ... අසනිත් ඒත් එක්ක හිටියා... ටිකක් කළු... කොණ්ඩෙ කර්ලි ගෑනු කෙනෙක්.. කෙට්ටුයි."

මට ලක්ශානිගේ අංග ලක්ෂණ මතක් විය. කංචන තවමත්

ලක්ශානි සමග සම්බන්ධය පවත්වාගෙන යන බවට මම සැක කලෙමි. මට දුක.. දූන් අසනිත් ඇයට කැමැත්ත දක්වන නිසාය. ඇයගේ උපන් දිනය දවසේ ඔවුන් කොහේ හෝ යන්නට ඇතැයි මට සිතුණේ රාත්‍රී ආහාරයද හෝටලයකින් රැගෙන පැමිණ තිබුණ නිසාය.

"අනේ ඔයාට ගොඩක් ස්තූතියි කීවට...."

"ඒ වුණාට ලොකුයි කියල අතාරින්න එපා... අපේ දූවට නම් මං අසනිව ආශ්‍රය කරන්නත් එපා කිව්වා. අසනිට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවලු....."

"දෙයියනේ මං මලක් වගේ හැදුව කෙල්ල... ඕක කරල දෙන්න තමයි තාත්තා අසනිව යාළු කර ගත්තෙ."

මම ගීතිකාගෙන් සමුගෙන බස් රියක නැඟුනෙමි. මා කෙසේ ගෙදර ආවාදැයි මට මතක නැත.

කංචන ලක්ශානී සම්බන්ධයෙන් මට තව රිදෙන්නට දෙයක් නැති තරමය. කංචන දූවට තෑගි බෝග දෙමින් දූවගේ හිත දිනාගෙන අම්මාගේ වැරදි කියමින් ඇයගේ කැමැත්ත ලක්ශානි වෙත නම්මා ගැනීමට අදහස් කරන බව මට පෙනෙයි.

* * * * *

අසනි පාඩම් කරන බවක් මට පෙනෙන්නේ නැත. ඇයට මුහුණු පොතේ හුඟාක් වැඩ ඇතුවා සේය. පැය විසිහතර මුහුණු පොතේ මිතුරන් සමඟය.

"ඔයා පාඩම් කරන්නෙ නැද්ද? හැම තිස්සෙම ෆේස් බුක් එකේ...."

මා කියූ දෙය ඇයට ඇසුණාද නැත්නම් නැසුණ ගණනේ ඉන්නවාද කියා මට හැඟීමක් නොවීය.





"ඉගෙන ගන්න කාලෙදී ඉගෙනගන්න දේකට හිත යොමු කරනවා මිසක් අර කොල්ලයි මේ කොල්ලයි එක්ක බිව් එහේ වැටකෙයියා පඳුරු ගානේ රිංගපුවාම වෙන්නේ මොකක්ද කියලා මං අමුතුවෙන් කියන්න ඕනෙ නෑ...."

මම තරමක් උස් හඬින් කිව්වෙමි. ඇයගේ හිස අත ගා මේ වගේ සම්බන්ධයක් ඇත්නම් ඒවා නවත්වා දමන ලෙස මට ආදරයෙන් කියන්නට තිබුණි. නමුත් 'අම්මා' ගැන කංචනත් කංචනගේ නංගී හා මස්සිනාත් කියා ඇති ගතු කේලාම් නිසා අසනි මා දැකීමටවත් ප්‍රිය කලේ නැත. එවැනි අවස්ථාවකදී මට ඇයට ආදරය පෙන්වමින් මේ අවවාද දිය නොහැකි විය.

"තාත්තත් හොඳ ආදර්ශයේ දෝණියන්දූට දෙන්නෙ... මීට පස්සෙ එහෙම එක එක වනචර ගෑනුත් එක්ක අරහෙ මෙහෙ රවුම් ගහල මට අහුවෙන්ඩ නම් එපා...."

දියණිය සරදම් සිනහවක් මුවේ ඇඳ ගත්තාය. ඇය දැන් මට පාලනය කරන්නට බැරි තරම් දුර ගොසිනි. ඒ දිනවල මේ සියල්ල දරා ගැනීමට නොහැකි නිසාදෝ මම අධි රුධිර පීඩන තත්ත්වයෙන් පීඩා විඳමින් සිටියෙමි. ඒ නිසා රාත්‍රියේ මට හොඳ නින්දක් අවශ්‍ය විය. ඒ නිසාම නිවසේ සියළුම වැඩ නිමකොට රෑ අට නවය වෙද්දී මා නිදා ගන්නට පුරුදු වී උන්නේ බෙහෙත් පෙති කිහිපයක්ද ගිල දමාය. ජීවත් වෙන්නට බලාපොරොත්තු, ප්‍රාර්ථනා අධිෂ්ඨාන කිසිවක් නොමැති වූ මගේ ශරීර කූඩුව සම්පූර්ණයෙන් මෙන් ජීවත් කලේ ඖෂධය.

අසනි කිසි කතාවක් නොමැතිව ලැප්ටොප් යන්ත්‍රය ඔසවා ගෙන නැගී සිටියාය.

"කොහෙද ඔය යන්නෙ...."

"නැන්දලගෙ ගෙදරට... මෙතන කණක් ඇහිලා ඉන්න නැතෙ... තාත්ත කියන්නෙ ඇත්ත තමා තල් අත්තට බොරළු

නලනවා වගේ..."

ඒ ටික කියාගෙනම අසනී ශේට්ටුවෙන් පිටවූවාය. දෙවියනේ දහ දුක් විඳ හදපු දියණියට අවවාදයක් දීමට තරම් නුසුදුසු මවක්ද මා ?

රැයට බත ලිපේ තබන්නටත් මගේ හිතේ නිස්කලංකභාවයක් තිබුණේ නැත. කංචනත් කෙලින්ම වැඩ ඇරී ගොඩවන්නේ ඒ නිවසටය.

රෑ කෑම ගන්නේත් ඒ නිවසිනි. පතිනියක ප්‍රාර්ථනා කරන ලෝකයද මේ...? මේ තරම් දුක් වේදනා දරාගෙන ජීවත් වනවාට වඩා රාත්‍රි නිදි යහනේදීම මා මිය යනවා නම් හොඳ යයි මට සිතුණ වාර අනන්තය.





# හත්වැනි ගිනිදළුව

ප්‍ර: නීතිඥ මහතා ඇනුවා ඔබට මහත්තය සමඟ සමගියෙන් ජීවත්වෙන්න බැරි නිසාද දියණිය ගියේ කියලා.....

උ: ස්වාමිනී කොළඹ ප්‍රධාන පෙලේ පාසලක එනැම ගුරුවරියකගෙන් ඇහුවොත් කියයි. හැමදෙනාම කියන්නෙ අනේ ඔයා මේ ළමයා බලපු විදයට ඔහොම තරක් වෙයි කියලා හිතාගන්නවත් බෑ කියලා. හැම ගුරුවරියක්ම මට කතා කරනවා. ඇයි අසනිට මෙහෙ වුනේ කියලා. ෆේස් බුක් නිසා... අන්තර්ජාලය නිසා... කොටින්ම මේ නව තාක්ෂණය මගේ දරුවව වැරදි පාරේ යැව්වා.

ප්‍ර: ඔබගේ නිවසේ නැවති හිටිය ලක්ශානි කියන කාන්තාව ගැන නීතිඥ මහත්තයා ඇනුවා ඔබ කිවුවා ඔබගේ සැමියා හොඳ මනුෂ්‍යයෙක් කියලා.. එහෙම නම් ඔහුගේ සම්බන්ධයක් ඇති වුනේ කොහොමද ලක්ශානි සමග.

උ: ස්වාමිනී ඇය පැමිණියේ බෝඩිම්කාරියක් විදිහට... ගැහැනියක්ම තමයි තවත් ගැහැනියකගේ විනාශය. එහෙම සම්බන්ධයක් ඇති බව දන්නවා නම් ගේට්ටුවෙන් මෙහාට ගන්නෙ නෑ.

# 7

කංචන එදා කල් ඇතිව නිවසට පැමිණියේය. ඒ අවුත් ඇඳුම් මාරු කරද්දි ඔහු දිගින් දිගටම සිරුර කසන වග මට පෙණුනි. කලිසම ගලවා දමා තුවායක් ඇඳගෙන ඔහු කසමින් දඟලමින් අපහසුවෙන් පසුවිය.

"ඇයි කංචන......."

"බලන්නකො... මේ... කැසිල්ලක් මොකුන්දෝ සත්තු ජාතියකුත් ඉන්නවා. හරියට බලු මැක්කෝ වගේ......"

අප අතරේ මොනතරම් නොගැලපීම් ප්‍රශ්න තිබුණත් එවැනි අවස්ථාවකදී ඔහුට පිහිටවීම මගේ යුතුකම විය. නමුත් රෝගය කුමන විදියේ රෝගයක් ද කියා නිශ්චය කිරීමට මගේ දැනුම මදි විය.

"අපි නුගේගොඩ ගිහින් බෙහෙත් ටිකක් ගම්මු.... අපිරිසිදුකම හින්දා වෙන්න ඇති....."





නමුත් මා කී දෙය කංචන පිළිගත්තේ නැත. මම හම පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු වෙත ඔහුව රැගෙන ගියෙමි.

"මේක බෝ වන රෝගයක්."

වෛද්‍යවරයා නියම කළෙන් ඒ නියමය මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යයක් විය. ඔහු උඩුමහලේ කාමරයට ගියේය.

ඒ රෝගය අප්‍රියජනක විය. මගේ හිතේ සැකයක්ව පැවතියේ එය සමාජ රෝගයක් බවය. එහෙත්..... මට තව දුරටත් උවමනා වූයේ සියලු වැරදිවලට සමාව දී මේ පවුල් ජීවිතය තුළ රැඳෙන්නටය. ඒ වෙනුවෙන් පේ වෙන්නටය. මා වැනි මෝඩ ගැහැනියක මෙලොවේ තවත් නැති වග මම හිතුවෙමි.

එහෙත් කංචනගෙනුත් අසනිගෙනුත් තොර ජීවිතයක් මා කෙදිනකවත් පැතුවේ නැත. මා ජීවත් වූයේ ඒ දෙදෙනා වෙනුවෙනි. කංචන නිවසේ වෙනම කාමරයකට යාම තාවකාලික තීරණයක් විය. එහෙත්... එම රෝගය අප දෙදෙනාට වෙන්වීමට පාර කැපුවේය.

* * * * *

"උදනී..... ඔයාගෙ දුව ක්ලාස් යනවා කියලා කොහෙ යනවද කියල ඔයා හොයල බලන්නෙ නැද්ද.....?"

ගීතිකා පැවසුවේ දුරකථනයෙනි.

"අනේ ඇයි ගීතිකා... දැන් තාත්තනෙ දුවව භාර අරගෙන තියෙන්නෙ. මම පස්සෙන් එනවට කැමති නෑ...."

"අසනි ක්ලාස් කට් කරලා කොල්ලෙක් එක්ක බීච් යනවලු.... තාත්තට භාරදීලා බලාගෙන හිටියොත් නම් හරියන්නේ නෑ..."

"මට නිකමටවත් සැක හිතුණෙ නෑ..."

"ෆෝන් එකෙන් කුටු කුටු ගානකං ඔයා දන්නෙ නැද්ද? දුව ඉන්නෙ ඔයගේ කාමරේම නේද?"

"අසනිට ෆෝන් එකක් නෑ. ඔය ලැප්ටොප් එකේ නම් ෆේස් බුක් යනවට එහෙම මම කෑ ගහනවා... ඒක හින්දා මා එක්ක තරහයි."

"ඔයිට වැඩිය දුව ගැන හොයලා බලන්න. එයා ක්ලාස් එද්දි නම ෆෝන් එකක් ගේනවා."

ගීතිකා කිව් දෙය විශ්වාස කරන්නට මට සිදු විය. ඇයට ජංගම දුරකථනයක් නැත. කංචන විසින් දුරකථනයක් අරන් දෙන්නට කතා කරද්දී මම එයට දැඩි සේ විරුද්ධ වුණෙමි.

"අපේ දුවට තවත් දෙයක් ආරංචි වෙලා අසනි ගැන. මං නම් හිතුවෙ නෑ අසනි මෙහෙම ජරා ළමයෙක් කියලා... ඈයි අනේ ඔයා මල් වට්ටියක් වාගේ අත් දෙක උඩ තියාගෙන හැදුව කෙල්ලනෙ...."

"මගෙ පපුවත් ගැහෙනවා. මොකක්ද ගිතිකා?"

මම නොසන්සුන් විමි. මම කොතරම් පව්කාර ගැහැනියක්ද? සැමියා නිසා දුක් විදීම වෙනමම කාරණයකි. එහෙත් දරුවෙකු නිසාත් මෙහෙම දුක් විදිය හැකිද? ප්‍රේමය මට අරුමයක් නොවේ. මම මගේ පාසල් කාලය සිහිපත් කරමි.... පාසල් කාලයේ සිටම තම චරිතය පණමෙන් රැකගත යුතුය. තමා කෙතරම් සුසිල්වත් චරිතයක් වුවද තව කෙනෙකු ඒ චරිතයට තරක නාම එකතු කළ හැකිය. මගේ නම කැත කළේ මගේ ප්‍රේමය බලාපොරොත්තුවෙන් උන් කවින්ද විසිනි.

කංචන මා කසාද බැන්දේ ප්‍රේමය නිසාවෙන් යයි මට සිතිය නොහැක. මාව අත්පත් කර මට වද වේදනා දීමේ මොකක්දෝ අරමුණක් ඔහුට තිබිණි. නමුත් අපේ පරම්පරාවේ ගැහැනුන්ට මිනිසුන් දෙතුන් දෙනා සමග දීග කන පුරුද්දක් නැත. තාත්තා





මිය ගියද අම්මා සැබෑ පතිනියක ලෙස මාව රැක ගනිමින්... වැදගත් අයුරින් ජීවත් වූවාය. ඒ රුධිරය මගේ දියණියටත් තිබිය යුතු නේදැයි මම නිතරම කල්පනා කලෙමි.

"ඔයා ප්‍රෙෂර් එකට බේත් බොනකොට ඒ වතුර වීදුරුවට අසනි ස්ලිපින් ටැබ්ලට් එකක් දානවලු...."

ගීතිකා කී කතාවෙන් මගේ හිස භූමණය වන්නට විය. නවයට පෙර ඇඳට යන මා මැරුණාක් මෙන් පාන්දර හතර පහ වනතුරු නිඳාගනිමි. උයන්නට ඇහැරෙන්නට දුරකථනයේ එලාම් නාදය තබා නිදාගන්නා මට එය නොවේ නම් ඇහැරෙන්නේත් නැති තරම්ය.

"මේකි මගේ බඩේ ඉපදුණාට මාව කන්න ආ යක්ෂනියක් ද ?"

මෙ විදියට ඇයට මා මරා දමන්නටත් පුළුවන්කමක් තිබේ.

* * * * *

"ඔයා නිදා ගන්නැද්ද....?"

මම අසනිගෙන් ඇසුවෙමි.

"ටියුට් එකක් කරන්න තියෙනවා"

ඇය එසේ කියමින් සාලයේ මේසයට ගියාය. මම වතුර වීදුරුව මේසය මත තබා නාන කාමරයට ගියෙමි. අසනි කාමරයට අවුත් යන හැටි මම දුටුවෙමි. වතුර වීදුරුව ජනේලයෙන් එළියට විසි කර ඇඳට වී දිගා වුවද පෙර මෙන් ඉක්මනට නින්ද ළඟා වූයේ නැත. මෙතෙක් කල් මා මැරුණාක් මෙන් නිදාගෙන ඇත්තේ අසනීගේ නිදි පෙත්තේ බලයෙනි. ගීතිකා මට බොරුවක් කර නැත.

රෑ දහයේ කණිසමත් වැදෙද්දී අසනී කාමරයට ආවාය. මගේ ඇඟට උඩින් එබී මා නිදිද්දයි බැලූ ඇය ඇගේ මේසය යට පොත් පෙට්ටියේ සඟවා තිබූ යමක් අතට ගත්තාය. 'චික් චික්' යන ශබ්දයෙන් බොත්තම එබෙද්දී එය ජංගම දුරකථනයක් වග මට හැඟිනි.

"ඔයා.... පාඩම් කරනවද.... අප්පච්චී...?"

ඇය බොහෝ ලයාන්විතව ඇසුවාය.

"ඔයාට මං වදයක්ද... මං කොච්චර අමාරුවෙන්ද ඔයාට කතා කරන්නෙ ඒත් ඔයාට ගාණක්වත් නෑ...."

අසනී මේ තරම් දුකෙන් තම පෙම්වතා සමග කතා කරන්නේ ඇයි?

"ඔයා මට ආදරේ නැත්නම් මං හිතාගෙන හිටියේ වහ බොන්න."

ඇගේ ඒ වදන් ඇසෙනවාත් සමඟම මට උපුල් සිහිවිය. ඇගේ ඒ වදන් ඇසෙනවාත් සමඟම මට උපුල් සිහිවිය. මගේ දුවගේ උපුල් වහ බිවේ උපේඛාගේ ආදරය අහිමි වීමෙනි. මගේ දුවගේ පෙම්වතාත් වෙනත් යුවතියකට ආදරය කරනවා විය යුතුය.

"ඒ වුනාට අප්පච්චි... මට දැනෙනවා මම හුඟක් අසරණ වෙලා කියලා. මට මේ ගෙදරත් එපා වෙලා අම්මගෙයි තාත්තගෙයි කිසිම සමගියක් නෑ... ඒ දෙන්න තව කොච්චර කල් එකට ජීවත් වෙයිද දන්නෙත් නෑ... අම්මා උයන එක තාත්තා කන්නෙත් නෑ... තාත්තා දැන් නිදාගන්නෙ අප්ස්ටෙයාර් එකේ...."

මට තවත් මේවා අසාගෙන සිටීමට බැරි තරම්ය. මගේත් කංචනගේත් ප්‍රශ්න නිසා අසනී දුක් විඳින වගක් මා මෙතුවක් කල් සිතුවේ නැත.

"මම දන්නවා... මට වඩා ඔයාට ක්‍රිෂානි ලොකුයි කියලා... ඔයාට මං දැං වදයක් වෙලා... මං දුකට අඬනකොට ඔයා කියනවා





මාව ඇති වෙලාලු. ඔව් ඉතින් මගෙන් ගන්න ඔන දේවල් ගත්තට පස්සෙ.. ටොපියක් කාලා කොලේ විසි කරනවා වාගේ ඔයාට මාව විසිකරලා දාන්න පුළුවන්... ඔයා මට ආදරේ නෑ අප්පච්චි ඔයා ආදරේ අර බැල්ලිට......"

මගේ හද කිරි ගැසිණි. මට තවත් දරා ඉන්නට නොහැකි විය. ඇය කියන කතාව අනුව මේ වන විටත්... මගේ දියණිය සිය කුමරි බඹසර බිඳගෙන ඉවරද? ඇය කී ටොෆි කොලයේ කතාවෙන් හැඟී යන්නේ එය නොවේද?

මම වහා ඇඳෙන් පැමිණ අසනී බලාපොරොත්තු නොවූ අයුරින් දුරකථනය උදුරා ගතිමි. අසනී කෑ ගැසුවාය.

"හරි.. හරි අඬන්නෙපා... හෙට ඉස්කෝලෙ ඇරිලා... ඔයා එන්න.... කලර් කිට් එකකුත් දාගෙන එන්නකො....."

"තෝ කොහෙ ගෙනියන්නද බල්ලො මගෙ දරුවා.....?"

මම මොර දුන්නෙමි. අසනිගේ කෑ ගැසුමත්, ගෙය දෙදරන්නට මා කල කෑ ගැසීමත් නිසා කංචනත් පහළට ආවේය. තම දියණියට එවැනි අපරාධයක් සිද්ධ වූ කල වියරු නොවැටෙන්නේ කුමන මවද?

"තමුසෙට පිස්සුද උදානි.. මොකද මේ දරුවව කන්න හදන්නෙ....?"

අසනී තාත්තාගේ පිටිපස්සේ හැංගී ගත්තාය.

"කංචන... තමුසෙ තාත්තෙක්ද මේ... කෙල්ල බලාගන්න හැටිද.... මට යන්න දුන්නෙ නෑ... දැන් මොකද වෙලා තියෙන්නේ.... එක එක බල්ලො මෙකිව බීච් එක්ක යනවයි... හෝටල් ගානෙ එක්ක යනවයි කියලා මං කීවේ නැද්ද... දැං බලනවා මමද වල් ගැනි මේකිද වල් ගැනි....?"

කංචන මගේ කට මිරිකා මාව ඇඳට තල්ලු කළේය.

"පිස්සියෙක් වගෙ දොඩවලා මිනිස්සු හිනස්සන්න එපා ගෑනියේ...."

"අනේ ඔව් තාත්තෙ.... මෙයාට පිස්සු..."

ඇඳෙන් නැගී සිටි මම අත දිග ඇර අසනීට පහරක් ගැසුවෙමි. කංචන යළිත් මා ඇඳට තල්ලු කලේය.

"මෙකි කරපු දේවල් අද මගෙ අතටම අහුවුනා..., මගෙ බෙහෙත් වීදුරුවට නිදිපෙති දාලා මාව නිදි කරවන උඹ දවසක ඒකට වහ ටිකක් දාලා සදහටම මාව නිදිකරවයි... ඔව් උඹ ඒකත් කරයි....."

මම හිතේ අමාරුවට කෑ ගැසුවෙමි. ඔවුන් දෙදෙනාම පුන පුනා කීවේ මට පිස්සු බවය. හිතේ වේදනාවටම මම බෙහෙත් ටික බී නින්දට වැටුණෙමි. එහෙත් මට පාන්දර ජාමය වන තුරුත් නින්ද ගියේ නැත. මා පාන්දර අවදි වූවා කියා ඇති තේරුමකුත් නොමැති තරම්ය. කංචන ගෙදරින් බත් කන්නේ නැත. අසනී කන්නේත් නැත. ගෙදරක ලිපගිනි මොලවන අම්මා කෙනෙකුට එය මොනතරම් වේදනාවක්ද?

* * * * *

උසාවියෙන් සිතාසි ලැබීමත් සමගම මම මහත් පීඩාවකට ලක් වුණෙමි. මට මගේ දුක කියාගන්නට කෙනෙකු නොමැති විය. අධිරුධිරපීඩනය උත්සන්න වී මා සිහිසුන්ව නාන කාමරයේ වැටී තිබුණ.

මාව වෛද්‍යවරයෙකු ළඟට ගෙන ගොස් මට බෙහෙත් රැගෙන දුන්නේ කංචනය. ඔහු හෝටලයකින් කෑම මිලදී ගෙනවුත් මට කන්නට දුන්නේය.

"මතක තියාගන්න කංචන... මං ඔයාට ඩිවෝස් එක දෙන්නෙ නෑ... මාව ඩිවෝස් කරන්න මං මොනවද ඔයාට





කලේ....?"

මගේ හිතේ වේදනාව යන්නට මම කතා කලෙමි.

"මට ඔයත් එක්ක ජීවත් වෙන්න බෑ."

"ඔයාට ඕන අර ගෑනි ළඟට යන්නද? මං දන්නවා.... ඊකි ළඟට ගිහින් ජරා ලෙඩකුත් හදාගත්තෙ...."

"උදාහි... දැන් පිස්සු තියෙන්නෙ මට. මට මේවා මෙච්චර දරන්න බෑ...."

ඔහු කෑ ගැසුවේය.

ඉන් පසු ඔහු බොහෝ සෙයින් වෙනස්විය. අසනීවත් කංචනවත් මා ගැන බැලුවේ නැත. ඔහු ඔහුගේ පාඩුවේ කාමරේ දොර වසාගෙන නිදාගන්නට පුරුදු විය. රැකියාවට ගියේ දොරට අගුලු දාගෙනය. මේ නිවස ගොඩනැගුවේ මගේ සල්ලිවලින් බව ඔහුට අමතක වී තිබුණි.

මගේ දරුවාත් සැමියාත් මට අහිමිව ගියේ කවදාදැයි මට මතක නැත. මාව දික්කසාද කිරීමට නඩු පවරා තිබියදීත් මා තවත් සැමියාට ලෙංගතුවී..... එකම තැන වසන්නේ ඇයිදැයි සමහරුන් විමසති. පාර තොටේ බැස යන්නට නොහැකි ලෙස දියණිය ගැන නරක කතා කියති.

"අනේ දෙකේ තියාගෙන පූජා කරන්න අරන් ගිය නෙළුම් මලක් බිම වැටුණම කාට කාට හරි පෑගිලා පරවෙලා යනවා. එයා මගේ අත් දෙකෙන් බිම වැටුණා නෙමෙයි උදුරලා ගත්තා...."

ඒ හැමෝටම මා යම් යම් විදියට දුන් පිළිතුර එයයි.

මගේ හිත සැනසුනේ බෙල්ලන්විල බෝ සමිදු සෙවණේය. මගේ හිත ඒ වැලි තලාවේදී තරම් සැනසීමක් ලැබූ අන් පුද බිමක් නොවිණි.

දික්කසාද නඩුවට මුහුණදීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය උපදවාගනු පිණිස මා බොහෝ හැන්දෑවන් ගත කළේ ඒ පුණ්‍ය භූමියෙහිය.

එදා පන්සලට යන්නට පිටව ගියත් දික්කසාද නඩුව සම්බන්ධයෙන් කතා කිරීමට නීතිඥවරිය හැන්දෑවේ හමුවන ලෙස කියා සිටියාය.

එබැවින් මම ආපසු නිවසට එමින් සිටියෙමි. නිවසේ දොර අඩවල් කර තිබුණ හෙයින් අසනී පැමිණ ඇති බව මම වටහා ගතිමි. එක වරම කුස්සියට පැමිණි මම වතුර වීදුරුවක් පුරවා ගතිමි. එකෙනෙහිම කාමරයේ සිටි යමෙක් එළියට දුවගෙන යනු මම දුටිමි. හොරෙක්වත්දැයි සැකයෙන් මම වහාම ක්‍රියාත්මක වී ඔහු අල්ලා ගැනීමට දිව ගියෙමි. දොර ළඟදී මම ඔහු ඇඳ සිටි ලා දුඹුරු පැහැති කමිසයේ කොණකින් අල්ලා ගත්තත් මා නොහිතූ පරිදි මා පිටුපසින් පැමිණ අසනී... මගේ පිට විකාගෙන විකාගෙන ගියාය. කොල්ලාගේ කමිසය මගේ අතින් ගිලිහිණ. සිදුවූ සියල්ල මට අවබෝධ විය.

"ආ... පර බැල්ලියේ..."

මම ඇගේ කම්මුලට වේගවත් පහරක් ගැසුවෙමි. අනෙක් කම්මුලටත් ගැසුවෙමි.

"මාව මරනවෝ... මේ ගෑණි මාව මරනවෝ......"

"මරන්නැතිව මොකක් කරන්ඩද යකෝ... මං ගෙදර නැති ටිකට තෝ කොල්ලෙක් කාමරේ අස්සෙ දාගෙන වල්කම් කරනකොට......"

මට.... මාව පාලනය කරගන්නට නොහැකි වුණු හැම මොහොතකම මම අඬමි. ඔබ අත්දෙක උඩ තියාගෙන මල් වට්ටියක් සේ හැදූ දියණිය කොල්ලෙක් කාමරේ තබාගෙන අසභ්‍ය ලෙස හැසිරුණහොත් ඔබ හැසිරෙන්නේ කෙසේද? මා සාධාරණ





යැයි ඔබ කියනු ඇත.

"මේ ගෑණි මාව මරනවෝ..."

ඇය තවත් හැකි වෙර යොදමින් කෑ ගසද්දී කංචන පැමිණියේය.

"කෙල්លව මරාගෙන කන්න හදනවද.... මේ ගෑනිට පිස්සු"

කංචන වහා සිය ජංගම දුරකථනයෙන් 119 අමතා මා අසනීට අමානුෂික අන්දමින් පහරදුන් බවට චෝදනා කළේය. පොලිසියටද ගොස් පැමිණිලි කළේය.

# අටවැනි හිනිදළුව

ප්‍ර: නිසිඳු මහත්තයා ඔබගෙන් ඇහුව ඔබගේ දුවට පහර දීම ගැන.

ඒවගේම 119ට කතා කර ළමා හා කාන්තා කාර්යාංශයට පැමිණිලි කිරීම සම්බන්ධයෙන්

උ: ඔව්... ඇහුවා.

ප්‍ර: 119 ට කතා කරාම පැමිණිල්ල විභාග කරා.

උ: මම ගියා... එතනදී මගේ සැමියයි දුවයි තරගෙට වාගේ මගේ චරිතය ඝාතනය කළා. එතකොට ඕ. අයි. සී මහත්තයා කිව්වා මේ ළමයා හදන්න නම් පරිවාසෙට දාන්න වෙයි කියලා. පස්සේ ඒ දෙන්නා ගියාට පස්සෙ පොලිසියෙ මහත්තයෙක් මට කිව්වා ළමයාට හොඳට කටපාඩම් කරවලා තියෙනවා ළමයා හදන්න නම් හම්බ වෙන්නෙ නෑ කියලා.

ප්‍ර: ඔබ දරුවාට අමානුෂික විදිහට පහර දුන්නා කියලා මම යෝජනා කරනවා.

උ: ස්වාමීනි අම්මා කෙනෙක් ළමයෙකුට ගහන්නෙ ළමයා හදන්න. දසවද විඳලා දරුවා බිහිකරලා... අපා දුක් විඳලා හදන්න හොඳයි. වරදකට පාරක් ගහන්න බෑ. ඒක අමානුෂිකයි.





## 8

ඒදා පටන් අසනී මගේ කාමරයෙන් ඉවත්ව උඩුමහලට ගියාය. ඇය නිදා ගත්තේ කංචනගේ කාමරයේය.

ගෙදර ඔත ඉඳුණේ නැති තරම්ය. එකම ගෙදර අප නැසිරුණේ ගොළුවන් ලෙසිනි. කංචන මගේ හිණුමට මාස්සක පුළ ගණනක් බැර කරද්දී අපගේ දික්කසාද නඩුව ආරම්භ විය.

උසාවිය ගැහැනියකට කොතරම් දුරට සුදුසුද යන්න පවා මට තීරණය කරගත නොහැකි විය. නමුත් තනියම ජීවිතයට මුහුණ දෙමින් මේ ජීවන ගමන තනිව යා යුතුය.

නඩුවට පෙර දින රාත්‍රියේ මට එක විනාඩියක් නින්ද ගියේ නැත. ඇඟපත පවා වෙදන්නට විය. අයියි කංචන මට මෙහෙම කරන්නෙ... මං මේ පුංචි පවුලට මොනතරම් ආදරේ කළාද? මං තරම් සමාව දුන් බිරිඳක් තවත් සිටිද? කංචනව මගෙන් ඈත් කළේ නිශාන්තය. ඔහුගේ සිතැඟි ඉටුකරගැනීමට හොඳත් නිසා හොරු කේලාම් කියමින් කංචනව නොමඟ යවමින් ඔහු උපක්‍රමශීලීව කංචනව මගෙන් ඈත් කළේය. අපගේ පවුල අද සිසිකඩ විසිර

ගොස් ඇත.

මේ නඩුව නිසාවෙන් මා කෙතරම් බය වුණාද. කෙතරම් මානසික පීඩාවට පත් වුණාද කිවහොත් උසාවි භූමියේ බෝධිය අසල දී මට මුත්‍රා පහවිය.

දික්කසාදය හමුවේ ගැහැනියක මොනතරම් අසරණ වෙනවාද? නීතිඥයන් විසින් උසාවි භූමිය දෙදරවමින් හඬ නඟා අසන නිර්ලජ්ජිත ප්‍රශ්න හමුවේ... මුනිවත රැකිය නොහැකිය. දික්කසාදය යනු ගැහැනියකට අවමන් කිරීමට යොදා ගන්නා තවත් සමාන පදයක් යැයි මට සිතුණි. එබැවින්.... නිර්දෝෂී මම කිසිම විටෙක කංචනට දික්කසාදය නොදීමට හිත දැඩි කර ගත්තෙමි.

* * * * *

"කෝ අසනි....."

මොනතරම් හිතුවක්කාර වුණත් අසනි ගැන නොසොයා සිටින්නට නොහැකිය. රාත්‍රී අඳුරත් සමඟ ගෙට ගොඩ වදින කංචන උඩුමහලට යනවා දකිමි. නැවතත් මා ඔහුව දකින්නේ උදෑසනට නිවසින් පිටව යන හැටියි. දින දෙක තුනක සිට මා අසනි දුටුවේ නැත. මා දූන් ජීවත් වන්නේ අපායකය.

"ඇහුණද කංචන... කෝ අසනි?"

මම හඬ වැඩි කොට ඇසුවෙමි. තරප්පු පේලියේ අඩක් පමණ නැග සිටි ඔහු නැවතුණේය.

"අපේ අම්මා ළඟ...."

උත්තරය එපමණය.

"ඇයි ළමයා එහෙ නැවැත්තුවේ....?"





"ළමයගෙ ආරක්ෂාවට..."

"තමන්ගෙ ගෙදර තරම් කොහෙද ගෑණු දරුවෙකුට වෙන තැනක ආරක්ෂාවක්"

මගේ අදහසට කිසිත් නොකී ඔහු සිය කාමරයට ගියේය. මම අසරණව බලා උනිමි.

කාලයක සිට ගෙදර කුස්සියේ බත ඉදෙන්නේ මට පමණය... කංචන මගේ ගිණුමට දමන සුළු මුදලෙන් මම පිරිමසා ගනිමි. වෙළඳසැලකින් වුවද මා ගන්නේ බෝංචි කරල් අටකි. තක්කාලි ගෙඩි දෙකකි. මාළු ගතහොත් මාළු දෙසිය පනහ මට සතියකට වුව සෑහෙයි... එසේත් නොමැති නම් පොලේ වෙළෙන්දෙකුගෙන් සුප් එකකට කියා ඉල්ලමි. එවිට කැරට්, බෝංචි, ගෝවා ආදිය සුළු සුළු ප්‍රමාණවලින් ලැබෙයි. මා කන්නේ ජීවත්වීම සඳහා මිස වෙනත් කිසිම උවමනාවක් සඳහා නොවේ.

මා ජීවත්වන්නේ කුමකටද? මගේ බලාපොරොත්තු මිය ගොසින් ඇත. අම්මා කෙනෙක් කළලය කුසට ආ බව දනගත් මොහොතේ සිට ඒ දරුවා වෙනුවෙන් සිහින මාලිගාවක් ඉදි කරයි. ඒ බලාපොරොත්තු බිත්තරයක් බිඳෙන්නාක් සේ බිඳී ගොස් ඇත.

"අඬන්න එපා... දුක් වෙන්නත් එපා උදානි... කංචන ඔය උඩපැනගෙන නටන්නේ ඔයාගෙන් ඩිවෝස් වෙන්න. ඊට පස්සෙ අර ගැනිව බඳින්න. ඒත් කංචන කොහොමද ඒවා ඔප්පු කරල පෙන්නන්නෙ."

ඉඳහිට මාව බලන්නට එන ඉරෝමි මට පිටි පැකැට්ටුවක් සීනි තේ කොළ ටිකක්, බිස්කට් පැකැට්ටුවක් වැනි යමක් රැගෙන එන්නීය. ඒ හැම විටම ඈ මගේ හිත හදන්නට උත්සාහ කළාය.

"මට අනුකම්පාවෙන් මේවා උස්සගෙන එන්න එපා

ඉරෝමි. මම කොහොම සැපට හැදුණ කෙනෙක්ද....? බඩගින්න කියන දේ කවදාවත් දැනිලා නෑ.. ඕන දෙයක් යාන්තම ලොකු අම්මට ඇහෙන්න කියන්න විතරයි තිබුණෙ...."

මට නිතරම අතීතය සිහිපත් වෙයි. ඒ අතීතයත් වර්තමානයත් අතර ඇත්තේ දුරස් පරතරයකි. ඒ පරතරයට හැඩ ගැසෙන්නට... උදානි ආශ්චර්යා මොන තරම් පීඩාවක් විඳගන්නට ඇද්ද?

"ඒත් මම දන්නවා... ඔයා බඩගින්නෙ ඇති... ඔයා ඉස්සරත් එහෙමයි... දුවගෙ ටියුෂන් පංතියෙ.... සිමෙන්ති බංකුවට පත්තර කැල්ලක් දාගෙන වාඩිවෙලා... පැය ගණන් බඩගින්නෙ වතුර තිබහෙ ඉන්නවා....."

මගේ දෑස කඳුළෙන් තෙත් විය. එහෙත්... මගේ දුක පෙන්වා යන්නට නම් මා කතා කල යුතුම විය.

"අනාචාරය හා ද්වේෂ සහගත හැරයාම කියලා කංචන කේස් එක ෆයිල් කරල තිබුණ. එයාගෙ හෘද සාක්ෂිය දන්නවා කවුද අනාචාරේ ගියේ, කවුද වෙනමම කාමරේක ඉන්න ගියේ කියලා...."

"උඩ ඉන්න දෙයියො මේවා බලා ගන්න ඕන."

"දෙයියො ඇර වෙන සාක්ෂි දෙන්න කෙනෙක් නෑ ඉරෝමි... දෙයියෝ දන්නව මම මගේ කෙල්ලව රැක්කෙ කොහොමද කියලා... කෙල්ල ටියුෂන් පංතියට දාලා... අර තාත්ත එක්කයි මේ තාත්තත් එක්කයි රවුම් ගහන්න ගිහිල්ලා නෑ මම. මෙ විශ්ව බලවේගය මට යහපතක් කරයි."

"අපි බලමු මොකද වෙන්නෙ කියලා. ඒත් ඔය නඩුව අවුරුදු පහක් හයක් ඇදුනොත්... නාස්ති කරන කාලෙ උහුලන ඉහිලිල්ල.... ඊට වඩා.............."

ඇය මා දෙස බලා සිටී... මේ අසන්නට යන්නේ අනෙක්





හැමෝම අසන ප්‍රශ්නයයි.

"අවුරුදු දාහතක දුවෙක් ඉන්නව කියලා හිතන්න බෑ.. උඹට පුලුවන් වෙන මැරේජ් එකකට යන්න."

"ෂික්... මගේ බල්ලටවත් එපා..."

"කංචන මොනවද උඹට කරේ? මොනවද උඹට දුන්නෙ...? එක රෙදි යාර දෙකක් අරගෙන දීලා තියෙනවද?"

ඇත්තය. මා අදටත් දමන්නේ ගෙවීගිය තම්පටි සෙරෙප්පු දෙකකි. ඉඳහිටක ලොකු අම්මා හෝ අක්කලා දෙන මුදලකින් මම ඇඳුමක් මිලට ගත්තෙමි.

"ඒත් කංචන මගෙ මිනිහා මගෙ දුවගෙ තාත්තා...."

"උඹ වාගෙ හිතන ගෑනු උඹ වාගෙ දරාගන්න ගෑනු නම් මම දැකලා නෑ. ඇත්තටම කියනව නම් උඹ මහ මෙරුවක්."

ඇත්තය. මම මහාමේරුවක් සේ කිසිම සැඩ-සුළඟකට නොසෙල්වී හිදිමි.

කංචනගේ බොරු ඇත්ත වී මා වැරදි කාරිය වීමට නම් මෙ දික්කසාදය සිද්ධ විය යුතුය.

නමුදු නිවැරදිකාරිය මාය. දික්කසාදයකට ඔප්පු කර පෙන්විය යුතු කරුණු තුනෙන් වූ එකදු කාරණාවක්වත් ඔහුට ඔප්පු කර ගත නොහැකිය. මා අනාචාරයේ හැසිරුණා නම් මා හෝටලයකට පුරුෂයෙකු සමග ගිය බවට සාක්ෂියක් අවශ්‍යය. අදටත් මම ඔහු නැර ගොස් එකම වහලක් යට ජීවත් වෙමි. ලිංගික බෙලහීනතාවයක් ද මට නැත.....

මගේ නිවැරදි බව මේ තරම් දුරට සාක්ෂි දේදදී ඔහුට උසාවියේදී මා වැරදි කාරිය කර දක්විය නොහැක. මා වැරදිකාරිය වුවහොත් ගැහැනියගේ වරදක් සොය සොයා ඇයට පරිභව

කරන්නට බලාසිටින මේ සමාජය මට ගල් ගසනු ඇත. සමාජය ඉදිරියේ වැරදිකාරිය වී මට තවත් මිනිහෙකු සමඟ කැදැල්ලක් සාදා ගැනීමට කිසිම උවමනාවක්ද නැත.

* * * * *

කෙතරම් දුරට ඉවසාගෙන ඉන්නට තැත්කළත් දරු කැක්කුම ලය නෙත් කරයි. කංචන මට දෝෂාරෝපණය කරන්නේ මා නිසා ඇය නරක් වූ බවටය.

"දරුවා නරක් වුණේ පිට ඉඳල නෙමෙ... තමුසෙ ළඟ ඉඳලා...

"මම ළඟ ඉඳලා... ආ... ඒකයි අර ගෑනිත් එක්ක යන පාටිවලටයි අරවටයි මේවටයි අසනිව එක්ක ගියේ නේද? කොහෙවත් යන වල් ගෑනියෙක්ව පෙන්නලා අම්මා නරකයි කියලා දරුවට ඒත්තු ගැන්නුවා...."

ඔහුත් සමඟ එකට එක නොකියා සිටීමට තීරණය කර තිබුණද අසනි වෙනුවෙන් මට කතා කරන්නට සිදුව ඇත. මවකගේ දරු කැක්කුම ඔහු අඳුරන්නේ නැත. එය දන්නවා නම් ඔහු මෙසේ කරන්නේත් නැත.

දූත් ඇය විනාශ වී ඇත. තවත් මට රැකගන්නට ඉතුරු වී ඇත්තේ මොනවා දැයි සිතෙන තරමටම මගේ ජීවිතයත් මට දූත් එපා වී ඇත.

"ළමයා ඉන්න තැනක හිටපුවාවේ..."

"ඉස්කෝලෙ යන්නෙත් නෑ ඉගෙන ගන්නෙත් නෑ...." .

"මං එයා ගැන බලාගන්නම්. දුව කැමති නෑ ආයෙ මෙහේ ගෙදරට පයගහන්න. මේක ගෙදරක්ද? මේක අමු සොහොන් පිට්ටනියක්නෙ..."





කංචන මේ කතා කරනුයේ කාටද? මා උත්සාහ කලේ සුරවිමනක් හදන්නටය. අපට වූ එකම දරුවාත් යහමඟ යවාගෙන අප දෙදෙනාට මොනතරම් සමගියෙන් මේ වහල යට ඉන්නට තිබුණද?

"මේ ගෙදර සොහොන් පිට්ටනියක් කලේ මම නෙමේ. තමුසෙගෙ මස්සිනා..... හොඳට හිතලා බලන්න.. මම ඒ මිනිහත් එක්ක ඇඳට නැග්ග නම් මේ මුකුත් නෑ. ඒ මිනිහට ඒක කරගන්න බැරි වුණ නිසා තමුසෙව ගොනාට අන්දලා අපේ පවුල විනාශ කරා...."

මම හැඬුවෙමි. මා මෙතුවක් කල් නොකී දෙයක් ඉතා ලෙහෙසියෙන් ඔහු ඉදිරියේ කියා දැම්මෙමි.

"ඊට පස්සෙ ඒ මිනිහා මට කතා හැදුවා. අර ත්‍රීවිල් ඩ්‍රයිවර් එක්ක යාලුයි මේ මිනිහා එක්ක යාළුයි කිය කියා... ගෙදරට එන පෝස්ට්මන්ටයි ලයිට් බිල් දාන්න එන මනුස්සයටයි විතරයි කතාවක් හැදුවෙ නැත්තෙ...."

කංචන තුෂ්නිම්භූත වී මා දෙස බලා සිටියේය. එය මට කතා කරන්නට අවස්ථාවක් විය. මේ විවාහ ජීවිතයෙන් මා ලැබූ දෙයක් නැත. මුල සිටම මට ලැබුණේ ඔහුගේ කෙණෙහිලිකම් හා නොසැලකිල්ලය. බෝඩිංකාරියක කියා ඔහු අප අතරට රැගෙන ආවේ ඔහුගේ පෙම්වතියයි. නොඑසේ නම් හොර අඹුවය. මා ඇස් කන් නැත්තියක සේ සියල්ල ඉවසා දරා ගත්තෙමි.

"නිශාන්තයියව අල්ලා ගත්තද මේ ඔක්කොටොම... ඕවා කියනවා උසාවියේදී....."

"උසාවියේදී කියනවා තමයි මං... මම මේවා උසාවියේදි කීවා නම් කාටද වාසිය....?"

එය ඇත්ත බව ඔහුට වැටහෙන්නට ඇත. ඔහුගේ අරමුණ ලක්ශානිව විවාහ කර ගැනීමය. ඒ සඳහා ඔහුගේ මවගෙනුත්

සහෝදරියගෙනුත් උදව් ලැබෙන බවද මම දනිමි.

"මං කියන්නෙ මෙච්චරයි. මගෙන් දුව උදුරගනිද්දි එයාට බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් හිටියෙ නෑ. ඒත් අද වෙනකොට ඒකිට කොල්ලො කී දෙනෙක් හිටියද කියලා හොයල බලන්න. කම්පියුටර් එක අරන් දෙනකොට මං විරුද්ධ වුණා.. ෆේස් බුක් එකවුන්ට් එපා කිව්වට ඇහුවෙ නෑ... මේ වයසෙ ළමයෙකුට මොකටද ස්මාට් ෆෝන් එකක්.... ඒකත් අරන් දුන්න... ළමයා අන්තිමටම නරක් කරා..."

මම කියවිල්ල නවතා උඩ බැලුවෙමි. කංචනගේ සේයාවක්වත් දක්නට තිබුනේ නැත. ඔහු කාමරයට ගොස් දොර වසාගත්තේ ඉබ්බා කටුව තුලට රිංගනවා මෙනි. මේ නිවස තුල, මේ බිත්ති හතර තුල මට කතා කරන්නට කෙනෙක් නැත. සමහර විටෙක මා දවසට වචන හතරක් පහක් හෝ කතා කරනුයේ දුරකථන පණිවිඩයකට පමණි.

ගැහැනියකට කතා නොකර සිටීමට පුළුවන්ද? ඇයගේ මොළය සැකසී ඇත්තේ.... සියළු දුක් වේදනාවන් වචන මඟින් පිට කර මනාසික පීඩනය අඩුකරගන්නා අයුරිනි. මට ඒ අයිතිවාසිකමවත් මේ නිවස තුළ නැත. මා ජීවත්වන්නේ ගොළුවකු සමඟය.





# නවවැනි ගිනිදළුව

ප්‍ර: ඔබේ දියණිය අසනි තැන්නෙකුඹුර ජීවත්වෙන්නේ කොහේද?

උ: මගේ මහත්තය මට කිව්වා ඔහුගේ මවගේ ගෙදර ඉන්නවා කියලා. ඊට පස්සෙ අසන ප්‍රශ්නවලට ඔහු පැහැදිලි උත්තරයක් දුන්නෙ නෑ.

ප්‍ර: කොහොම හරි දරුවා තමන් එක්ක ජීවත් වෙන්නෙ නෑ....

උ: තාත්තා තමයි දුවව එක්ක ගිහින් ආච්චිගේ ගෙදර නතර කරේ.

ප්‍ර: මම තමුන්ට යෝජනා කරනවා තමන්ගේ කුරිරු සැලකිලි හා අමානුෂික පහරදීම් නිසා තමුන්ට දියණියත් එක්කවත් සමගියෙන් ජීවත් වෙන්න බෑ කියලා. නමුත් මවක් හැටියට දියණියත් එක්ක සමගියෙන් ඉන්නව නම් දියණිය තමන්ගෙන් ඈත් වෙලා ඉන්නෙ ඇයි?

උ: ස්වාමිනී... දුව නරක් වුනේ අන්තර්ජාලය නිසා... ඒ හරහා නොදන්නා යාලුවො ආශ්‍රය කරා... මම ඒවාට තරවටු කරන නිසයි එයා මගෙන් ඈත් වුණේ. ඉගෙන ගන්න තිබියදී ඒ කාලය මිඩංගු කරමින් පෙම්වතුන් ආශ්‍රය කරනවා. මම ඒවාට ඉඩ නොදෙන නිසා ඇය තමන්ගෙ නිදහස සොයාගෙන ගියා.

# 9

කාලයා වේගයෙන් ගමන් කරත් මගේ දික්කසාද නඩුව ගොළුබෙලි ගමනින් යනවා යයි මට සිතෙයි. දැන් අවුරුදු දෙකක් තිස්සේ නඩුව ඇදෙයි. නඩුගාස්තු ගෙවීමට මුදල් නැත. කිහිප විටක් ඉරෝමි මට මුදල් දුන්නාය. මගේ යෙහෙළියන්ගෙනුත් ණයට මුදල් ඉල්ලා ගත්තත් මගේ අසරණ බව දැනගෙන ඔවුන් මට කීයක් හෝ දුන්නා මිස ඒවා ණය ගණුදෙනු නම් නොවිණ.

නඩුව දිගටම ඇදෙනවා මිස ඉවර වෙන පාටක් නැත. කංචන ඉන්නේද කුමක්දෝ කණස්සල්ලකින් වග මට තේරුණ නමුත් එයට හේතුවක් විමසන්නටවත් මට අවසරයක් නැත. ඔහුගේ ලෝකය මගෙන් දුරස් වෙමින් කොහේදෝ පාවෙයි. මගේ උපන්දිනය දවසකම මට ආදරෙයි කී ඔහුට දැන් මගේ උපන්දිනයවත් මතක නැත. ඔහු වැනි ස්වාමි පුරුෂයකුගෙන් මා ඒවා බලාපොරොත්තු වෙනවා නම් එයද විහිළුවකි.

"කංචන... දැන් දුව කොහෙද ඉන්නෙ....?"





ඔහු පහළට එනතුරු ඉඳ මම විමසීමි.

"අම්මා ළඟ....."

ඔහු දුන්නේ එම උත්තරයයි. නමුත් ඇය දැන් කංචනගේ මව ළඟ නොමැති බවද මට ආරංචි වී තිබේ.

මා මේ එකතු කරන්නට උත්සාහ කරනුයේ කැලිවලට බිඳී ගිය පිඟානකි. මැලියම් ගා අලවමින් යළිත් පිඟානක් සාදා ගැනීමට වෙර දරන මේ උත්සාහයේ අවසන් ප්‍රතිඵලය කුමක්දැයි මම නොදනිමි.

"දුව ගෙදර ගෙනාවොත් ඔයාට වාසි වෙනවා. ඒක නිසා ඔයා දුව කොහෙ හරි හංගලා...."

"දුව හංගන්න මට ඇති උවමනාවක් නෑ... දුව කීයටවත් ඔයා ළඟට එන්නෙ නෑ....."

"ඒ තරමට දරුවා වෙනස් කරලා...."

ඔහු මාත් සමඟ වැඩිදුර කතා කරන්නේ නැත. කතාවක් ඇදුණ විගස ඔහු කෙසේ හෝ මගෙන් මඟ හරින්නට හදන්නේ නීතිඥයාගේ උපදෙස් පිටය. ඔහුගේ නීතිඥයාට මේ දික්කසාද නඩුව ජයග්‍රහණය කරවීමට මජ්ජු කරගත හැකි කරුණක් ඇත්තේම නැත. ඔහු හිරිකිතයක් නොමැතිව මා දියණියගේ පෙම්වතා සමඟ සම්බන්ධයක් පවත්වාගෙන යන බවක් අහස පොළොව නුහුලන අපරාධ කතාවක් කීවේය.

මෙම නීතිඥයා සිය අඹුදරුවන් ජීවත් කරවන්නේ මෙසේ අනුන්ගේ පවුල් කඩා විසුරුවන්න බොරු බේගල් ඇදබාමින් නම් ඒ වෘත්තියෙන් ඔවුන් ලබන තෘප්තිය කුමක්දැයි මම නොදනිමි.

කංචන පිටත්ව ගිය පසු මා කල්පනා කලේ දියණිය සොයා ගන්නා අයුරුය. සමහරවිට මා ඇයව රැගෙන එනු ඇතැයි සිතා කංචන ඇයව වෙනත් තැනකට යැවුවා විය හැකිය. ඒ නිසා

මම ඇය ගැන තොරතුරු සෙව්වෙමි. ඒ සඳහා මා ගීතිකාගේ උපකාරය ලබා ගත්තේ ගීතිකා අසනිගේ පාසලේත් වියුෂන් පංතියේත් මිතුරියක වූ ගීෂානීගේ මව වූ නිසාය.

ගීෂානි දන් ඉන්නේ උසස් පෙළ අවසන් වසරේය. තවමත් ගීතිකාද මා මෙන්ම දියණියගේ ආරක්ෂාව පතා වියුෂන් පංතිය මුර කරන්නීය.

"මං එයා ඇරෙනකං පංතියෙ ඉන්න එක මගෙ දූවට ලැජ්ජාවක් වුණා... අන්තිමේ වුණේ එයා මගෙන් ඈත් වුණ එක...."

මම අතීතය සිහිපත් කරමින් ගීතිකා හමුවීමට නුගේගොඩ වියුෂන් පංතියට ගියෙමි. දුරකථනයෙන් ඇය අමතන්නට තිබුණත් රුපියල් පනහේ සියයේ රීලෝඩ් දමමින් දුරකථනය පාවිච්චි කරන මට එය කිසිසේත් කළ නොහැකිය.

* * * * *

මාව දික්කසාද කරන්නට, මෙම විවාහය විසුරුවා හරින්නට කංචනට කිසිම සාක්ෂියක් නොමැතිව තිබියදී ඔහු බොහෝ සෙයින් මානසික පීඩාවන්ට හසුවිය. ඔහුට උපදෙස් දෙන්නන්ට ද වුවමනා වූයේ ඔහුගේ යහපත නොව අරක්කු විදුරුවය.

කංචන දුවන්නේ මිරිඟුවක් පසුපසය. ගිණුම්ලිපිකරුවෙකු ලෙස රැකියාව ඇරඹී ඔහු දන් ආයතනයේ විධායක තනතුරක් දරයි. ලක්ශානි නම් ගැහැනියට ඇති තණ්හාව නිසාද වෙනත් ගැහැනු ඇසුර නිසාද ඔහු ජීවිතය නාස්ති කර ගනුයේ ගින්දරට පෙම්බඳින පළගැටියෙකු විලසිනි. ඔහු තවමත් සිටින්නේ ඔහුගේ චෝදනාවන් ඔප්පු කිරීමට සාක්ෂි එකතු කරමිනි.

මා කල්පනාවේ සිටියදීම වාගේ දුරකථනය නාදවිය. නන්නාඳුනන අංකයකි.





"හෙලෝ"

මම ඇමතුම හා සම්බන්ධ වීමි.

"මට ආරංචියක් ආවා ඔයා රුපියල් දාහටත් යනවා කියලා... එනවද මාත් එක්කත්...."

මගේ සියොළඟම දැවෙන්නට විය. හදවතේ ගැස්ම වේගවත් විය. මුළු සිරුරම දහඩියෙන් පෙඟී යද්දී මම ඇමතුම විසන්ධි කළෙමි.

මට එවැනි අමන විහිලු කරන යහළුවන් හෙහෙළියන් නැත. නැවතත් දුරකථනය නාදවිය. මම ඒ නොම්මරය දිනපොතේ ලියාගතිමි.

"එනවද මාත්තෙක්ක නිදාගන්න දාහකට."

එසේ කියමින් පහුවදාද මට ඇමතුම ලැබුණි. මෙය කාගේ අසික්කිත වැඩක් විය නැකිද? ඉරෝමි පැමිණි දිනයක. මම ඉරෝමිගේ දුරකථනයෙන් පෙරකී අංකයට ඇමතුම ගතිමි. එවිට කතා කලේ මැදිවයසේ කටහඬක් ඇති පුද්ගලයෙකි. දුරකථනය ඔහුගේ බව ඔහු මට කීවේය. ඉදහිටක ඔහුගේ පුතා දුර ඇමතුම් ගන්නා වගක් මට කීවේය. මම ඔහුව හමුවීමට ගියෙමි.

"මේ බලන්න.... මේ නොම්මරෙන් මට දිගටම කෝල්ස් ඇවිත් තියෙනවා."

මම මගේ දුරකථනයේ පැමිණි ඇමතුම්වල මතකය ඔහුට පෙන්නුවෙමි.

"චානුක... මෙහෙ වරෙන්."

ඔහු මහ හඬින් කෑ ගැසුවේය. දෙමටගොඩ වූ නිවසක විසූ ඔවුහු සාමාන්‍ය පංතියේ අහිංසක මිනිසුන්ය.

"උඹ මේ නෝනගේ ෆෝන් එකට මෙකෙන් කෝල්

ගත්තද?.... මේ තියෙන්නෙ නොම්මරේ වැටිලා මොකද උඹයි මාලි ඇරෙන්න වෙන කෙනෙක් නෑ මේ තුප්පහි වැඩේ කරන්න.'

කොල්ලා බිය වූ බව මට පෙණින. මොහු කවුද?

"කවුද උඹට මේ නෝනගෙ නොම්මරේ දුන්නෙ. නෝනා පොලිසි යන්න ඉස්සරයි මේ අහන්නේ?"

ඔහු වරද පිලිගත්තේය.

"ඔයා මට කතා කළ වැඩේට අපි යමු එහෙනම් දෙන්ඩකො ඔයාගෙ දාහ....."

මා එසේ කියත්ම ඔහුගේ පියා දුන් අතුල්පහරෙන් වානුක විසි වී ගියේය.

"නෝනත් ගහන්ඩ...."

"එපා.... මම ගහන්නෙ නෑ... මට දැනගන්ඩ ඕන මෙච්චරයි. කවුද මේ නොම්මරේ දුන්නේ?"

තාත්තාත් මාත් ඔහු දිහා කෝපයෙන් බලා සිටියදී ඔහු කට ඇරියේය.

"කොහොමත් පොලිසියේදී ඔයාට ඇත්ත කියන්න වෙයි."

"යාලුවෙක්... අසනි කියලා...."

"අසනි කියන්නෙ... තෝ අර බීච් ගානෙ අරන් ගිය කෙල්ලද...?"

ඔහු හිස වැනුවේය. මගේ හෘද ස්පන්දනය වේගවත් විය. ඇගේ මවිල් කෙලින් වන්නට ඇත. මුළු ඇඟපුරාම හිරිගඩු පිපුණි.

මම වේගයෙන් පාරට දුවගෙන ආවෙමි. අසනි... අසනිගේ





පෙම්වතා... වානුක... මෙවැනි ගුබ්බෑයමකින් රස්තියාදුකාර කොල්ලෙකු යහළු කරගෙන මෙවැනි නින්දිත ක්‍රියාවක් කරවන්නට ඇයට හැකි වූයේ කෙසේද? මේ අම්මාට... එවැනි අසහ්‍ය ඇමතුමක් දෙවන්නට තරම් ඇගේ තත්ත්වය ගිලිහුනේ කෙසේද?.

ඇයව මං මුලා කර ඇත. මේ එකතු කරනුයේ දික්කසාදයට ඇවැසි සාක්ෂිය. දැන් මට කංචන සමඟ ඇත්තේ තරහවකි. සැමි පිරිමියෙකුම... තම දරුවාගේ මවට ආදරය කිරීමට ආදරය කිරීමට බැරිනම් අපහාස නොකර සිටීමටවත් දැන ගත යුතුය.

ඒ වෙනුවෙන් මේ දරුවා යොදාගැනීම කෙතරම් පහත්ද? මේ සියල්ලන්ගෙන්ම මිදෙන්න මේ පාරේ එන වාහනයකට පැන මිය යන්නට මට සිතෙයි.

"උදානී... උඹ මැරුණත් නින්දාව උඹ පස්සෙන්. උඹ මැරෙන්නෙ නරක ගෑනියක් කියල ලේබල් අලවගෙන අනාචාරයේ ගිය ගෑනියක් කියල ලේබල් අලවගෙන...."

මා ඉදිරියටම අවුත් මගේ හිත කතා කළේය. මා වරදේ බැඳී නැත. එහෙත් ලෝකයා මගෙ මුහුණට කෙළ ගහන්නේ මගේ සැමියාත් දරුවාත් එයට අවසර දී ඇති නිසාය.

* * * * *

කංචන උසාවියේදී කළ ප්‍රකාශයෙන් මම මවිත වීමි. මේ මා අවුරුදු ගණනාවක් පෙම් කල මිනිසාදැයි මට සිතාගත නොහැකිවිය. මා දුවගේ පෙම්වතා සමඟ සම්බන්ධතාවයක් පවත්වන බවටත්... ඔහුගේ දෙමව්පියන් ඔහුගේ ආයතනට පැමිණ ඒ බව සැලකර සිටි බවත් ඔහු කියා සිටියේය.

එය මොන තරම් නින්දිත අපහාසයක්ද? මෙවැනි මිනිහෙකු සමඟ තවදුරටත් මා ජීවත්වන්නේ කෙසේද යන්න මටම හිතාගන්නට බැරි විය.

මා අත්දෙක උඩ තියාගෙන හැදූ දරුවා පෙම්වතුන් කීපදෙනෙකු ඇසුරු කර ඇති බව මට හැඟී ගියේය.

මේ සියළු දේ බලා නිශාන්ත යටිහිතින් සිනාසෙන බව මම දනිමි. ඔහු මගෙන් පලිගත් අපූරුව මොන තරම් පුදුම සහගතද?

"මෙක මහත්තයගෙ ඉතාම නරක කාලයක් මෙ කාලය ඇතුලත මහත්තයා හැසිරෙන්නෙ පිස්සෙක් වාගේ... එයාවත් දන්නෙ නෑ එයා මොනවද කරන්නෙ කියලා...."

විඳවන්නට බැරිම තැන මම ඔහුගේ හඳහන බැලෙව්වෙමි. මහා අපල කාලයක් ඔහු පසුකරමින් සිටින බව දෛවඥයා විසින් කීවේය.

"ඒ අපල පල දෙන්නෙ මටනෙ මහත්තයා...."

"ඒක කොහොමත් පොදු දෙයක්.. මහත්තයා වැරදි කරනකොට විඳවන්න වෙන්නෙ නෝනට..... දරුවො වැරදි කරනකොටත් විඳවන්නෙ අම්මා"

ඔහු මගේ හිත හදන්නට වෑයම් කලේය. මම ශක්තිමත් වෙමින් උන්නෙමි. තැලෙන යකඩය ආචාරියා විසින් උඩ පැන පැන තලද්දී හතිවැටෙන්නේ ඔහුටමය. යකඩය ශක්තිමත් වේ. මාද එලෙසය. දුක විඳවන්න විඳවන්න මම ශක්තිමත් වෙමින් ජීවිතයට මුහුණ දෙමි.

මම අටලෝ දහම විශ්වාස කරමි. කංචන ගැන මගේ හිතේ වෛරයක් ද්වේශයක් නැත. සංසාරේ මා කොහේ හෝ යම් පාපකර්මයක් කරන්නට ඇත. කුරුළු කූඩු කඩා විසුරුවන්නට ඇත. දරුවන්ට වෙනස්කම් කරන්නට ඇත. ඒ පව්... මේ ආත්මයේ ගෙවා දමන්නට කංචන මට සහාය වෙමින් සිටී... එපමණය.

* * * * *





"අසනි තැන්තැන්වල තියන්න එපා කංචන... දරුවා ගෙදර ගේන්න එයා හොඳටම නරක්වෙලා ඉන්නෙ...."

කංචන වැඩ ඇරී එනතුරු කාලයට වී රැකගෙන උන් මම කීවෙමි. මගෙන් තේ කෝප්පයක්වත් ඔහු බොන්නේ නැත. ඉස්සර හැමදේම වද වෙවී කළ හැටි මට මතක් වෙයි. ඔහු වෙනුවෙන් කුස්සියේ දුම්ගසමින් බත පිසූ හැටි දහදුක් විඳිහැටි මට සිහිවේ.

"ඔයා දන්නවද අසනි කරලා තියෙන හරිය. මහොම ගියොත් ගල්කිස්සේ බීච් එකේ වැටකෙයියා පඳුරු පීරලා අපට එයාගේ මිනිය තමයි හොයා ගන්න වෙන්නෙ."

කංචන තිගැස්සී මා දෙස බැලුවේය. ඔහුට තිගැස්සෙන්ට තරම් දෙයක් මා කීවේ නැතත් මට ඉන් යම් අමුත්තක් දැණුනි. දරුවා ඔහුගේත් මගේත්ය. අසනි පියාගේ සෙනෙහස කුඩා කාලයේ සිටම වින්දේ නැත. හදිසියේම ලැබුණ තාත්තාගේ ආදරය, තෑගිබෝග හා නිදහස ඇය උපරිමයෙන් භුක්ති විඳිමින් මගෙන් ඈත් වූවාය.

"ඉන්න තැනකින් අසනිව ගෙදර ගේන්න කංචන. ඔයා ඔයාගෙ වාසියට දරුවා යොදා ගන්න එපා."

"ඩිවෝස් එක දුන්න නම් ඉවරනේ.... මට කොහොමත් ඔයත් එක්ක ජීවත් වෙන්න බෑ. දුවත් කැමති නෑ....."

කංචනගේ මේ වදන් කෙසේ ඉවසන්නද? එහෙත් මගේ හොඳ නම කැළල් කරගෙන කිසිවිටෙකත් ඔහුට මම දික්කසාදය නොදීමට තීරණය කරගෙන උන්නෙමි.

"ඔයා හරි නපුරුයි. සැරයි. ඒක ලෝයර්ත් කිව්වා."

"ලෝයර් කොහොමද තීරණය කරන්නෙ මං ගැන... මං කවුද කියන එක ඔයාටත් තීරණය කරගන්න බැරි වුණානං. මට

"මගේ නම්බර් එක නමය. තාම ඩොක්ටර් ඇවිල්ලා නැහැ. අපට ටික වෙලාවක් ඉන්න වෙයි කෙල්ලෙ...."

කවුන්ටරයට මුදල් ගෙවා පැමිණි ඉරෝමී කීවාය.

"කමක් නෑ... ගෙදර ගියා කියල මං මොනවා කරන්නද.... ටීවී බලන්නවත් නෑ.. කංචන ටී වී එක එයාගෙ කාමරේට අරන් ගියානෙ....."

ඉරෝමිගේ දෑස විසල්වුණි. එය අද ඊයේ වුණ සිදුවීමක් නොවේ. මට රටතොට විස්තරයක් දැනගැනීමට තිබුණ ඉඩකඩ ඉන් ඇහිරී ගියේය.

"එක අතකින් මෙහෙම එළියට ආපුහාම මගෙ ස්ට්‍රෙස්එක ටිකක් අඩුවෙනවා."

"ඔයා විඳවන තරම් උදානී...."

ඉරෝමී කම්පා වූවාය.

"ඔයා රස්සාවක් කරොත් මොකද උදානි. ආයෙමත් ප්‍රයිවෙට් ස්කූල් එකක හරි ටීචින් කරන්න පුළුවන්නෙ....."

"මගෙ එකම කෙල්ල හදාගන්න බැරි වුණ මම කොහොමද රටේ ලෝකෙ ළමයි හදන්නෙ..... ඒත් මට ඉස්සරහට ජීවත් වෙන්න නම් මොනා හරි කරන්න වෙනවා."

"ඔයා හිතනවා වැඩී... ඔයා මහ පුදුම ගෑනියෙක් උදානි......."

ඇය මොනවා කිව්වාදැයි මට ඇසුනේ නැත. මගේ දෑස යොමු වී තිබුණේ හදිසියේම එතනට ආ කංචන වෙතය. කංචන මෙතනට එන්නේ කුමකටද? නැවතත් ඔහු සමාජ රෝගයක් හදාගෙනද යන සැකය මහදේ විය. එතැනම වූ මානසික රෝග පිළිබඳ වෛද්‍යවරයාගේ කුටියට ඔහු රිංගා ගත්තේය.





මානසික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් බෙහෙත් ගන්නට තරම් ඔහුට තියෙන රෝගය කුමක්ද? තාත්තාත් දුවත් දෙදෙනාම කීවේ 'මට පිස්සු' කියාය. නමුත් මම තවම නිරුපද්‍රිතව ඉදිමි.

කංචන ඇතුළට ගියේය.

"කවුද දන්නෙ වෙන මොකක් හරි ලෙඩකට ගියාද කියලා....."

ඉරෝමී කීවාය.

"නර්ස්ට එපොයින්මන්ට් නම්බර් එක දීලයි ඇතුලට ගියේ..... ඒ කියන්නේ ඩොක්ටර් වැනල් කරලනෙ....."

ටික මොහොතකින් දොර හැරිණ. කංචන පිටවී ගියේය. ඔහු පිටවනවාත් සමගම.... මම බලහත්කාරයෙන් මෙන් වෛද්‍යවරයා ළගට පැන ගත්තෙමි.

"ඩොක්ටර් එක්ස්කියුස් මී..... මම උදානි තැන්නකුඹුර. දැන් ආව කංචන තැන්නකුඹුරගෙ වයිෆ්...."

මා එසේ කියද්දී වෛද්‍යවරයා මට අසුන පෙන්වූයේ ප්‍රසන්න මුහුණක් මවා ගනිමිනි.

"මට දැනගන්න ඕන මගෙ හස්බන්ඩ් මොනවටද ට්‍රීට්මන්ට්ස් ගන්නෙ කියල....."

ඔහු යමක් තේරුම් ගත්තා වැනිය. ........

"ඔව් මිසිස් තැන්නෙකුඹුර... මාත් බලාගෙන හිටියෙ ඔයා හම්බෙනතුරු තමයි. දැන් මාස තුනහතරක් තිස්සේ මිස්ටර් තැන්නෙකුඹුර මගෙන් බේත් ගන්නවා. මම හැමදාම කිව්වා වයිෆ්ව එක්කරගෙන එන්න කියල."

"මාස ගණනක් තිස්සේ.... දන්නෙවත් නෑ....."

"ඒක තමයි... මම මේ බෙහෙත් කරන්නෙ මානසික ආතතියට... මානසික ආතතියත් එක්ක ඇතිවුණ ටිකක් බරපතල ප්‍රශ්න ටිකක් එයාට තියෙනවා. අපි ඒවා ටිකෙන් ටික ලිහා ගම්මු.. මහත්තයව හොඳින් බලාගන්න. පස්සෙන්ම ඉන්න. එයාගෙ හිත සන්තෝසෙන් තියාගන්න උදව් කරන්න. ඊළඟ වතාවෙ එද්දි මිසිස් නැන්නෙකුඹුරත් හස්බන්ඩ් එක්ක එනව නම් මට පහසුයි."

මට වෛද්‍යවරයා සමඟ කියාගන්නට අවශ්‍ය වූ බොහෝ දේවල් විය. එහෙත් මෙ එයට වේලාව නොවේ. මම දොර ඇරගෙන එළියට ආවෙමි.

"කංචනට මානසික ආතතිය? කංචනට නෙමෙ මටනෙ මානසික ආතතිය හැදෙන්න ඕන හරිනම් මේ වෙනකොට මම ඉන්න ඕන අංගොඩ හරි මුල්ලේරියාවෙ හරි...."

මම අවුත් ඉරෝමි සමඟ කිව්වෙමි. සිද්ධ වූ දෙයින් ඇයද පුදුමයට පත්වෙමින් සිටියාය.





# දහවැනි ගිනිදළුව

ප්‍රः ඔබ සෙත් සෙවණ පෞද්ගලික රෝහලෙන් මානසික රෝගයකට ප්‍රතිකාර ගත්තා.

උ: මට මානසික රෝගයක් තිබුණෙ නැහැ. මෙ ප්‍රශ්න ගැන කතා කරල මට ආතතිය හැදුණා.

ප්‍රः ආතතිය සාමාන්‍ය දෙයක් නමුත් එය වැඩි දියුණු වුණහම මානසික රෝග ඇතිවන බව ඔබ දන්නවාද?

උ: ආතතිය පාලනය කරගන්න මම බෙහෙත් ගත්තෙ.

ප්‍රः ඔබ බෙහෙත් ගත්තේ කුමන වෛද්‍යවරයාගෙන්ද?

උ: වෛද්‍ය තිස්ස මෙන්ඩිස්

ප්‍රः මේ.. ඔහුගෙන් ඔබ බෙහෙත් ලබාගත්තු වෛද්‍ය ප්‍රතිකාර ලේඛනයක්ද?

# 10

මා නිවසට එන විට කංචන පැමිණ තිබුණ බව මා දැන ගත්තේ උඩු මහලේ කාමරයේ විදුලි බුබුල දැල්වෙමින් තිබුණ බැවිනි.

පසුගිය දිනවල මට අමුත්තක් දැණිනි. මානසික ආතතිය අප හැමෝටම පොදු දෙයක් නමුත් විෂාදය වැනි අවස්ථාවකට යන්නට තරම් ඔහුව වෙලාගත් ප්‍රබල කාරණාව මේ දික්කසාද නඩුවද?

එය ගොනු කලේ ඔහුමය. මට අපහාස නින්දා කලේ ඔහුමය. මගේ දියණිය මගෙන් වෙන් කර දික්කසාදයට වාසි ගන්නට මා කුරිරු ගැහැනියක වග උසාවියට පෙන්නන්ට ඔහු නොකළ දෙයක් නැත.

දැන් මේ ඔහුට විපාක දෙමින් තිබෙන්නේ ඒ කර්මයද? ආපසු එමින් ගමනේ අවන්හලකින් ආප්ප කා තේ බීව් නිසා මා රෑට කන්නට කිසිත් හැදුවේ නැත. කන්නට තරම් නිරවුල් මනසක්ද මට නොවුණි.





* * * * *

දවස් දෙක තුනක් කංචන වැඩට ගියේ නැත. ඔහු කෙදිනකවත් කුමන හේතුවක් මතවත් රැකියාවට යාම මග හරින්නේ නැත. මම උඩුමහලට ගියෙමි. දොර ඇර තිබුණ අතර කංචන ඇඳේ දිගා වී සිටියේය.

"කංචන......." මම සෙමෙන් කතා කළෙමි. මා උඩුමහලට එනු ඇතැයි ඔහු බලාපොරොත්තු නොවන්නට ඇත. වෛද්‍යවරයා මට උපදෙස් දුන්නේ ඔහු නියමාකාරව බෙහෙත් ගන්නවාදැයි බලන්නටත් ඔහුගේ හිත සන්තෝෂයෙන් තබන්නටත්ය. එය හොඳ බිරිඳකගේ වගකීමකි. නමුත් මා.....?

"ඔයා දැන් දවස් තුන හතරක්ම ඔෆිස් ගියේ නැහැනේ... මොනවා හරි ප්‍රශ්නයක්ද?"

ඔහු මා දෙස අමුතු අයුරකින් බැලුවේය.

"ඔෆිස් එකේ ප්‍රශ්න... වගයක්."

ඔහු සන්සුන්ව උත්තර දුන්නේය.

"ඔයාට මේ දවස් හොඳ නෑ... මං ඔයාගෙ හඳහනක් බැලෙව්වා..... බෝධිපූජා හරි විදියට තියනව නම් හොඳයිලු."

ඔහු තවත් පුදුමයෙන් මෙන් මගේ මුහුණ දෙස බලා සිටියේය. මම කාමරයේ ඔබ මොබ සක්මන් කළෙමි. කුඩා මේසය මත වෛද්‍ය තිස්සගෙන් ගත් බෙහෙත් විය.

"මොනවටද බෙහෙත් බොන්නෙ?"

"මේ.... හිසේ කැක්කුමක් එනවා... ප්ලීස් උදානි ඔයා දැන් මෙතනින් යනවද... මට පාඩුවේ ඉන්න දීලා....."

"මම යන්නං.... ඔයා කෑම කැවද.....?"

"මම ටිකකින් එළියට යනවා......"

"කමක් නෑ.... ඒත් ඔය බෙහෙත් බොන ගමන් අරක්කු බොන්න යන්න එපා... එතකොට නැති ලෙඩ එනවනෙ......"

ඔහු සවන් යොමාගෙන හිටියා මිසක 'මට ලෙඩ ආවාම තමුසෙට මොකද්දයි' ඇසුවේ නැත. මේ තරම්ම වෙනස් කම් කරද්දීත් මා මේ තරම් ඔහු ළඟින් ඔහු නැර සිටීම මටම පුදුමය.

අප්‍රේල් මාසය එළඹ ඇත. ඉස්සර නම් අපි බලා සිටිනුයේ අප්‍රියෙල් මාසය එළඹෙන තුරුය. රාජගිරියේ මහගෙදර අවුරුද්ද සැමරුවේ මොනතරම් ඉහලින්ද? ඒ සැම මතකයත් සමඟම මට උපුල් සිහිපත් වෙයි. ඔහුත් සමඟ කරට කර අවුරුද්දට කජු ගැසූ සැටි, අවුරුදු ක්‍රීඩා කල සැටි සිහිපත් වෙයි.

ඉරෝමීගේ දුරකථන ඇමතුම මට ලැබුනේ ඊළඟ මොහොතේය.

"උදානී.... මොකද කරන්නෙ....?"

"මුකුත් නෑ... ඉරෝ... කරන්න තරම් වැඩකුත් නෑ....."

"කෑවද උදේට....."

"රෝස් පාන් එකක් අරගෙන කෑවා... සීනි සම්බලත් එක්ක...."

"ෂත් මරුනේ......"

"මගෙ දුප්පත් කැමට හූල්ලන්න එපා. මොකද.... අදත් මොනවට හරි කඩේ යන්න ඕනද මං......."

මං ඇහුවේ විහිලුවටය. එසේ හෝ විහිලුවක් කරමින් හඬ නඟා සිනාසෙන්නට මට උවමනා වී තිබුණි. නොඑසේ නම් මට දූනෙනුයේ මා ජීවත්වන මළමිනියක් පරිද්දෙනි.





"අනේ ඔව් කෙල්ලෙ... මේ දවස්වල හරි ක්‍රූඩ් එක... අවුරුද්දට ඇඳුම් ටික අරං දාන්න මහරගම යමුද....?"

"මං ඉතින් හැමෝටම කඩේ යන එකා. හරි හරි යමු.. මටත් වීත්න කැල්ලක් හරි ලැබෙනවනේ... මම එන්නං.."

ඉරෝමීට පොරොන්දු වුණෙමි. දැන් කාලයක් තිස්සේ මා යන එන තැන් ගැන කංචන විමසන්නේ නැත. ඔහු යන එන තැන් මා දන්නේත් නැත. අපි එකම වහලක් යට ඉඳගෙන දැන් අවුරුදු කිහිපයක් තිස්සේ දික්කසාදයට තඩු කියන්නෙමු.

* * * * *

ඉරෝමීට සාරි කිහිපයක් ගෙන අපි සාරි මන්දිරයෙන් ඉවතට ආවෙමු. ඇයට මුදල් මදි වූ නිසා ළඟම වූ කොමර්ෂල් බැංකු ශාඛාවේ ටෙලර් යන්ත්‍රය පාවිච්චි කිරීමට ඇයට උවමනා විය. අව් කණ්නාඩි දාගත් පුද්ගලයෙකු පෝලිමේ විය. ඔහු ටෙලර් යන්ත්‍රය පාවිච්චි කර පිටතට පැමිණෙනවාත් සමඟම මා දැක නැවතුණේය.

"උදානී... මාව අඳුරන්න පුළුවන්ද?"

ඔහු අව් කණ්නාඩිය ඉවත්කරමින් ඇසුවේය. මේ මුහුණ මට හොඳට හුරුය. රැවුල වවා තිබුණි. එහෙත් මැදි වියට අවතීර්ණ වෙමින් සිටිනා බව කියන්නට මෙන් ඒ රැවුලේ අතරින් පතර ගස් දෙක තුනක් ඉදී තිබුණි. එය ඔහුගේ කාර්ය බහුලබව කියාපාන්නාක් මෙන් විය.

"සොරි.... මට.... මට මතක නෑ....."

"ඉස්සරත් ඔහොම තමා... ආඩම්බරයි..... ඒත් ඔයා ගිහ්දා මගෙ ජීවිතේ නොහිතපු දේවල් ගොඩාක් සිද්ධ වුණා."

"ක....වි.....න්.....ද......"

මම වචන එකතු කළෙමි. මගේ යොවුන් වියේ මට ප්‍රේම කල කවින්දය. උපුල්ගේ මරණයටත් කවින්ද වක්‍රාකාරයෙන් හවුල් නොවේදැයි මට එක්වරම හිතුණි.

"හල්ලෝ කවින්ද කොහෙද මේ? කවද්ද ආවෙ අනේ.. කෝ උපේඛා......?"

ඉරෝමි කෑ ගසමින් අප අතරට පැමිණියාය. පරණ මිතුරා දැකීමෙන් ඇය ආනන්දයට පත්ව උන්නාය.

"මොනවා හරි බොන ගමන් කතා කරමු."

එහෙත් මට ඕනෑ වූයේ සැඟවී ගන්නටය. මට කවින්ද සමඟින් කතා කරන්නට කිසිම දෙයක් නොමැති විය. එසේ වූ නමුත් මේ ඉන්නේ ඒ පාසල් වියේ දුටු දඟකාර විසේකාර ශිෂ්‍යයා නොවේ. දරුවන් දෙදෙනෙකුගේ තාත්තා කෙනෙකි. උපුල්ව අත් අරිමින් ඔහුට සියදිවි නසාගන්නට ඉඩහල උපේඛාගේ සැමියාය.

"අපිත් අවුරුද්දට ෂොපින් කරන්න ආවා... මහන්සිත් එක්ක... මොනවා හරි බොන්න තමයි මේ සල්ලි ගන්න ආවෙ...."

"ඉරෝමි නම් ඉස්සර වගේමයි."

කවින්ද සිනාසෙමින් කීවේය.

"ඇයි උදානි වෙනස් වෙලාද?"

"උදානි වෙනස් වෙයි කියලා මං බලාගෙන හිටියා... ඒත් ඒක වුණේ නැති හින්ද මගේ ජීවිතේ වෙනස් කරගන්න වුණා."

අප තිදෙනාම අවන්හලේ රවුම් මේසයක වාඩි වුණෙමු. උදේ හොඳට අව්ව පායා තිබුණත් මඳක් වැහිබර ගතියක්ද විය. බක් මාසයට කොහොමත් අකුණු ගසමින් වහින්නේය කාලගුණය වෙනස් වෙයි. දේශගුණය වෙනස් වෙයි. ජීවිතයද වෙනස් වෙයි.





සැම කයෝර ගිම්හානයක් අවසානයේම යළිත් වසන්තයක් පැමිණෙයි......

"මං ගිහින් බොන්න දෙයක් ගේන්නම්.. කවින්ද මොනවද බොන්නේ......?"

"මට.... ඔරෙන්ජ් ජූස් එකක්....."

ඉරෝමි උවමනාවෙන්ම අප දෙදෙනා මේසයේ තනිකර ගියායැයි මට සිතුණි. මේසය මත එහෙ මෙහෙ යන මගේ ඇඟිලි තුඩු දෙස කවින්ද බලාසිටියේය. මොනවා හෝ කතා කර මේ නිහඬතාවය කවුරුන් විසින් හෝ බිඳ දැමිය යුතු විය.

"ඇයි කවින්ද ලංකාවට ආවෙ නිවාඩුවකටද?"

මම.. නිහඬතාවය බිඳ දමන්නට පුමුබ වූවෙමි. ඔහුගේ ලියුම නොබලාම ඔහුට ආපහු යැව්වේ උපේඛා අතය. අද උපේඛා ඔහුගේ බිරිඳය. මේ ලෝකයේ යම් යම් දේවල් සිද්ධවන්නේ කෙතරම් අපූර්වජනක ලෙසද.

"මගේ අම්මා නැති වුණා.... පෙරේදා පියුතරල් එක තිබුණේ......"

"අනේ..... අපි දන්නෙත් නෑ..."

"දැනගන්නත් අපි අතරෙ කිසිම කනෙක්ෂන් එකක් තිබුණෙ නැනේ...."

"ඒක තමයි.... මේ අවුරුදු තුනකට විතර උඩදී වගේ තමයි.... මට ඉරෝමි කිව්වෙත් කවින්ද උපේඛා බැඳලා කියලා.... උපේඛා ගෙදරද?"

ඔහු කිසිත් කිවේ නැත.

"ඔයා මැරි කරේ කංචනද?"

මම හිස වැනීමි.

"බබාල ඉන්නවද?"

"බබාල නෙමෙයි... අවුරුදු දහනමයක දුවෙක් ඉන්නවා."

මම අමාරුවෙන් කියාගතිමි. මගෙන් පලිගන්නව යයි කියූ රුදුරු ප්‍රේමවන්තයා මොහු දැයි මට සිතාගන්නට නොහැකිය. මම ඉරෝමී සිටිනා දෙස බැලිමි. ඇය උවමනාවෙන්ම පරක්කු වෙමින් කෑම ජාතිවල මිල අසමින් කවුන්ටරය අසල කාලය මිඩංගු කරන්නීය.

"අවුරුදු ජයටම සමරන්න වගේ... සරුවට ෂොපින් කරලා තියෙන්නේ....."

"මට නෙවේ... මම ඉරෝගේ තනියට ආවෙ...."

"ඔයා මාත්තෙක්ක තරහෙන්ද ඉන්නෙ......?"

"අනේ නෑ... ඒත්...."

"ඇයි ඒත් කිව්වෙ... තරහ හිතේ තියෙනව නේද?"

"අපි දැන් අතීතය ගැන කතා නොකර ඉම්මු ඒ ගැන කතා කරා කියල වැඩක් නැනේ....."

"මට සමාවෙන්න උදානි...."

මේසය මත වූ මගේ අත මත අත තබමින් කවින්ද කීවේය. ඔහු නිසා මම අතීතයේ නරක නාම ඇසුයෙමි. ඒ ඔහුගේ දඩබ්බර කොලුකම නිසාය.

"මොකටද සමාව ඉල්ලන්නෙ...? වෙන්න ඕන දේවල් ඒ ඒ විදිහට සිද්ධ වුණා. මට එකම දුකයි තියෙන්නේ... ඒ උපුල් අකාලෙ මැරුණු එක...."

"උපුල් අහිංසක වැඩියි උදානි......"





කෑම සහිත සහිත බත්දේසිය රැගෙන ඉරෝමී පැමිණෙතු දුටු මම හුස්මක් ගත්තෙමි.

"කන්න... මේ දැං ආපු ෆිෂ් රෝල්ස්...."

ඉරෝමී රෝල් එකක් ගෙන සෙමෙන් සපන්නට වූවාය.

"ඉතිං ඉතිං කියනවා කවි. කෝ උපේඛා....?"

ඉරෝමීද පරණ ප්‍රශ්නය ඇසුවාය.

"එයා එහෙ....."

"පුතාලා...."

"පුතාලත් එහෙ... මං ඉන්නෙ තනියම"

"ඒ මොකද....."

"අපි ඩිවෝස් වුණා....."

ඔහුගේ වචනයෙන් මම ගැස්සී ගියෙමි.

* * * * *

"උදානි, මම අසනි ගැන හොයලා බැලුවා. අසනි නුගේගොඩ මහ ගෙදර නම් නෑ....."

ඉරෝමී මට දුරකථනයෙන් අමතා කීවාය. මා උන්නේ නිවසේය. එදාත් ඔහු වැඩට ගිය දිනයක් නොවීය.

"එතකොට දුව කොහෙද කියලා හොයා ගන්න විදිහක් නැද්ද? ඔයා කාත් එක්කද ගියේ."

"මම නෙමෙයි ඇත්තටම ගියේ"

"එහෙනම්...."

"කවින්ද...."

මගේ පපුව ගැහෙන්නට ගත්තේය. එසේ නම් මේ වන විට ඉරෝමි මා ගැන සියලුම තොරතුරු කවින්දට පවසා අහවරයි.

"කවින්ද ගියේ කංචනව ඉන්නවද කියලා හොයාගෙන. නැන්දම්මා ඔක්කොම විස්තර කියලා... කොහොමත් ඒ කාලේ එකට හිටපු යාළුවොනේ......"

"ඇයි.... ඉරෝ... කවින්දට මං ගැන කිව්වෙ...? එයා හිත්ද නේද.... හුඟක් දේවල් වුණේ....?"

"ඒ කවින්ද නෙමෙ ඉන්නෙ දැන්... මාත් එක්ක කිව්වා... ඔයාව ඕන හින්දලු එයා උපේඛාට කිව්වෙ උපුල් එක්ක යාළු වෙන්න කියලා... ඒ උපුල් ඔයා එක්ක යාලු වෙයි කියන බයට..... අන්තිමේ... උපේඛාව බඳින්න ලෑස්තිවෙලා හිටපු උපේඛගේ මස්සිනා වෙන කෙනෙක් බැන්දා... උපේඛා අන්තිමට කොහොම හරි කවින්දගෙ ඇඟේ එල්ලුණා...."

"ඒක සාධාරණයිනේ... එයා හින්දනෙ සේරම වුණේ....."

"අන්තිමට කවින්දට රට යන්න චාන්ස් එක එද්දී... ඒ හදිස්සියට ඔයා කංචන එක්ක යාළුවෙලාලු.... ඊට පස්සෙන් පහු තමයි කවින්ද උපේඛාව බැඳලා තියෙන්නෙ... කොහොම හරි කවින්ද උදව් කරනවා කිව්වා ඔයාට දුව හොයාගන්න...."

මම සැනසුම් සුසුමක් හෙලුවෙමි. එහෙත් මේ දේවල්වලට කවින්දව සම්බන්ධ කරගැනීමෙන් සිදුවන්නේ තවදුරටත් මගේ නමට නරකක් එකතු වීම පමණක් නොවේද?





# එකොළොස්වැනි හිනිදළුව

ප්‍ර: ඔබේ බිරිඳ අනියම් සම්බන්ධතාවයක් පැවැත්තුවා කියල ඔබට ඔප්පු කරන්න පුළුවන්ද?

උ: මට ඔප්පු කරන්න හැකියාවක් නැහැ. ඒත්..... මම ඒ ඔක්කොම දන්නවා. එක අම්මා කෙනෙක් සහ තාත්තා කෙනෙක් මගේ කාර්යාලයට ඇවිත් මට චෝදනා කළා. මගේ බිරිඳ එයාගේ පුතා චානුක සමග අනියම් සම්බන්ධතාවයක් පවත්වනවා කියලා.

ප්‍ර: ඔබ කලින් කිව්වා. චානුක කියන්නෙ දුවගේ මිත්‍රයෙක් කියලා. එතකොට අම්මා යාළුවුනේ මේ දුවගේ මිත්‍රයා එක්කද?

උ: එසේය ස්වාමිනි.

ප්‍ර: එහෙනම් දෙනෙත් කියන්නේ කවුද?

උ: දෙනෙත් කියන්නේ මගේ දුවගේ දූන් පෙම්වතාට.....

# 11

ඤ

මම නම් කියන්නෙ උදානි ඔයා දූව ගැන කරදර වෙන එකේ තේරුමක් නෑ කියලා.... එයා කීයටවත් ආයෙ මේ ගෙදරට එන්නෙ නෑ......"

කවින්ද මා හමුවීමට පැමිණියේ ඉරෝමි සමඟය

"කංචන ගෙදර ඉන්නවද?"

"නෑ... ඇඳගෙන කොහෙද මන්ද ගියා. මං... තේ ටිකක් හදාගෙන එන්නම්"

මම කුස්සියට ආවෙමි. ඉරෝමි ද මා පසුපසින් කුස්සියට ආවාය. මම ගෑස් ලිප දල්වා කේතලය ලිප තැබුවෙමි.

"දවල්ට කෑවද?"

ඇය වළං හැර බැලුවාය. උයා තිබුණේ සෝයාමීට් කරියක් පමණි. මා දුන් කෑම කන්නේ එක ව්‍යංජනයක් සමඟ පමණි. කංචනගෙන් දුන් සතයක්වත් ලැබෙන්නේ නැති තරමය. මුදල් ඉල්ලා සිටියහොත් මේසය මත රුපියල් සියයක්, දෙසීයක් පමණ





තබා යන්නේය. මා කුසගින්නේ සිටින වාර ගණන, තේ ටිකක්වත් බොන්නට සීනි, කිරි පිටි නොමැතිව සිටි වාර ගණන වැඩිය.

"තේ ඕන නෑ... මං දොඩම් ටිකක් ගෙනාවා. ඩ්‍රින්ක් එකක් මං හදාගෙන එන්නම්. ඔයා ගිහින් කවින්දත් එක්ක කතා කරන්න."

"කවින්දට අසනි මුණගැහිලද?"

"ඔව්....."

මගෙ හෘද ස්පන්දන වේගය වැඩි වන බව මට දැනෙන්නට විය. මම වහාම සාලයට දුවගෙන ආවෙමි.

"කවින්ද..... දූව කොහෙද ඉන්නේ කවින්ද?"

"මට ඔයා ගැන දුකයි.... අම්මා කෙනෙකුට තියෙන දරු කැක්කුම මං දන්නවා. ඒත් අපට අසනිගේ පැත්තෙනුත් හිතන්න හුඟාක් දේවල් තියෙනවා. අම්මයි තාත්තයි දෙන්නා අතරේ ප්‍රශ්න ඇති වෙනකොට දරුවො අසරණ වෙනවා. මගෙ පුතාලා දෙන්නටත් ඒ ප්‍රශ්නෙ ආවා. ඒත් උපේඛා මට සමාව දෙන්න කොහෙත්ම ලෑස්ති වුණේ නෑ... එයාට ඕන වුණේ ඩිවෝස් එක....."

"දූව කොහෙද ඉන්නෙ......?"

"දූව ඉන්නෙ දෙනෙත් ළඟ.... එයාගෙ බෝයිෆ්‍රෙන්ඩ් එක්ක එයා ගිහිල්ලා....."

"දෙයියනේ... මෙකි මරන්න වටිනවනෙ හැමදේම කරගෙන අන්තිමට ඒකත් කරගත්තා.., එච්චරයි ඉතුරු වෙලා තිබුණේ... අන්තිමට ඒකත් කරගත්තා."

"අන්තිමට එයා ඒ තීරණය අරගෙන තිබුණා...."

"එයාගෙ තාත්තණ්ඩි මේක දන්නවද?"

"කංචන දන්නවලු... එයා ළඟදිම දෙන්නම පිළිවෙලක් කරනවා කියල කිව්වලු....."

"එහෙමද...?"

මම සුසුමක් හෙලුවෙමි. තවත් මට හෙලන්නට සුසුම් ඉතුරු වී තිබීම තවත් පුදුමයකි.

"මං කංචනට කතා කරන්න ට්‍රයි කළා. ඒත් එයා මගෙ ෆෝන් එකට ආන්සර් කරේ නෑ....."

"ආන්සර් කරන්නෙ නෑ. ඉරෝමිට වුණත් මූණ දෙන්නෙ නෑ.... අසනි වුණත් එහෙමයි. හිතුවක්කාරයි. මොන වරද කරත් තමන්ගෙ අම්මට මෙහෙම කරන්න පුළුවන්ද දරුවෙකුට ආ... මං එයාට කල වරද මොකක්ද? වැරැද්දකට තමුන්ගෙ අම්මා ඇරෙන්න... අල්ලපු ගෙවල්වල ගෑණු ගහන්නද?"

මම මගේ වේදනාව කවින්ද හමුවේ දිග ඇරියෙමි. මගේ ජීවිතයේ කළු චරිතයක්ව හිටි කවින්ද කෙරෙහි තිබුණ අප්‍රසන්නතාවය දැන් මගේ හිතේ නොමැත. පාසල් වියේදී මා ඔහුගේ යෝජනාව ප්‍රතික්ෂේප කලේ ආදරයක් මට අනවශ්‍යව තිබුණු නිසාය. ඔහුගේ ලියුම නොබලාම උපේඛා අත ආපසු යැවීම නිසාත්, ඔහුගේ මිත්‍රයන් ඉදිරිපිටම උපේඛා විසින් ඒ ලියුම ඔහු අතට පත් කිරීම නිසාත් ඇති වූ ලැජ්ජාව නිසා ඔහු මට වෛර කලේය. ඔහු මගේ කුමරි බඹසර බිඳී වගට හැම තැනම කියමින් මට නින්දා කලේය.

මගේ චරිතයේ කළු ගෑවේ කවින්දය. එදා පටන් මා වල් කෙල්ලක බවට සමාජය පිළිගන්නට ඇත. මගේ විවාහයෙන් පසුවත් ඒ කළු පැල්ලම මා පසුපස හඹා ආවේය. කංචනගේ අම්මා නංගී පවා මා වල් ගැහැනියක බව කීහ. නිශාන්තට මාව නොමගට යොමු කරගැනිමට වූ එකම ආයුධය එය විය.

මා අඬ ගසන ඕනෑම එකෙකු සමඟ මුදලට යන වග ඔහුගේ





ත්‍රීවීලර් මිතුරන් අතරේ ප්‍රචාරය කලේ ඔහුය.

අවසානයේ මගේ දියණියද මට ඇඟිල්ල දිගු කළාය. සම්මත මතය ඇයද පිළිගත්තාය. මෙ සියළු දෙයට කවින්ද වගකිව යුතුද?

ඉරෝමි අප වෙත දොඩම් බීම රැගෙන ආවේ ඇයම ගෙනා චොකලට් කේක් එකද කපා තසිමක තබාගෙනය.

"මට ඔයාගෙ වේදනාව දැනෙනවා උදානී... මේ කත්පර්ට මාත් අතීතයට ගියා. ඒ කාලෙ මට ඕන වුනේ ඔයාට ආදරේ කරන්න. ඊට පස්සෙ ඔයාට වෛර කලා.. ඔයාගෙ නම කැත කලා."

"කවින්ද... ඇති.... ඔය ගැන කොච්චර කතා කලත් අපිට ආයෙ ආපස්සට යන්න බෑ.... ගිහින් ඒ වැරදි හදා ගන්න බෑ...."

ඔහු එය අනුමත කරමින් හිස වැනුවේය.

මම ඔහුට දොඩම් වීදුරුව පෑවෙමි බොහෝ පිපාසිතව හිටි අයෙකු සේ කවින්ද දොඩම් වීදුරුව බිගෙන බිගෙන ගියේය.

"දුව... කසාද බැඳලද...?"

අවසානයේ මට අසන්නට වුවමනා වූයේ එයයි. මා දන්නා පරිදි ඇයව විනාශ කලේ ඇගේ චාතුක නමැති පෙම්වතාය. මා කොල්ලෙකු සමඟ පැන ගොසින් සිටින වගට ඇගේ යහළු යෙහෙළියන් අතරේ ඇයම ප්‍රචාරය කර තිබුණ වග මට ආරංචි වූයේ පසුවය. තම මවට මෙසේ ගරහද්දී, නින්දා අපහාස කරද්දී ඇය මොන තරම් පාපයක් කරගන්නවාද කියා ඇය දන්නේ නැත. එහෙත් මා තවමත් ඇයට අනුකම්පා කරනුයේ ලය ගිනිගෙන දැවෙන දරු කැක්කුමටය. දෙමාපියන්ගේ ලේ සෙලවීම ආනන්තරීය පාප කර්මය කර ගැනීමට හේතුවකි... ඇය මගේ

රුධිරය සොලවා නැතත්... ඒ හා සමාන ගින්දරකින් මා දවා හළුකර හමාරය. පුදුමය ඇය වෙනුවෙන් හඬන්නට තැවෙන්නට මට තව තවත් කඳුළු හා සුසුම් ඉතිරිව තිබීමය.

"තාම නෑ... මොන හේතුවක් හරි හින්දා එයා දෙනෙත් එක්ක ගිහින්......"

"දෙනෙත් රස්සාවක් කරනවද?"

"එයාගෙ තාත්තගෙ බිස්නස් කරගෙන යනවා...."

"එහෙනම් අසනි ආයෙ කවදාවත් අපි ළඟට එන්නෙ නෑ... මං දුක්විඳලා හදපු කෙල්ල මට නැතිව ගියා... ඒ හැමදේටම... ඔයත් වග කියන්න ඕන කවින්ද....."

මම මහ හයියෙන් ඉරෝමිගේ උරහිසට වාරු වී හැඩුවෙමි. කවින්ද නිහඬවම සිටියා මිසක වචනයක්වත් කතා නොකලේ මගේ චෝදනාව පිළිගත් නිසා විය යුතුය. අතීතය ගැන කතා නොකර ඉමු යයි කිව්වද අප නිරතුරු ජීවත්වන්නේ අතීතයත් සමඟය. අතීතයේ පසුතැවීම්, වැරදීම් සියල්ල අතීත අත්දැකිම් වී වර්තමානය කරා පැමිණියත්.... කරදර වේදනාව අඩුවන්නේ නැත. සමහරවිට ඒ අප... මනසින් අතීතයේම ජීවත්වන්නට කැමති නිසා විය යුතුය.

* * * * *

"කංචන... දුව කොහෙද ඉන්නෙ....?"

මා තව වරක් ඔහුගෙන් විමසුවේ ඔහු කිසිත් නොදොඩා සුවඳ හමන කොත්තුවක්ද ෂොපින් බෑගයක දමාගෙන යන අතරේය.

"තමුසෙ මේ... එක එකා යවන්න එපා දුව හොයන්න... අපට පාඩුවේ ඉන්ඩ අරිනවා. තේරුණාද?"





කංචන නොසිතූ පරිදි මට කෑ ගැසුවේය. විවාහ ජීවිතය තුළ යම් යම් තැන්වලදී මා කුණාටුවක් සේ දඩි වූ බව ඇත්තය. ගැහැණියක හැම විටම සුවඳ හමන මෘදු රෝසමලක් විය යුතු නැත. සමාජය අප තලන්නේ පෙලන්නේ එවිටය. මගේ යොවුන් වියේ මා ඕනාවටත් වඩා අහිංසක වීම හේතුවෙන් ද ගුණගරුක වීම හේතුවෙන්ද මට වැරදී ගිය තැන් බොහෝය.

"කංචන මගෙ කට අවුස්සාගන්න එපා......"

"මටයි දුවටයි පාඩුවෙ ඉන්න තිබුණා... ඩිවෝස් එක හම්බුණානම් ඒකත් කල් යනවා... නඩුව දිගට දිගට ඇදෙනවා....."

"අපරාදෙ නේද ගෙවිලා යන තරුණ කාලෙ.. මම කිව්වෙ මගෙ නෙමේ... අර ගෑනිගෙ...."

කංචන උඩට ගියේ තව දුරටත් කතා කිරීමෙන් ඵලක් නැති නිසාය. ඇත්තෙන්ම අපට සමගියෙන් ජීවත්වන්නට පුළුවන්කමක් නැද්ද? මගේ කුලගෙයි සිහිනය තවදුරටත් වලංගු නොවන්නේද එහෙත් මම අන්තිම බිංදුව දක්වාම උත්සාහ කරනුයේ ඔහුත් සමග සතුටින් ජීවිතය ගත කරන්නටය. මගේ මුළු ජීවිතයම ඔහුට කැප කරමින් මා මේ ඔහුගේ ජීවිතයෙන් යදින්නේ මොනවාදැයි මට නොතේරේ.

මම අද දිනයේ හාල් මිටක් ලිප නොතැබීමි. ඔහු කොත්තුව කන සුවඳ මට පහලට දැනෙයි. මටද බඩගිනි දැනෙයි. මම ක්‍රීම්ක්‍රැකර් බිස්කට් පැකැට්ටුව කඩා විස්කෝතු දෙකක් අතට ගෙන කේතලයට වතුර කෝප්පයක් දමා ලිප තැබුවෙමි.

* * * * *

"දුව ඔයා පිලිගන්න කැමති නෑ උදානි... ඒක ඔයා තේරුම් ගන්නෙ නෑ... ඒත් ඔයා කියන හින්ද.. මම එක්ක යන්නම්....."

කවින්ද සිය කාරයට මාව නග්ගවා ගත්තේය. දුව සිටිනවා යයි කිව්වේ කඩුවෙල පැත්තේ නිවසකය.

"මට හිතාගන්න බෑ. ඔයා වගේ හොඳ අම්ම කෙනෙක් ළඟ ඉද්දි ළමයෙක් නරක් වුණේ කොහොමද කියල... අර ඔ අයි සී කිව්ව වාගේ ඔයාට තිබුණෙ එයාව පරිවාසෙට දාන්න."

ඉරෝමි විසින් මගේත් කංචනගේත් අරගලය සියල්ලම පාහේ ඔහුට පවසා ඇතැයි ඔහුගේ එම ප්‍රකාශයෙන් මම තේරුම් ගත්තෙමි.

"මට ඔයා ගැන හිතාගන්නවත් බෑ"

"කවින්ද උපේඛට ආදර් නොකළ නම් ඇයි ඔයා උපේඛව බැන්දෙ....."

"උපේඛා බඳින්න හිටපු කෙනා වෙන මඟුලක් කරගත්තා. වෙන කවුරුවත් නෙමෙ ඒ උපේඛාගේම මස්සිනා... පවුලෙ නෑදෑයින්ගේ නරක නාමෙ උපුල්ගෙ කේස් එකත් එක්ක කෙලින්ම ආවෙ උපේඛාට.... එයා අසරණ වුණා... ඒ දවස්වල මම රට යන්න ලෑස්තිවෙලා හිටියෙ.... මම ආපහු ආවෙ අවුරුදු පහකින්... ඒ එනකොටත් උපේඛා බැඳලා නෑ. එයාව අරගෙන ගිහින් දියතලාවේ එයාලගෙ බාප්පා ළඟ නතර කරලා තිබුණෙ."

"ඒ හින්දා තමයි උපේඛා ගැන ආරංචියක් තිබ්බෙ නැත්තෙ"

"පස්සෙ ඊටත් අවුරුදු දෙකකට පස්සෙ මං උපේඛව මැරිකරා."

"අනුකම්පාවටද? ආදරේටද....."

"නෑ ... ඇත්තටම ආකර්ශනයට කිව්ව නම් හරි... ඒ කියන්නෙ ඉස්කෝලෙත් අවුට් වෙලා අවුරුදු හත අටකට පස්සෙ උපේඛාට හොඳ පෙනුමක් තිබුණා...."





"අන්තිමට ඇයි ඩිවෝස් වුනේ...?"

මට දැනගැනීමට තිබුණ කාරණය එයයි.

"මැරි කරාට පළවෙනි මාසෙ ඉඳලම අපි අතරේ නොගැලපීම තිබුණා. එයා හැම තිස්සෙම කියන්න ගත්තා එයා උපුල් වාගෙ නෙමෙයි කියලා."

"දෙයියනේ......"

මට කියැවිණි. මේ සිදුවීම් සමූහය මාලයක මුතු මෙන් එකිනෙකට සම්බන්ධවන හැටි පුදුමය. එසේ නම් ජීවිතේ පසුකාලීනව හෝ ඇය උපුල්ට ආදරය කර තිබේ.

සමහර විටක මට සිදුවුයේත් එය වන්නට පුළුවන. මා කංචනගෙන්ද උපුල්ව බලාපොරොත්තු වූවා නොවේද?

"එයාගෙ හිතේ උපුල් ජීවත් වුණා... ඒත් අපේ ජීවිතේත් ගලාගෙන ගියා... අපේ නොගැලපීම හින්ද ඇත්තටම මම... දන්නෙම නැතුව වෙන අෆෙයාර් එකක පැටලුණා....."

මම මගේ රවුම් ඇස් කරකවා කවින්ද දෙස බැලුවෙමි.

"සමහර විට උපේඛා කතා කරොත් ඔයාට කියාවි.... මම හැම තිස්සෙම ඔයාගෙ ගතිගුණ උපේඛාගෙත් හෙව්වා කියලා...."

"කවින්ද... මට පුදුමයි ඔයා ගැන ඔයා මට වෛර කලා....."

"නෑ... උඩින් ඇතිවුණ ලැජ්ජාවට මම ඔයාට වෛර කරන බව පෙන්නුවා... ඒත් මගෙ හිතේ එහෙම දෙයක් තිබුණෙ නෑ....."

කවින්ද කාරයේ වේගය බාල කරමින් අතුරුපාරකට කාරය හැරවුයේය. කඩුවෙල නගරය පසු කර පැමිණි බව මට

මතකය.

ඒ අතුරු පාරේ... ගේට්ටුවක් නැති සිමෙන්ති ගලින් නැංවූ බාගෙට නිම කල කුඩා නිවසක් ඉදිරියේ කාරය නවත්වන ලදී. මා වාවා ගත්තේ අමාරුවෙනි. මාත් කංචනත් විවාහ වූ අළුත බත්තරමුල්ල ප්‍රදේශයේ ජීවත් වූයේ මෙවැනිම අඩුපහසුකම් ඇති නිවසකය. අසනිටත් දුක් විඳින්නට සිදුව ඇත. පැත්තේම තිබුණේ එවැනිම ගෙවල් සමූහයකි. ඒවාට 'මුඩුක්කු' කියා කියනවාට මගේ සිත කැමති නැත.

"දුව ඉන්නෙ මේ ගෙදරද?"

මම පුදුමයෙන් මෙන් කවින්දගෙන් ඇසුවෙමි.

"මොනවා උනත් අම්මා දක්කාම දුවෙකුගේ පපුව උණුවෙනවා... ගෙදර ඇති. ඔයා බැහැලා ගිහින් කතා කරන්න....."

මම කාරයෙන් බිමට බැස්සෙමි. අවට මිනිසුන් ගැහැනුන් කිහිප දෙනෙකුද ජනෙල්වලින් ඔළුව දමමින් අපව නිරීක්ෂණය කරන අයුරු මට පෙණින.

"අසනී... අසනී....."

මම කතා කලෙමි. නිවසෙහි දොර වසා තිබුණේ නැත. දෙනෙත්ගේ පියා ව්‍යාපාර කරනවා යයි කියුවාට මා සිතා සිටියේ මීට වඩා පිලිවෙළකට, වත් පොහොසත්කම් ඇතිව ජීවත්වන මිනිසුන් කියාය.

මුහුණු පොතෙන් සොයා ගන්නා පෙම්වතුන් මොන තරම් රැවටීමක් කරනවාද කියා මට සිතා ගත නොහැක.

"මෙහාට ආවෙ මොකටද?"

අසනී උන්නේ ඩෙනිම් කොට කලිසමකට පිරිමියෙකුගේ





ටිෂර්ට් එකක් ඇඳගෙනය.

"දුව... මං කියන දේ අහන්න...."

"මට කිසිම උවමනාවක් නෑ ඔයා කියන දේ අහන්න. මට ලැජ්ජා නොකර මෙතනින් යන්න කරුණාකරලා."

"මං ඔයාට නරකක් කරන්න හිතුවෙ නෑ කවදාවත්....."

"ඇත්තද? අර මිනිහා කවුද? ඒත් ඔයාගෙ බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක්ද? තාත්තයි මාවයි දෙන්නත් විනාශ කරා... ඩිවෝස් එක දෙන්නෙ නැතිව තාමත් තාත්තව අමාරුවෙ දානවා..... ඔයා මෙතනින් ගියෙ නැත්තං මං පොලිසියට කතා කරනවා...."

මම ආපිට හැරුණෙමි. කවින්ද කීවාක් මෙන් අම්මා දකිද්දී දුවගේ හදවත උණු වූයේ නැත. අසනී මහ හයියෙන් කෑ ගැසූ හඩ කවින්දට නැසුණා යයි විශ්වාස කරන්නට පුළුවන්කමක් නැත. මම ආපසු පැමිණ කාරයට නැංගෙමි.

"ඔයාට ප්‍රෙෂර් එක තියෙනවා නේද උදානි. මේ වාගේ දෙවල්වලට ඔයා මූණ දෙන්න හොඳ නෑ....."

"ඔයාටත් ඇහෙන්න ඇති... දුව අම්මගෙ කැරක්ටර් සෙටිෆිකෙට් දුන්න හැටි....."

"මට ඇහුණා... මට හිතාගන්න බෑ උදානි... ඔයාගෙ දුව ගැන මට හිතාගන්න බෑ....."

කවින්ද මඳ දුරක් ධාවනය කරගෙන අවුත් කාරය අයිනකට වෙන්නට නැවත්වූවේය. අනතුරුව කාරෙකේ වූ වතුර බෝතලයක් රැගෙන බීගෙන බීගෙන ගියේය.

"මාත් ඔයාට කරදර කළා.... අසනි බලන්න එක්ක යන්න කියලා...."

"ඔයාගෙ වදේටම තමා උදානි මං කියන්නෙ. කංචනට

ඩිවෝස් එක දෙන්න. ඔයා ඔයාට කිසිම දෙයක් නොදන් මිනිහෙකුගෙන් මොනවද බාලාපොරොත්තු වෙන්නෙ.... මං කියනෙක තේරුම් ගන්න. ඔයාගෙ ගෞරවයට වඩා මම හිතන්නෙ ඔයාගෙ අසරණකම......"

"බෑ... කවින්ද බෑ... මං කංචනට ආදරේ කලා... අපි ටික කලක් හොඳින් හිටියා...."

"නෑ... මං ඒක පිළිගන්නෙ නෑ."

"කංචන කවදා හරි වැරදි හදාගෙන මනුස්සයෙක් වෙයි කියලා මං බලාගෙන ඉන්නවා... තමන්ගෙ කුසින් බිහි කරපු දරුවෙකුට වෛර කරන්න බේරගන්න මට බෑ... අසනීත් දවසක තේරුම් ගනියි....."

මට අඬන්නට උවමනා වී තිබුණි. එහෙත් හඬාවැටෙන්නට මටම හිමි වූ උරහිසක් මේ ලෝකයේ නැත.

"ඩිවෝස් එකේදී ඔයා අසරණ වෙයි කියලා ඔයා හිතනවා... ඔයාට පවුලෙ නම්බුව රැක ගන්නත් ඕන. ඒත් ඒ සේරම හින්දා ඔයා ඔයාගෙ ජීවිතෙත් වන්දි ගෙවනවා....."

කවින්ද එසේ කියූවත් දික්කසාදයේ දී මා කෙතරම් අසරණ වේවිද? මා කොතේ යන්නටද? මට සියල්ල නැතිවී ගියේ මේ පවුල් ජීවිතය නිසාය.

ඔහුට දික්කසාදය දී මට සිදුවන්නේ නිවස තුලම බෙල්ලේ වැල දාගෙන මියදෙන්නද?

මට තව ඉතිරිව ඇත්තේ මරණය පමණි.

"මං ඔයාව ගෙදරින් බස්සන්න ද?"

"එපා කවින්ද... මං ලොකු අම්මා බලන්න යන්න ඕන... මං මෙච්චර අසරණ වෙලා ඉන්නෙ මගේ දෙමව්පියො නැති





හින්දා... මට දැන් ඉන්නෙ ලොකු අම්මා විතරයි..."

"ලොකු අම්ම කොහෙද ඉන්නෙ."

"මේ දවස්වල කිරිබත්ගොඩ..... පොඩි අක්කිගෙ ගෙදර...."

"මං එහෙනං ඔයාව බස්සගෙන යන්නං. ආයෙ අපි හමුවෙන එකක් නෑ. මම හෙට ආපහු යනවා....."

මගේ හදට සියුම් දුකක් නොදැනුනා නොවේ. හදිසියේ අහම්බෙන් මුණ ගැසුණත් මේ දින කිහිපයේ ඔහුගේ ඇසුර... මට ජීවිතය ගැන අළුතින් යමක් හිතන්නට වාරු දුන්නේය.

"හදිස්සියෙම."

"මම නිවාඩුවකට ආවා නෙමේනේ. මට යන්න තිබ්බෙ පෙරේදා ඒක ටිකක් පනුවුණා...."

"එතකොට ආයෙ එන්නෙ...?"

"අම්මාත් නැතිවුණා... අයිය ඉන්නෙත් ස්විට්සර්ලන්ඩ්වල.. මට ඉතින් මෙහෙ කවුරුවත් නෑ......"

මම නිහඬවීමි. මා මොනවා කියන්නද? නමුදු මොකක් දෝ දුකක් මගෙ හිතේ නලියයි. පුතුන් දෙදෙනාද උපේක්ෂා ළඟ තියා කවින්ද එහේ ගත කරනුයේද තනි ජීවිතයක් විය හැක. ඔහු වෙනත් සම්බන්ධතාවයක වෙලුණ බව මට සිතේ ඔහුමය. එසේ නම් කවුරු වුණත් ඔහුගේ ඒ සිත්ගත් කාන්තාව සමඟ ඔහු අලුතින් ජීවිතයක් පටන් ගනු ඇත.

ඔහු මාව කිරිබත්ගොඩ නිවෙස ළඟින් බැස්සෙව්වේය.

"මම යන්නම් එහෙනම්...."

"බුදු සරණයි ඔයාට....."

මම කිව්වෙමි. මට එසේ කියැවිනි. කාලයක් තිස්සේ... මෙ අද ඊයේ වෙන තුරුම මා ඔහුට වෛර කලෙමි. ඔහු මට දුන් නරක නාමය නිසා මට අත්වූයේ යහපත් ඉරණමක් නොවේ. එහෙත් මගේ වෛරය දියේ ඇඳි ඉරක්සේම නැතිව ගිය හැටි මටම පුදුම සහගතය.

* * * * *

මම සතියක් පමණ ලොකු අම්මා සමඟ ගත කලෙමි. ඇත්තෙන්ම මට ඒ මානසික බන්ධනය අවශ්‍යව තිබිණි. මගේ කියා කියන්නට මට දැන් ඉන්නේ ලොකු අම්මා පමණි.

"මාත් කියන්නේ උදානි... ඔය මිනිහා පස්සෙ එල්ලීගෙන ඉන්න එකේ තේරුමක් නෑ කියලා.... අසනිත් ඔච්චරටම හිතුවක්කාර වුණා එහෙනම්...."

ලොකු අම්මා කතා කලේ වේදනාවෙනි.

"ඊට පස්සෙ දේපල බෙදන්නත් නඩු කියන්න වෙයි.. කෝ ලොකු අම්මෙ ඕවට සල්ලි......."

ඇය මා දෙස බලා සිටියේ අනුකම්පාවෙනි.

"අන්තිමට ඔයත් ලෙඩවෙන එකයි වෙන්නෙ ඔය දේවල්වලින්."

"මගෙ රස්සාවත් නැති කරගත්ත, සල්ලිත් ලක්ෂ දාහතරක්.. රත්තරන් බඩු බැංකුවේ... අනේ අපේ අම්මා තාත්තගෙ පැන්ෂන් එක එකතු කරලා හදා දුන්න රත්තරන් බඩු......"

මා එසේ කීවා මිස දුක් වුයේ නැත. දුන් දුක්වන්නට දෙයක් ඉතුරුව ඇත්තේද නැත. සැමියාත් දරුවාත් දෙදෙනාම අහිමි වූ විට ගැහැනියකට තවත් නැති වෙන්නට දෙයක් නැත.

"නඩුව දිගටම ඇදෙනවා.. දුන් අවුරුදු කීයක්ද?"





"අන්තිමට මං අසරණ වෙනවා. ලොකු අම්මේ. මට පාරට බහින්න වෙනවා. එහෙමනම් මං මොකක් හරි රස්සාවක් හොයාගෙන තනියම ජීවත්වෙන්න පටන් ගන්න ඕන..."

"ඒත් උඹ වාගෙ ගැනියෙක් කොහොමද උදානි තනියම ජීවත් වෙන්නෙ......?"

ලොකු අම්මා කතා කරන්නේ ඇත්තය. අනේ මගේ දුක දුක නව තවත් විඳින්නට නොඉඳ මගෙ අම්මා ඇස් දෙක පියාගත් එක කොපමණ හොඳදැයි මට සිතේ.

සතියක් පමණ ගත වෙද්දී මට ගීතිකා කතා කලාය.

"උදානි... කොහෙද?"

"මම නාම ලොකු අම්මලගෙ ගෙදර ඉන්නෙ ගීතිකා..."

"ඇයි ඔයා වෙඩින් එකට ආව නැත්තෙ...?"

"මොන වෙඩින් එකටද....?"

ගීතිකා තත්පර කිපයක් නිහඬව සිටියාය. ඇය කුමක්දෝ කතා කරන්නට ගොස් නතර වූවා සේ මට දැණුනි.

"ගීතිකා... කියන්න... කාගෙ වෙඩින් එකද...."

"අසනිගෙ වෙඩින් එක... ඊයෙ තිබුණා වැල්ලවත්තෙ 'සෆායා' එකේදී....."

"අසනිගෙ වෙඩින් එක... මං දන්නෙ නෑ....."

මගේ උගුර හිර වුණි..... මට කතා කරගන්නට පවා නොහැකි විය.

"අනේ ගීෂානිට වෙඩින් එක කියලා තිබුණා. හස්බන්ඩ් හිටියෙ නැති හින්ද මම ගියා. දුව පිකප් කරන්න....."

මාව වෙව්ලන වග මට දැණිනි. එසේ නම් දියණියගේ විවාහයත් බොහෝ ඉහළින් සමරා ඇත.

"මම දන්නෙ නෑ අසනි මං ළඟ නෑ."

එසේ කියූ මම දුරකථන ඇමතුම විසන්ධි කලෙමි. මට මාවම පාලනය කර ගත නොහැකි වේදනාවක් දැණුනි. කිරිබත්ගොඩින් ත්‍රීවිලරයක් ගත් මම වහාම නිවසට ආවෙමි.

මගෙ හිතේ ඇති වූ කෙන්තිය කෙබඳුද කියනවා නම් එක්කෝ මා සියදිවි නසාගත යුතුය. නොඑසේ නම් කංචනව පරලෝකෙට යැවිය යුතුය. ඒ දෙකම නොකර මා මගේ කේන්තිය යන්නට බිත්තියේ ගසා ඇති දුවගේ අවුරුද්දේ උපන්දින උත්සවයේදී ගත් ඡායාරූපය අල්ලා පොළොවේ ගැසුවෙමි.

"අන්තිමට මට මෙච්චරද ඉතුරු වුණේ අසනි... උඹට අම්මව එපාම වුණා... එහෙනම්. දුවෙක් හදද්දී අම්මා කෙනෙකුට මොනතරම් බලාපොරොත්තු තියෙනවද උඹ හිතුවද උඹ වෙනුවෙන් එකතු කරපු හීන කන්දෙ උඹ මඟුල් සාරියක් ඇඳලා ලස්සනට පිටවෙලා යනවා දකින්න මේ අම්මට ආසාවක් තිබ්බෙ නෑ කියලා... තිබුණා... අසනි තිබුණා... මම ඒ හැම දෙයක්ම කරේ.. උඹ ලස්සනට දීගෙක යනවා බලන්න... මේ අම්මට ඒකට පිං නැතිව ගියා....."

මම ඇගේ සියලුම දේ පොළොවේ ගසමින් විනාශ කරමින් ගිනිබත් කලෙමි. මගේ හදවත දවන්නා වූ වේදනාව කෙදිනක මා වෙතින් තුරන්ව යා දැයි මට නිශ්චය කරන්නට නොහැකිය. මා මේ සියල්ලම දරාගෙන උන්නේ කන්දක් සේමය. එහෙත් කන්දක් පුපුරා යන්නේ දරන්නට බැරිම තැනයි.





# දොළොස්වැනි ගිනිදළුව

ප්‍ර: මොන දොස්තර ළඟටද ගියේ ?

උ: වෛද්‍ය තිස්ස මෙන්ඩිස් ළඟට ගියේ. මහත්තයා අරක්කු බීලා ආවේ දුවගෙ වෙඩින් එකේදී... එදා රෑ එකට විතර වගේ...මට ඇහුනා දොර ඇරගෙන එනවා.

ප්‍ර: ඊට පස්සෙ

උ: පහුවදා උදේ මාත් එක්ක හිනාවෙනවා. කතා කරනවා.. ටිකක් අමුතුයි වාගෙ... හවස් වෙද්දී ඒ අමුතු ගතිය වැඩි වුණා.....

ප්‍ර: එතකොට ඔහුව ඒ වෛද්‍යවරයා ළඟට රැගෙන ගියාද?

උ: එහෙමයි ස්වාමීනි... වෛද්‍ය තිස්ස මෙන්ඩින් ළඟට රැගෙන ගියා.

ප්‍ර: ඒ ගියාම මොනවද වුණේ...?

උ: දොස්තර මහත්තයට මම කීවා මෙයා මත්පැන් පානය කරලා හිටියෙ කියලා... දොස්තර එක පාරටම කිව්වා... ඇයි මිස්ටර් තැන්නෙකුඹුර... අරක්කුයි මගේ බෙහෙතුයි කලවම් වුණාම පිස්සු හැදෙනවනේ කියලා..... එවෙලෙම තට්ටමට ගහන්න ඉන්ජෙක්ෂන් එකක් දුන්න. ඒක ගහලා සතියක් එළියටවත් යන්න එපා කියලා... මට කිව්වා ඔයා මෙයාව බලාගන්න කියලා.

ප්‍ර: එතකොට ඔහු ඒ ප්‍රතිකාර දිගටම කලාද?

උ: ස්වාමිනි ඒ සතිය ඇතුලත මං කියන විදියට බෙහෙත් ගත්තත්.... දවස ගත කලේ මෙයාගෙ නංගිලගෙ ගෙදර. මාව මඟ ඇරලයි හිටියෙ......

## 12

කංචන නිවසට පැමිණියේ බීමතිනි. වෙලාව රාත්‍රී එක වැදුණත් ඒ වන විටත් මම නිදි වර්ජිතව උන්නෙමි. සතියක් පුරා මා උන්නේ කොහේදැයි ඔහු ඇසුවේ නැත. ටික මොහොතකින් ඔහු වමනය කරන ශබ්දය මට ඇසුණි.

මා පිබිදුණේ උදෑසන නවයට පමණය. ඊයෙත් කිසිම දෙයක් ආහාරයට නොගත් නිසා දැඩි කුසගින්නක් මට දැණුනි. මම තේ එකක් සාදාගෙන බොන ගමන්ම හාල් හුණ්ඩුවක් සෝදා රයිස් කුකරයේ තැබීමි. පොල් සම්බෝලයක් හදන්නට පොල් ගෙඩියක්ද බිද එය ගාන්නට වූවෙමි.

මාව පුදුම කරවමින් කංචන කුස්සිය ඇතුලට ආවේය.

"මට.... ත් හරි..... බඩගිනියි... අම්මි....."

මට පුදුම සිතුණි. ඔහු මට 'අම්මි' යයි කතා කලේ අසනි කුඩා කාලයේය. පෙරේදා අසනිගේ විවාහය සිදුකල නිසා ඔහුට දුක හිතෙන්නට ඇතැයි මට සිතුණි.





"බත් ටික ඉදෙනකං තේ ටිකක් දෙන්නද....?"

"හා... කෝ දුව.. ඉස්කෝලෙ ගියාද?"

"මොකක්....?"

ඔහුට තේ සාදන ගමන්ම මම ඔහු දෙස පුදුම වී බැලුවෙමි. මම වැරදි දෙයක් නොවේ නම් මගේ හිතේ තිබී මට ඇසුනාවත්ද? එහෙත් කාලයකින් පසු මා ළගට ඇවිත් 'බඩගිනියි' කියූ නිසා මගේ හිතේ යම් චිත්තප්‍රීතියක් ඇති වුණා යයි කීමෙන් තිවැරදිය.

"නාම ඉන්නේ වෙරිමතේද කොහෙද මේ තේ ඒක බිලා නාගෙන එන්න. පැය බාගෙකින් බත ඉදිලා තියෙයි."

මම කීමි. ඔහු ඉතා අහිංසක අන්දමින් තේ එක බී කෝප්පය මා අතට දුන්නේය. මගේ හිතේ වූ වේදනාව ටිකක් හෝ කංචනගේ හැසිරීමෙන් නැතිව ගියා යයි මට සිතුණි.

"කමක් නෑ කාලෙකින් හරි මගේ අතින් ඉදුණ බතක් එයා කනවනේ... මට අම්මි කියලත් කතා කරා අනේ දන්වත් අපිට අපිව තේරුම් අරගෙන ජීවත් වෙන්න ඇත්නම්..."

ඒ තත්පර කිහිපයකට මගේ සිතේ සිහින මාලිගාවක් ඉදිවිණි.

මම වහා බත සූදානම් කළෙමි. පරිප්පු ටිකක්ද කිරට හදා... වහාම කඩේ දුවගොස් කිලෝ කරවල සියයක් ගෙන ඇවිත් එයද තෙල් දැමීමි. උදෑසන ආහාර වේල ප්‍රමාද වී හෝ රසට ඔහුට පිළිගැන්වීම මගේ අරමුණ විය.

"නාම නානවද අනේ... ඉක්මනට එන්න. බත් ටික රස්නෙටම කන්න පුලුවන්...."

මම එසේ කියමින් කෑම මේසයේ ඉදගෙන ඔහු එනතුරු රැඳී සිටියෙමි. මගේ දිහා දෙවියන් බුදුන් බලා ඇත. මගේ දුක

මේ සොබාදහම තේරුම් ගෙන ඇත. මගේ සැමියාගේ හැම වරදකටම ඔහුට සමාව දී ඔහු සමගින් යහතින් ගත කිරීම මගේ පරම පවිත්‍ර චේතනාවයි.

මොනවා වුණත් කාලය ගෙවී යද්දී අසනි සිය සැමියාත්... චූටි පැටියෙකුත් වඩාගෙන මේ නිවසට ගොඩවනු ඇත.

"කංචන... මේ බත් තිවෙනවා..."

ඔහු නාගෙන කෑම මේසය වෙතට ආවේය. නාගෙන තග්න උඩුකය ඇතිව මා වෙතට පැමිණි සැමියාගේ අමුතුම කඩවසම් බවක් මට දිස්විය.

ඒත් සමඟම දොරට තට්ටු කරන ශබ්දයක් ඇසුණ නිසාවෙන් මම එළියට ආවෙමි. ගේට්ටුව අභියස පොලිස් නිලධාරින් දෙදෙනෙකු සිටගෙන සිටියහ.

"මිසිස් තැන්නෙකුඹුර....."

"ඔව්..."

"අපට කෝල් එකක් ආවා... ඔයා මේ ගෙදර ලෙඩෙක්ව හිර කරගෙන ඉන්නවා කියලා...."

"කවුද ලෙඩා....?"

"කංචන තැන්නෙකුඹුර......"

"එයා.... මේ නාලා උදේම කෑම කනවා. ඕනෙ නම් ගිහින් බලන්න... මට හිතාගන්න බැරි මේ ගෙදර සිද්ධ වෙන දේවල් බලල..... කවුරු කෝල්ස් දෙනවද කියල....."

පොලිස් නිලධාරින් සාලයට ගොඩ වූහ. සාලයට ගොඩ වූ විට කෑම කාමරයත් කුස්සියත් පෙනෙයි. කංචන කෑම කමින් සිටියේය.





"අර අල්ලපු ගෙදරින් වෙන්නෝන කෝල් එක ආවෙ... රුවන්තිගෙන්නේ.... මෙ එයාගෙ අයිය.... ඒ කියන්නෙ මගෙ මහත්තයා...."

"එයාව හොස්පිටල් ගෙනියන්න ඕන එයාට සනීප නෑ...."

ගේට්ටුව ළඟට ආ රුවන්ති කීවාය. ඔවුන් සැවොම එක්ව අසනිගේ මඟුල පිරිමැසුවේ සතුටින් විය හැකිය. එහිදී අරක්කු බීමෙන් කංචන තරමක් වෙනස් ගති පෙන්විය. ඔහෙම බෙහෙත් බොන අයෙකුට මත්පැන් අගුණය. රුවන්ති පැමිණියේ පොලිසිය පිටිපස්සෙනි.

"මං දන්නවා එයා බේත් ගන්න ඩොක්ටර්... මං ඩොක්ටර් ළඟට ගෙනියන්නං....."

පොලිස් නිලධාරින් දෙදෙනා රුවන්තිට අවවාද කළේ අනුන්ගේ පවුල් ප්‍රශ්න මළවට නොගන්නා ලෙසය.

පසුව මම ත්‍රීවිලරයක් ගෙන්වාගෙන කංචනව වෛද්‍යවරයා ළඟට රැගෙන ගියෙමි. දිගින් දිගටම වෛද්‍ය ප්‍රතිකාර ගන්නා ලෙස ඔහු කංචනට උපදෙස් දුන්නේය. එහෙත් මාසයක් ගතවුණත් කංචනට සුවපත් වූ බවක් පෙනෙන්නට තිබුණේ නැත. ඔහු මාත් සමඟ සමගියෙන් කතා බහ කළේ රෝගය වැඩිවීමෙන් බව මම අවබෝධ කර ගත්තෙමි.

මට දැඩි කලකිරීමක් දැණුනි. මා දුවනුයේ මිරිඟුවක් පසුපසය. ඊළඟ නඩු වාරයේදීත් සිදු වූයේ නඩුව කල්යාම පමණි.

නඩුව අහවර වී ඔහු ගෙදර පැමිණ ඔහුගේ ඇඳුම් ටික රැගෙන රුවන්තිගේ නිවසට ගියේය. මට පුදුමය. මගේ අසීන් සත්කාර ලබා තරමක් හෝ සුවපත් වූ පසුව ඔහුට යළිත් මා එපා වී තිබිණි. අත්අරින්නට දහස්වර හිතෙද්දීත් තදින් බදාගෙන සිටීමට කෙනෙකුට අප්‍රතිහත ධෛර්‍යයක් අවශ්‍ය වෙයි.... එහෙත් ඒ

ධෛර්යය දූන් මටද ඔරොත්තු දෙන්නේ නැති තරමය.

දූන් අසනි කොහේ කොහොම ඉන්නවාද කියන්නට මා දන්නේ නැත. කංචන පෙනෙන්නටද නැත.

"නෝනා... මහත්තයා ඉස්පිරිතාලෙ නවත්තලා... නෝනා දන්නෙ නැද්ද....?"

මම සීනි තේකොල ටිකක් ගන්නට කඩයට යද්දී මට හිතවත් ත්‍රීවිලර් රියදුරෙකු පැවසීය.

"කොහේ ඉස්පිරිතාලෙද....?"

"මගේ ආටා එකේම... ජෙනරල් එකට අරන් ගියේ... මහත්තයට අවුල් ගතියක් තියෙනවා නේද?"

මම ඔහුට පිළිතුරු නොදී ආපිට හැරුණෙමි. වෛද්‍ය තිස්ස මෙන්ඩිස් විසින් උපදෙස් දුන්නේ බෙහෙත් නිවැරදි ලෙසින් පාවිච්චි කරන්නටය. නොඑසේ නම් මේ රෝගය වැඩි විය හැකි බවය.

ගෙදරට ආ මම ඉක්මනින් ඇඳගෙන රෝහලට පිටත් වීමි. කංචන නවත්වා ඇත්තේ මානසික රෝගීන්ගේ කොටසේ විය යුතුය. මෙ සිදු වූ විපත කුමක්ද? දෙවියන් ඔහුට දඬුවම කළාද?

මා යනවිට දුටු දෙයින් මම සලිත වීමි. ඔහුගේ ඇඳ ළඟ ඔහුට කෑම කවමින් උන්නේ ලක්ශානිය. අසනිත් අසනිගේ සැමියාත් ඒ අසල වූහ. අයිතිය ඇත්තේ ලක්ශානිටද? මා ඔහුගේ කසාද බිරිඳ වීමෙන් ලැබුවේ මොනවාද?

මට දැඩි කළකිරීමක් දැනුනි. මම ආපිට හැරුණෙමි.

"උදානී... මාව අඳුරන්න පුළුවන්ද?"





මම ඒ හඬට හැරී බැලුවෙමි. හෙදියක මා අසල සිටියි. ඇගේ මුහුණ මට හොඳට හුරුය.

"මම චන්ද්‍රනී... මතකද අපි යශෝධරාවේ එකට හිටියෙ..."

"චන්ද්‍ර.. ඔයා හුඟක් වෙනස් වෙලා.. අනේ සොරි මට අඳුරගන්න බැරිව ගියාට.."

මට එකවරම අපේ පාසල් සමය සිහිවිය.

"ඔයා ආවෙ කංචනව බලන්නද? මට මතකයි ඉස්සර කංචන ඔයාට ට්‍රයි කරා... කවින්දත් ඔයාට ට්‍රයි කරානේ... ඔයාට 'ක' යන්න නම් හරි අපලයි..."

චන්ද්‍රනී සිනාසෙන්නට වෑයම් කළාය.

"ඔයා මේ වාට්ටුවෙද....?"

"ඔව්...."

"ටිකක් කතා කරන්න අපිට වෙලාව තියෙයිද?"

"එනකොට ලෙඩ්ඩු බලන වෙලාව නම් ඉවර වෙයි. ඔයාට ඕන කංචනගේ වයිෆ්ට හොරෙන් එයාව බලන්නද?"

මම ගල් ගැසී ගියෙමි. මොවුන් හිතාගෙන සිටිනුයේ කංචනගේ බිරිඳ ලක්ශානි ලෙසින්ද? මම ඇයට විස්තරය කෙටියෙන් කීවෙමි.

"මේ දවස් ටිකේම කංචන බලන්න ආවේ ඔය ගෑනු කෙනා තමයි. කංචනට ටික දවසකින් සනීප වෙන්නත් පුළුවන්... ඒක අපට හරියටම කියන්න බෑ....."

මම දැඩි සේ අවුල් වූ මනසකින් රෝහලින් පිටව ආවෙමි. කංචනට වෙන් වූ වෙනමම ලෝකයක් තිබේ. මා මොන තරම්

කංචනට ළං වෙන්නට උත්සාහ කළත් අවසානයේ මට හිමි වන්නේ දුකක්ම බව මට දැණින. මගේ දුව වුවද මට අයිති නැති වස්තුවකි.

මගේ මුළු ජීවිත කාලයම මේ දෙදෙනා වෙනුවෙන් කැප කලත්... මට එක විනාඩියක් ජීවත්වෙන්නට ඔවුන්ගෙන් එබඳු බැල්මක් පවා ලැබී නැත.

"ඔස්ට්‍රේලියාවල එහෙම නම් ඩිවෝස් එක ඒ තරම් ලොකු දෙයක් නෙවේ... උපේබා වුණත් ඩිවෝස් එක එච්චර ලොකුවට ගණන් ගන්නෙ නෑ. උදානි ඔයා කරන්නෙ මෝඩකමක්. ඔයාගෙ කාලය නාස්ති කිරීමක්... ඔයා හරි සාම්ප්‍රදායික ගෑනියක්...."

මට කවින්ද කියූ දේවල් සිහිපත් විය.

මම නිවසට ඇවිත් කලේ දොර ජනෙල් වසා දමා... හයියෙන් හැඩීමයි. ඒ හැර වෙන කල යුතු දෙයක් මගේ කල්පනාවට ආවේ නැත.

මා රැකියාවක් කළ යුතුය යන අදහස මට ආවේ බෙල්ලන්විල පන්සලේ බෝධිය යටදීය. මේ විශ්වය මා සමඟ කතා කරන දේවල් මෙවැනි නිසසල තැනකදීය. මා දැන් තනිකමින්, විරහවින් හෙම්බත්ව සිටිමි. මේ තනිකම හුදෙකලාව මා කපා කොටා දමන ආයුධයක් වැනිය.....

මටත් සතුටින් ජීවත්වෙන්න තියේනම්.. ආයෙමත් රාජගිරියේ මහ ගෙදර නිදහසේ ඉන්න ඇත්නම්. උපුල්ට පණ එනව නම්... එවැනි සිතුවිලි මගේ හිතේ දඟකල වාර ගණන අනන්තය.

තවත් මසකට පසුව මම යලිත් රෝහලට ගියෙමි. කංචන උන් ඇඳේ සිටියේ වෙන් රෝගියෙකි. මම චන්ද්‍රනී සොයා ගියෙමි.





"උදානි, කංචන ඩිස්චාර්ජ් කළා... සතියකට සැරයක් ක්ලිනික් එනවා... ඒ එන්නෙ අර ගැණු කෙනා එක්ක තමයි."

මම බර හුස්මක් හෙලුවෙමි.

එසේ නම් දැන් ඔහු ඉන්නේ ලක්ශානී සමඟ බව අනුමාන කළ හැකිය.

"මට දුකයි ඔයා ගැන...... ඔයා හුඟක් දුක් විදිනවා නේද.....?"

"මේක මගෙ දෛවය චන්ද්‍රනී...."

"දෛවය වෙනස් කරගන්න උදානි ඔයාට ඒක කරන්න පුළුවන්. එකම මිනිහෙක් මත්තෙ නැහෙන්න එපා... දෙන්න අතරේ ජීවිතේ ගණුදෙනු වෙන්න ඕන..... ආදරේ ගණුදෙනු වෙන්න ඕන..... එහෙම නැත්තං අනාගත බලාපොරොත්තුවක් තියෙන්න ඕන... ඒ මුකුත් නැතිව... ඔයා දුක් විදිනවා..."

චන්ද්‍රනී කී කතාව මගේ පපුවටම වැදිනි. මේ දෙයම ඉරෝමි විසින් ගීතිකා විසින් මට වරින් වර කියා ඇත. ලොකු අම්මා වුවද කීවේ මේ ටිකය.

ආදරය ගණුදෙනුවකි. එහෙත් මෙතුවක් කල් මා කර ඇත්තේ පරිත්‍යාගයකි.

ජීවිතය අන්ඇරී ඇත. මට සියල්ලම අහිමිව ගොසින් ඇත. තවත් මට ජීවත්වන්නට බලාපොරොත්තු නැත. මා නිවසට ආවේ... නිකම්ම නිකං හිස් ජීවිතයක් පරිද්දෙනි.

* * * * *

"ඉරෝමි මට ජොබ් එකක් හොයලා දෙන්න.. කොළඹින් නෙවේ ටිකක් ඈත පළාතකින්....මට මේ හැම දෙයක්ම ඈලා.... අළුතින් ජීවත් වෙන්න ඕන....."

මම ඉරෝමි අමතා කීමි.

"ගුඩ් අයිඩියා... වෙරි ගුඩ් අයිඩියා උඹේ වැඩේ කෙරුණා කියලා හිතා ගනින්.... මම දුරකින් ජොබ් එකක් හොයලා දෙන්නම්....."

ඇය සිනාසෙමින් කියද්දී මට යම් සහනයක් දැණුනි.

"එතකොට ඩිවෝස් එක...."

"මම එයාට ඩිවෝස් එක දෙන්න තීරණය කලා...."

"ඇත්තට... පරණ ගොනා කාටද වික්කේ..?"

ඇය සිනාසුණත් මට සිනාසෙන්නට පුළුවන්කමක් නැත. නීතිඥවරිය සමඟ කතා කළ පරිදි මේ දේපල බෙදි යයි. එවිට මට අයිති වන කොටසින්... ඉතා කුඩාවට ගම්බද පැත්තකින් ඉන්නට තැනක් මිලට ගැනීමට හැකි වනු ඇත. මම ඒ වෙනස සිදුවෙන තුරු බලාගෙන සිටියෙමි. ඊළඟ නඩුවාරය එලඹෙන තුරු බලා සිටියෙමි. මේ සියල්ලෙන්ම නිදහස් වූ මට දැනෙන්නේ සහනයකි. තනිව ජීවිතයට මුහුණ දෙන්නට මම හිතා ගත්තෙමි. කංචන සමඟ ගෙවූ යුග ජීවිතයේ මා සෙවූ සතුට සැනසුම හමු වූයේ නැත.

"මම ටිකක් දුර පළාතකට යන්න කැමති නුවර, මාතලේ වගේ පැත්තකට."

මම එසේ කීවේ තවත් සතියකින් විතර ඉරෝමිට මගේ උවමනාව මතක් කරමිනි. පුවත්පත්වල තිබූ රැකියා රැසකටම ඉල්ලුම් කළෙමි.

"ඊටත් වැඩිය දුරින් ජොබ් එකක් තියෙනවා කැමතිද නැද්ද? කියල කියන්න විතරයි තියෙන්නෙ...."

ඉරෝමි පැවසුයේ සිනාසෙමිනි.





"මොකක්ද ජොබ් එක?"

"හවුස් වයිෆ්"

ඉරෝමි මාව විහිලුවකට ගෙන ඇත. මේ සිනාසෙන්නේ ඒ නිසාය.

"ඔයාට එකපාරටම දරන්න බරිවෙයි. නමුත් මට නම් ඒක එදාම තේරුණා ගොනා හැරෙන්නේ පොල් පැලේට කියලා."

"මොකක්ද....."

"කවින්ද මට කෝල් කලා කවින්ද කැමතියි එහෙත් ජොබ් එකක් හොයලා දෙන්න...."

"ඒ මං අමාරුවේ වැටෙන තවත් වලක්...."

"මීටත් වඩා වලක් තියෙනවද ඔයාට වැටෙන්න. කවින්ද මාත් එක්ක හුඟාක් දේවල් කිව්වා. එයා තව සතියකින් එනවා කිව්වා."

"මට පුළුවන්ද ඔස්ට්‍රේලියා යන්න...."

"ඇයි මෙහෙ දාලා යන්න බැරි දෙයක් එහෙම තියෙනවද?"

"නිකං යන්න බෑ.. විසා හදාගන්න ඕන ඒවට වත්කම් පෙන්නත් ඕන."

"ඒවා සේරම කවින්ද බලාගනී. කැමතිද නැද්ද කියන වචනෙ විතරයි ඕන... ඔයාට එයා කතා කරයි අද."

ඉරෝමි කීවාය. සමහර විටෙක දෛවය ඉතා පුදුමය. මම දැන් ජීවිතයේ මැදිවියට ආසන්න වෙමින් සිටිමි. මගේ වයස දැන් හතලිස්හයකි. මගේ ජීවිතයේ හොඳම කාලය කංචන වෙනුවෙන් ගෙවී ගියේය.

"මට ඒ තරමට කවින්ද විශ්වාස කරන්න පුළුවන්ද... මං වෙනුවෙන් හැම වගකීමක්ම භාර දෙන්න තරම්."

"ඒවා මං දන්නෙ නෑ. එයා ආවම කතා කරගන්නකෝ. එකක් මතක තියාගන්න මේක ලංකාව වුණාට ඒ ඔස්ට්‍රේලියාව ටිකක් මොඩර්න් විදිහට හිත්නන පුරුදු වෙන්න උදානි....."

ඉරෝෂී මට කීවේ අවවාදාත්මක ස්වරූපයෙනි.

❋ ❋ ❋ ❋ ❋

මම එදින රෑ සිහිනෙන් උපුල්ව දුටුවෙමි. උපුල් පාසල් නිල ඇඳුමෙන් සිය බයිසිකලය පැදයමින් සිටියේ මාද එහි වාඩිකරගෙනය. ඔහු කල කී දේවල් මගේ මතකයේ නැතත් ඔහු ඉතා සතුටින් සිටියේය. ඔහු හොඳ ආත්මයක් ලබා ඇතැයි මගේ හිත කීවේය.

කාලයකට පසු මම නිවසේ මකුළුදැල් කඩා අතු ගා පිරිසිදු කළෙමි. මා ඒ තරම් නිදහස් වූයේ කංචනගේ වෛවාහක ජීවිතයෙන් නීතියෙන්ම ඈත් වූ නිසාය. ඊයේ මා උසාවි භූමියෙන් ඉවතට ආයේ නිදහස් ගැහැනියක පරිද්දෙනි.

මම දහවලට බතක් ඉව්මි. සුදුබත් උයා පොළොස් මැල්ලුමක් සාදා පරිප්පු උයා... මාළු කරියක් හැදුවෙමි.

ඒ ඇයි කියා මට සිතා ගත නොහැකි විය. හැන්දෑවේ ව්‍යායාම පිණිස ටිකක් පයින් ඇවිදින්නට යා යුතුය යන අදහසක් විය.

ගේට්ටුව අභියස කාරයක් නවත්වන හඬ මට ඇසුණි. බොහෝ දුරට ඒ කංචන විය හැකිය. ඔහුගේ බඩුබාහිරාදිය ගෙන යාමට පැමිණෙන්නට ඇත. මේ ඉඩම් සහ ගෙය විකුණා මුදල් බෙදා ගැනීමට අප තීන්දු කරගෙන සිටියෙමු. අවසානයේ සිදු වූයේ ඔහුට අවශ්‍ය දෙයයි.





ඔහු දැනටමත් ජීවත්වන්නේ ලක්ශානි සමඟය මා පෙරමඟට ගොස් ගේට්ටුව හැරිය යුතු නොවේ.

ඊළඟට ඇසුණේ දොරට තට්ටු කරන හඬය. ඒ කංචන නොවේය. යන සිතුවිල්ල ඊළඟට මගේ සිතට හැඟිණි.

මම ගොස් දොර විවර කලෙමි. අතේ මල් පොකුරක්ද අතැතිව සිනාසෙමින් සිටියේ කවින්දය.

"කන්ගැජ්‍රලේෂන්ස්.... උදානි"

මගේ දෑසේ කඳුළු පිරුණි. මගේ විවාහ උත්සවය දිනයේ හැර මට මෙවැනි ලස්සන මල් පොකුරක් කංචනගෙන් ලැබී තිබුණේ නැත. ඇත්තම කියනවා නම් ඔහුගෙන් මට පොළින් යාර දෙකක තරමේ ත්‍යාගයක් ලැබී නැත.

කවින්දගේ දෙකම්මුල් මගේ දෙකම්මුලේ ගෑවෙන විට මට දැණුන හැඟීම කෙසේ විස්තර කරන්නද? අවුරුදු ගණනාවකින් මෙසේ මට පිරිමියෙකුගේ සුවඳවත් වැදී තිබුණේ නැත.

"තැන්ක්යූ... ඒත් මොනවටද මට සුබ පතන්නෙ.....?"

"ඔයාගෙ අළුත් ජීවිතේට......"

"මට ඔයා ගැන හිතාගන්න බෑ...."

"ලෝකෙ වෙනස් වෙනවා කියන්නෙ මිනිස්සු වෙනස් වෙනවා කියන එක. සිතුම් පැතුම් වෙනස් වෙනවා කියන එක... වැරදි හදා ගන්න කැමති මිනිහෙකුට සමාව දෙන එක දේව ගතියක්."

"ම්... මෙයා මොනවටද මන්දා එන්න හදන්නෙ... මං ඩිවෝස් වුණා නෙමේ ඩිවෝස් එක දුන්නා."

"හරි... ඊට පස්සෙ අළුත් ජීවිතයක්නෙ.... ඒ බව මට ඔයාගෙ

මූණෙන්ම පේනවා ඔහොම නාලා.... කොණ්ඩෙ කඩලා දාලා ඉන්නකොට... ඇත්තටම ඉස්සරට වැඩිය ඔයා ලස්සනයි."

මම මවිත වී ඔහු දෙස බලාගෙන උනිමි. ඕනෑම ගැහැනියක තමා 'ලස්සනයි' යන හැඟීමෙන් ආඩම්බර වෙයි. එහෙත් මා උන්නේ ජීවිතයේ බොහෝ ආශාවන් අත් හැර දමාය. අළුත් ඇඳුමක් සෙරෙප්පු දෙකක් ඇන්ද දවසක් මතකයේ නැත. විවාහ ජීවිතයේ හිරවී ගෙවූ වසර විස්ස පුරාවටම මා කුමන ආත්මයකදී හෝ කළ බලවත් පාප කර්මයක් විපාක දුන්නා යයි මට සිතුණි.

"ඔයාට මං බොන්න දෙයක් ගේන්නං.... මහොම ඉඳගන්න...."

"බෑ... මට බඩගිනියි.... මං මගදි තේ එකක් බීලා ආවේ...."

මට පුදුම සිතුණි. හැමදාම බඩගින්න දරන්නට බැරිව මොනවා හෝ එක ව්‍යංජනයක් දෙකක් හදාගෙන කෑවා මිස මෙලෙසින් උයන්නට මට හිතී නැත.

"එහෙනම් එක පාරම කාලා ඉම්මු. මට විනාඩියක් දෙන්න... කෑම ටික මේසෙට අරින්න...."

මම වහාම කුස්සියට දුවගෙන ආවෙමි. කවින්ද මට මේ තරම් සමීප වෙනු ඇතැයි මට කෙදිනකවත් සිතී තිබුණේ නැත. ඇත්තෙන්ම ඇත්තේම ජීවිතය පුදුමාකාරය. එය කෙදිනකවත් කලින් සැකසූ න්‍යාය පත්‍රයක් අනුව වැඩ කරන්නේ නැත.

"නියම ශ්‍රී ලංකන් ඩයට් එකක්....."

ඔහු ඉතා ආසාවෙන් පොලොස් මැල්ලුම් බෙදා





ගත්තේය.

"අනේ... මේ දුප්පත් මගෙන් කෑම වේලක් කන එකත් කොච්චර දෙයක්ද?"

"මාත් එහෙදි කෑම හදාගන්නවා. ඒත් කිසිම රහක් නෑ. බඩගින්නට කනවා."

"ප්‍රශ්නයක් අහන්නද.....?"

"අහන්න...."

"ඔයා කිවා ඔයාගෙ වෙන එෆෙයාර් එකක් තිබුණා කියලා... එතකොට ඔයා ජීවත් වෙන්නේ එයා එක්ක නෙමෙයිද?"

"උදානි... ඒ හැම දේකටම උත්තර දෙන්නම්. ඔයා... මේ පාර ආවෙ ඔයාට වීසා ගන්න උදව් කරන්න. ඒ හින්ද... මම ඩිසයිඩ් කරා ඔයාට වත්කම් පෙන්නන්න... මගෙ ලංකාවේ තියෙන ගේයි ඉඩමයි ඔයාගෙ නමට ලියන්න...."

"කවින්ද...."

ඇත්තෙන්ම ඔහුව වැලඳ ගැනීමට තරම් මගේ හැඟීම් ප්‍රබල විය.

"ඇයි මං වෙනුවෙන්.... එහෙම කරන්නෙ...."

"මට වෙන කවුරුවත් නෑ උදානි....."

"මට 'ක' යන්න අපලයි වාගෙ ඔයාටත් 'උ' යන්න අපලද මන්දා.....?"

මට නිකමට කියවිණි. කෑම කන ටිකටම ඔහුට දුරකථන ඇමතුම් කීපයක්ද පැමිණියේය.

"මං ඉක්මනට යන්න ඕන... වැඩ ටිකක් තියෙනවා

කරගන්න....."

එසේ කියමින් ඔහු කා අහවර වී යලිත් කාරයට ගමන් කර බෑගයක් රැගෙන ආවේය.

"මොනවද මේ...?"

"මං එහෙදි ඔයාට ගත්ත තෑගි ටිකක්... උපේඛා ඔයාට දෙන්න කියලා ලියුමක් දුන්නා... මම හෙට උදේ එනවා... ඔයා මේ ලියුම කියවලා... බලන්න....."

ඔහු පිටව ගිය පසු මට දැඩි පාලුවක් දැණින..... පලමුවෙන්ම මගේ කාමරයට පැමිණි මා ඔහු දුන් බෑගය දිග හලෙමි. එහි මගේ ගණනටම හරියන ඇඳුම් පැළඳුම් කිහිපයක්ද, සුවඳ විලවුන්, ක්‍රීම් ආදි දේවල්ද.. රත්තරන් පැහැති සාරියක්ද ඊටම ගැලපෙන සෙරප්පු දෙකක්ද විය.

නමුත් මා ඒ කිසිවකට අත නොතැබිමි. ජීවිතයේ කෙදිනකවත් නොලැබුණ වටිනා ඇඳුම් පැළඳුම් වුවද මට ඒවා අත පත ගාන්නට ආශාවක් උපන්නේ නැත.

අනතුරුව මම උපේඛාගේ ලියුම විවෘත කලෙමි.

මෙල්බර්න් හිදි

ආදරණීය උදානි,

ඇත්තටම ඔයා ගැන ආරංචියක් ලැබුණ එක හුඟාක්ම සතුටුයි. මාත් අවුරුදු දහයකින්වත් ලංකාවට ආවේ නෑ. ඒ නිසා.... ඔයාලා හැමෝම මගෙන් ඈත් වුණා කියලා හිතෙනවා.

ඔයා ඉන්න තත්ත්වෙ..... මූණ පාන්න සිදුවන හැමදෙයක්ම මට කවින්ද කිව්වා. මගෙයි කවින්දගෙයි විස්තරත් ඔයාට ආරංචිවෙලා ඇති.





මොනම හේතුවකින් හරි මාත් කවින්දට ණයක් ගෙවන්න තියෙන්න ඇති. ඒ නිසයි අපි විවාහෙන් බැඳුනේ. ඒත් දිගින් දිගටම අපි අතරේ නොගැලපීම් තිබුණා. ඒ අතරේ කවින්දගෙ ඔෆිස් එකේ හිටිය ඉන්දියන් ගර්ල් කෙනෙක් එක්ක එයාගෙ සම්බන්ධයක් තිබුණා. සමහරවිට මාත් එක්ක යුග ජීවිතේ හෙම්බත් වෙලා හිටිය එයාට ඒක හොඳ නවාතැනක් වෙන්න ඇති.

අපි කතාවෙලා ...... බොහොම සමගියෙන් වෙන් වුණා... පුතාලා දෙන්නා මම ළඟ. මම වෙනමම ජීවත් වෙනවා.

කවින්ද ඉස්කෝලෙ යන දවස්වල ඉඳලම ඔයාට ආදරේ කරා. පස්සේ මම කරපු වැඩේ නිසා එයා ඔයාට වෛර කරන්න පටන් ගත්තා. ඇත්තට කියනවානම් මාත් උපුල්ට ආදරේ කරා... මම කවින්ද තුළින් උපුල් කෙනෙක් හෙව්වා. කවින්ද මං තුළින් උදානි කෙනෙක් හෙව්වා. සිද්ධ වුණේ ඒකයි.

කවින්ද විශ්වාස කරාලු කවදා හරි එයාගෙ උදානිව එයාට ලැබෙයි කියලා. විශ්වාසෙට වැඩිය ඒක හීනයක් වගේලු. ඔය දෙන්නට එකතු වෙන්න කිසිම බාධාවක් තවත් ඉතුරු වෙලා ඇති කියලා මම හිත්නනේ නෑ.

ඉස්කෝලෙ යන කාලේ ඔයාට ආදරය කරපු මළගෙඩි ගොඩාක් අතරින් කංචන දිනුවත්... කංචනට ඒ වාසනාව උදා වුණේ නෑ... ඔයාගෙ ජීවිතේට විඳින්න සිද්ධ වුණ හුඟාක් නින්දා අපහාසවලට කවින්දත් වගකියනවා...... ඒ වැරැද්ද හදාගන්න කවින්දට ඉඩදෙන්න.

ඔය දෙන්නා එකතුවෙලා ඔස්ට්‍රේලියාවලට එනකං මං බලාගෙන ඉන්නවා.... මේ හැම දේටම උපුල් ඉන්න තැනකින් අපිට ආශිර්වාද කරයි.

ඔයාටත් කවින්දටත් මම සුබ පතනවා.

මිට,

උපේඛා.

මම දිගු හුස්මක් ගතිමි.

හමු වූ දින කිහිපයේ පවා මම කවින්දගේ ඇස් දෙස කෙලින් බලන්නට බිය වුවෙමි. මේ ලියුම මට එවන්නට පෙර ඉරෝමි මේ හැම දෙයක්ම දන සිටින්නට ඇතැයි මට සිතුණි.

රාත්‍රියේ මට එක මොහොතක් හෝ නින්ද ගියේ නැත. සෑම ගිම්හානයකට පසුව නැවත වසන්තයක් උදාවෙන බව මම දනිමි.

"මගෙ දුවත් කසාද බැඳල ඉද්දි මම ආයෙම විවාහ වෙන එක සාදාචාර සම්පන්නද?"

මම හිතට වද දෙමින් විමසුවෙමි.

"මේ ලංකාව වුණාට ඒ ඔස්ට්‍රේලියාව. ටිකක් මොඩර්න් විදිහට හිතන්න උදානි."

මට ඉරෝමිගේ වදන් ඇහෙන්නට විය.

සම්ප්‍රදාය, පුහු ගෞරවය හිස මත්තේ තබාගෙන ජීවත්වීමෙන් සිද්ධ වූයේ හිතේ සතුට විනාශ වී යාමයි. ඒනිසා මෙතැන් පටන්ම අළුත් විදියට හැඩ ගැසෙන්නටත් මම හිතාගත්තෙමි. පාන්දර හතරේ කණිසම වැදෙන තුරුත් මා සිටියේ අවදියෙනි.

නින්ද නොයන නිසාම මම කාමරයෙන් එළියට අවුත්, කෝපි කෝප්පයක් සාදා ගතිමි. මගේ ජීවිතයේ හතරවන දශකය තුළ සිද්ධවන්නට යන මේ විපර්යාසය දරාගන්නට මා හැඩගැසිය යුතුය.

* * * * *

මම කිරිබතක් ඉව්වීමි. කටදන්නට හොඳ කට්ටසම්බෝලයක්ද





සෑදුවෙමි. කිරි ආහාරය රැගෙන බෙල්ලන්විල පන්සලට යා යුතු යයි සිතුවා පමණය.

හුරු පුරුදු දොර තට්ටුව ඇසිණි. දෙවරක් නොසිතාම මම ගොස් දොර ඇරියෙමි.

"උදේම? ඊයෙ නින්ද ගියේ නැද්ද.....?"

මම විමසුවෙමි. කවින්ද ඇඳ සිටි සුදු පැහැති අත්කොට කමිසයත් ඩෙනිම් කලිසමත් ඔහුට නැවුම් පෙනුමක් ගෙන දුන්නේය. ඇත්තෙන්ම මට ඒ රුවට මහත් තණ්හාවක් ඇතිවුණා යයි කිවොත් බොරු නොවේ.

"ලියුම බැලුවද?"

"ලියුම බැලුවා....."

"මම හිතුව නොබලම මට රිටර්න් කරයි කියලා...."

"ඒ ඉස්සරනේ...."

"ඒ කියන්නෙ දැන්....?"

මම ඔහුගේ දෙනෙත් මගහැර බිම බලා ගත්තෙමි.

"මේ හැමදේටම උපුල් අපිට ඉන්න තැනකින් ආශිර්වාද කරයි."

මට උපේඛා ලියා තිබුණ දෙය සිහිපත් විය. කවින්ද ඔහුගේ අත් දෙක මගේ උරහිස මත තැබුවේය.

"උදානී.... මට ඔයාව මඟ ඇරුණා.... මාත් එක්ක එකතුවෙලා අපි ජීවිතේ ඉතුරු කාලෙ ලස්සනට ගත කරමු....."

"ඔව් කවින්ද... මාත් ඒ ගැන හිතුවා...."

"එහෙනම් අපිට මැරි කරල ඔස්ට්‍රේලියා යන්න පුළුවන්....."

"මේක මට අදහාගන්න බැරි හීනයක්....."

මම ඒ දැතට වාරුවෙමින් මගේ හිස ඔහුගේ පපුව මත තබාගත්තෙමි.

මෙවැනි ආදරණීය සෙනෙහසක් ලැබේ නම්.... ඒ සෙනෙහසේ නාමයෙන් අප දෙදෙනාට ජීවිතයේ ඉතිරිය ලස්සනට ගෙවා දමන්නට හැකි බව මට විශ්වාසය.

නිමි

THARANGA DISSANAYAKE

Ginidalu se ma

# ගිනිදළු සේ මා

තරංගා දිසානායක



**ප්‍ර:** තමුන් ස්වාමිපුරුෂයා සමග සමගියෙන් ජීවත් වුණා කියලා කියන්න සාක්ෂියක් නැහැ කියලා මම තමුන්ට යෝජනා කරනවා.

**උ:** අසත්‍යක් ස්වාමීනි.

**ප්‍ර:** ඒ නිසා තමුන්ට අවසාන ව[illegible]න් යොජනා කරනවා මේ පැමිණිල[illegible]ක්, තමුන්ගේ කෲර සහ අවමන් ස[illegible] සැලකිලි නිසා... වෙනමම වාසය කිරීමේ [illegible]ව මත ද්වේශ සහගත ලෙස ඔහු හැර [illegible] ඇති බවට මම යෝජනා කරනවා.

**උ:** නැත ස්වාමීනි. ඊයේ උදෙත් [illegible] මට සීනි තේ කොළ ගෙනල්ලා දීලා තේ බ[illegible] යන්න කිවුවා. එහෙම ප්‍රශ්නයක් අපේ ගෙදර නෑ.

**ප්‍ර:** ස්වාමීනි... මේ අධිකරණයෙන් තමන්ට වාසියක් ගන්න මේ තැනැත්තිය ගරු අධිකරණයට නිර්මාණාත්මකව බොරු කියනවා කියා මම යෝජනා කරනවා.

**උ:** ස්වාමීනි අඩි හයකින් වට වූ තාප්පයක් තියෙන ගෙදරක මමයි මහත්තයයි විතරයි ඉන්නෙ අපේ ගෙදර කුස්සියේවත් ඇඳ යටවත් කොතනවත් නීතිඥ මහත්තයා ඉන්නවා මම දැක්කෙ නෑ. නීතිඥ මහත්තයා කොහොද දන්නෙ අපේ ගෙදර වෙන දේවල්...?

ISBN 978 955 7829 23 4

තාරා ප්‍රකාශන
250/A/6, පින්කොවත්ත,
පොල්ගහහේන,රාගම.
071 4244873

Rs: 460/=